**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය අවදි විය

(නමවන වෙළුම)

# ලොවම දෙදරයි

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.


## ලොවම දෙදරයි

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com

zoom දේශනාව youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@Zoom-up2ik

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

රාත්‍රී සාකච්ඡා zoom ශ්‍රවණය කිරීමට
https://us06web.zoom.us/j/87341245000?pwd=dFFrSSt4SVBQWFpzeXppUy-tIZFZWUT09

youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@buddothpado

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothp?mibextid=ZbWKwL


බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම්
Email: thanujafernando1975@gmail.com
Tel 070 351 8747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම
**වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය
**K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2884701

# නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිළිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ )
   සත්‍යඥාණ අවබෝධය

2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)
   **2.1** කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම
   **2.2** කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කළ්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී

බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥාණය)

- සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
- සිත මායාවක් බව අවබෝධකරගැනීම
- සිත යනු අරමුණම බව දැනගැනීම
- අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
- ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම
- අරමුණම ආත්මය බව දැකීම
- ශූන්‍යතා අවබෝධය
- ත්‍රිවිද්‍ය දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍ෂය ඥාණය)
  (සිත = අරමුණ = ආත්මය)

**1.1** කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසා දැන ගැනීම
**1.2** නැවත නැවත සද්ධර්මශ්‍රවනය
**1.3** යෝනිසෝමනසිකාරය
**1.4** ධම්මානුධම්ම ප්‍රතිපදාව

ශ්‍රාවකයා උත්ථාන වීරියෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.

බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල්කැටයක පමණ දෙයකි

සක්කාය දිට්ඨි ප්‍රහාණය මෙතැනදී සිදුවේ.

ශ්‍රාවකයා ආර්ය භූමියට පිවිසේ.

## 2. අපරභාග ප්‍රතිපදාව

### 2.1. <u>**කෘත්‍යඤාණය**</u> - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

***2.1.1***. අරමුණෙහි සත්‍ය දැකීම; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම (යථාභූත ඤාණය = යෝනිසෝ මනසිකාරය)

***2.1.2***. අරමුණෙහි සත්‍ය දැක මිදීම

- අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
- ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
- සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

***2.1.3***. ත්‍රි විද්‍ය ප්‍රායෝගිකව අත්දැකීම (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතුපපාත ඤාණය, ආසවක්‍ෂය ඤාණය)

### 2.2. <u>**කෘතඤාණය**</u> (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඤාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශූන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන

චෙතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්පනිහිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



පැහැදිලි ජලය ඇති
නොකැළඹුණු ගැඹුරු විල
යම් සේද, සද්ධර්මය අසා
පැහැදුණු සෘතවත් ආර්යය
ශ්‍රාවකයා ද එසේ ය.
මේ කය අසාර වු පෙණපිඬක්
බඳු බව දැන, සිත මායාවක්
බව මනාව අවබෝධ
කොටගෙන, ඉමක් නැති
සසරේ ඉමක් ඇති බව
ප්‍රත්‍යක්‍ෂකොට, නිස්සරණ
මඟ ඇවිද යන්නට මේ
සත්‍ය ධර්මය අමාදම්
ගඟුලක් වේවා !
සියලු ලෝ සතහට.

# පටුන


01 අවිද්‍යා ලොවම දෙදරවමින් පැතිරුණ
සත්‍යයේ මහා දෝංකාරය 11 - 66

02. ඉපදීමක් මරණයක් නැති ලොවකට
පියමැන යන්නට, මංපෙත් විවර විය 67 - 111

# 01

# අවිද්‍යා ලොවම දෙදරවමින් පැතිරුණ සත්‍යයේ මහා දෝංකාරය

**ආර්යයන් වහන්සේ :** තෙරුවන් සරණයි

**උපාසිකාව :** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. මට තාම තේරෙන්නෙ නැත්තෙ, මගේ දැන් ඔලුවෙ කතාවක් තියෙනවනේ, පරණ සිතිවිලි ඒව මේව එනවනේ. සිතුවිලි දෙකක් අතර හිඩස තමයි, අර ඒකනෙ හොයාගන්න කියලා කියන්නේ.

**ආර්යයන් වහන්සේ :** මොකක්ද ඒ කියන්නේ?

**උපාසිකාව :** ආර්යයන් වහන්ස, මට දැන් එක සිතුවිල්ලක් සහ තව සිතුවිල්ලක් අතර කාලය, අර අපේ පොඩි නිදහසක් තියෙනවා නේ. නමුත් මම මොකක් හරි වැඩක් කරනකොට ක්‍රියාවලියට හිත යොමු වෙනවට වඩා මගේ ඔළුවේ අර පරණ කතන්දර මොනව හරි එන එක ඒවා නැති කරගන්න. ඒවා අඩු කර ගන්න.

**ආර්යයන් වහන්සේ** : ඒ වගේම ඔබතුමිය අහනවා තව ප්‍රශ්නයක්. දැන් මුල් ප්‍රශ්නය බලමුකෝ. හිත් දෙකක් අතර තියෙන හිඩස දැන් මොකක්ද ඒකෙ තියෙන ප්‍රශ්නේ...? සිත් දෙකක් අතර හිඩස.

**උපාසිකාව :** ප්‍රශ්නයක් නෙවෙයි. දැන් අපි සිතුවිල්ලක් නැතුව. ක්‍රියාවලියටම හිත යොමන කොට හරි සැනසිල්ලයි. ඒ වැඩේ හරියට හොඳට කරන්න පුළුවන්. නමුත් මොකක් හරි වැඩක් කරන වෙලාවේ ඔලුවේ කතාවක් දුවනකොට, ඒක චිත්‍රපටියක් වෙනව.

**ආර්යයන් වහන්සේ :** හැබැයි ඔය කියන එක එකකට එකක් ගැලපෙන්නේ නැහැ ඒ කියන්නේ දැන් ඔය සිතුවිලි කියන එක ගලපලා දෙන්න.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස, දැන් මම මොකක් හරි වැඩකට හිත යොමු කරන කොට, ඒකෙ ක්‍රියාවලියට හිත යොමු කරගෙන යනකොට එකපාරම හිත කැඩෙනවා, මොකක්හරි සිතුවිල්ලක් ඇවිත් ආයෙත් මම ඒ හිත දිගේ යන්නෑ, ආපසු වැඩයට සිත යනවා. දැන් මම හිතේ මේ ක්‍රියාවලියට එන සිතුවිලි ප්‍රමාණය අඩුකරගන්න ක්‍රමයක් පළවෙනි එක එතකොට මට හිතුනා, ඒ හිතට එන ක්‍රියාවලි දෙකක් අතර පරාසය දුරු කළා කියන්නේ මම අර කරන වැඩේට ගොඩක් හිත යොමු කරලා එතකොට වැඩේ හරි යනවා. නමුත් ඒ වැඩේ තවම කරගන්න බැරි කමක් තියෙනවා.

**ආර්යයන් වහන්සේ :** ඔව්. ඒකට හේතුව තමයි ඔය කියන එකක්වත් කරන්න බැරිකම. ඒකත් ඔබතුමිය හිතන්නේ ඔය මනසින්මයි. එතකොට ඒකත් ගන්නේ වැරදියට. මේ කියන අදහස ඉතාම ගැඹුරුයි. ඒ කියන්නේ මෙහෙමයි. දැන් ඔබතුමිය ඔය සිත් දෙකක් අතර පරතරය වැඩි කරනවා කියන එක. ප්‍රශ්නේ දැන් පැහැදිලියි. ඔබතුමිය වැඩක් කරනකොට එක එක ඒවා මතක් වෙනවා. එතකොට සිත විසිරෙනවා. වැඩේ හරියට කරගන්න බැහැ. අනිත් එක තමයි ඔබතුමියට දැනෙනවා මේ සිතුවිලි අඩු නම් හරි පහසුයි කියලා, ඔබතුමියට දැනෙනවා සිතුවිලි අඩු නම් බොහොම සැහැල්ලුවක් දැනෙනවා කියලා ඔබතුමියට හිතෙනවා.

**උපාසිකාව :** එහෙමයි දැනෙනවා.

**ආර්යයන් වහන්සේ :** දැන් ඔබතුමිය මෙන්න මේක හොදට දැනගන්න ඕන. දැන් දෙන මේ ධර්මය පැහැදිලි කරන කාරණාව ඉතාම වැදගත්. ඒ කියන්නේ මෙන්න මේකයි. මෙතන තියෙන පලවෙනි දේ තමයි අවිද්‍යාව. නොදන්නකම. ඒ නිසා තමයි ඔය විදිහට හිතන්නේ. ඔය විදියට ප්‍රශ්නෙකුත් හිතන්නේ. ඔය විදියට විසඳුමකුත් හිතෙන්නේ.

**උපාසිකාව :** එහෙමයි

**ආර්යයන් වහන්සේ** : දැන් ප්‍රශ්නයක් තියෙනවා. මම දැන් වැඩ කරනකොට සිතුවිලි තියෙනවයි කියලා. ප්‍රශ්නෙකුත් හිතෙනව ඒ වගේම

විසඳුමකුත් හිතනවා ආ මේ සිතුවිලි දෙකක් අතර හිඩැසක් තියෙනවනේ ඒක තමයි මේ එන්නේ එහෙම වුනොත් මට පහසුයි කියලා. ඒ දෙකම මිථ්‍යා දෘෂ්ටියක්. ඒක වැරදියි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒකට හේතුව මෙන්න මේකයි. අපි දැන් පොතක කියෙව්වොත් කියවන්නේ න්‍යායක්. අපි පොතකින් ගන්නේ දැනුමක්.

**උපාසිකාව :** ඒක ඇඟට දැන්නේ නෑ. හිතට දැනෙනවා.

**ආර්යයන් වහන්සේ :** එක ප්‍රායෝගික නොවෙන්න පුළුවන්.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** දැන් ප්‍රායෝගිකව අපි ඇවිදිනව කියන එක පොතක ලියන්න පුළුවන්ද? පොතේ ලියන්න පුළුවන් ඇවිදිනව කියල. නමුත් ප්‍රායෝගිකව ඇවිදිනව කියල ලියන්න බැහැ. දැන් පොතේ ලියන්න පුළුවන් පේනව කියල. ඇසට පේනවා කියල අපිට ලියන්න පුළුවන්නෙ. ඇසට පේන එක හිතන්න ගත්තොත් ඒක වෙනමම එකක්. දකින එක වෙනමම එකක්. ඔන්න ඔය වගේ මේ පොතේ ලියන ඒවයි අපිට ප්‍රායෝගික එකයි සමාන නෑ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** මෙතන තියන්නෙ තනිකරම අවිද්‍යාව කියන එක. මුළු ධර්මයම තියෙන්නෙ අවිද්‍යාව මත පදනම් වෙලා. ඒ වගේම මේ පෘතග්ජන භූමිය, කාම භූමිය, සේරම අවිද්‍යාවම තමයි. ඒ නිසා අවිද්‍යාව ඇතුලෙ මේ ඔක්කොම කතාටික තියෙන්නෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** බුදුන් වහන්සේ ලෝකයට හෙළි කරන බුද්ධ දර්ශනයේ ගිලිහීම තමයි මේ සත්වයාගේ දුකට හේතුව. එක පැත්තකින් බැලුවොත් බුදුන් වහන්සේගේ දේශනා කරන්නේ ඇත්තටම කිව්වොත් සොබාදහමේ ම නියාය. සියලු බුදුවරු දේශනා කරන්නේ ඇත්තටම මේ අපිට සිදුවන දේ. කෙටියෙන් කියනවා නම් සියලු බුදුවරු ලෝකෙට හෙළි කරල තියෙන්නෙ මේ සත්ත්වයාට මොකද වෙන්නේ කියන එක.

සත්වයාගේ, පරම සත්‍යය. එතකොට මේ සත්‍යය නොදන්නකම තමයි අවිද්‍යාව. සත්‍යය නොදන්නකම. ඒක තමයි අන්ධයකු වගේ ඉපදිලා, අන්ධයෙක් වගේ ජීවත් වෙලා අන්ධයෙක් වගේ මැරිලා යනවා කියන්නේ ඕකමයි. එතකොට සතා සිව්පාවන් වගේම ඔහේ ඉපදෙනවා කනවා බොනව දරුවො හදනවා. සතාසීපාවා දන්නෙ නෑ, හදනවද දන්නෙත් නෑ, තව ඉන්නවද දන්නෙත් නෑ, මැරෙයිද දන්නෙත් නෑ. සතා සීපාවාට ඔහේ බාහිර වෙන දේ, ඔහේ දකිමින් මං මුලා වැල් පෑගිලා වගේ හරියට අපිත් නිකං හුළගේ පාවෙලා හමාගෙන යන කොළරොඩු කෑල්ලක් වගේ ගහගෙන යනවා. අපි දන්නෑ මොකද වෙන්නේ කියලා.

**උපාසිකාව :** එහෙමයි

**ආර්යයන් වහන්සේ :** ඉතිං අර හුළඟ දිහා බලාගෙන ඉන්නකොට ඔය ගහකින් වේලිච්ච කොළයක් ගිලිහිලා පාවෙලා හඹාගෙන යන්නා සේ, අපිත් ඔහේ සසර ගමනේ හඹාගෙන යනවා. අපි අන්තිමට මැරෙනවා කියලා හිතනවා. මැරෙනවා කියන එක, වෙනවමයි කියලා හිතනවා. ඉතින් ඉපදෙනවා.

**උපාසිකාව :** ඒක තමයි ආර්යයන් වහන්ස. මොකක්ද ඇතුලෙන් අපි මොකක් හරි වෙනවා කියන එක දැනෙනවා. දැන් ආර්යයන් වහන්සේගේ දේශනා අහල හරි මගට ඇවිත් කියලා තේරෙනවා. දැන් මට එළියෙන් තියෙනවා කියලා එකක් තාම දැනිලා නෑ

**ආර්යයන් වහන්සේ :** දැන් ඔය විඤ්ඤාණ මායාවෙන් මොකක් කියලා හිතුවත් විඤ්ඤාණය මායාවක් නේද ?

**උපාසිකාව :** ඔව්. හරි දැන් මට ඒක තේරෙනවා.

**ආර්යයන් වහන්සේ :** හීනයක් ඇතුලෙ දැන් කොච්චර හිටියත්, හීන ඇතුලේ අපි හිටියට අපිට තේරෙන්නෙ නැහැ නේද හීනේ ඇතුලේ ඉන්නවා කියලා. හීනේ ඇත්ත වගේනෙ. හීන ඇත්ත වගේනේ. හීන පේන වෙලාවකට පුදුමත් හිතෙනවා. බුදුඅම්මෝ කියලා කෑ ගහගෙන නැගිට්නවා. ගුටිකෑවා කියලා හිතාගෙන. දැන් ඇත්ත ලෝකෙත් අපි ඉන්නෙ හීනෙකනෙ.

**උපාසිකාව :** ඒක තමයි කියන්නේ.

**ආර්යයන් වහන්සේ :** හීනය ඇතුලේ අපි කොච්චර හිතුවත් ඒක හීනයක්නේ. මේ ඇත්ත ලෝකෙ අපි කොච්චර හිතුවත් හීනයක් නේ. එතකොට ඔය හීන විශ්වාස කරන්නේ කොහොමද? ඔය හිත හීනයක්නෙ දකින්නේ. ඔබතුමියගෙ තියෙන ලොකුම දුර්වලකම තමයි ඔබතුමිය හිත විශ්වාස කරනවා. අපි එහෙම කිව්වොත්, ඔබතුමිය මොකද කියන්නේ? ඔබතුමියගෙ හිත කියනවා, මේක මෙහෙමයි මෙහෙමයි කියලා කියනවා.

**උපාසිකාව :** මම ඒක විශ්වාස කරනවා ආර්යයන් වහන්ස. ඒ ගැන මම මොකුත් කියන්නේ නැහැ. මට තියෙන ලොකුම එක තමයි ආර්යයන් වහන්ස මට හැමදාම මේ ඔළුවේ තිබුණු කතාව. දැන් ඒ කතාවෙන් මිදෙන්න ඕනේ.

**උපාසිකාව :** මම වැඩක් කරනකොට ඒක වදයක්.

**ආර්යයන් වහන්සේ** : ඇත්තටම ඔබතුමියට ඕන ඇත්ත දැනගන්න ද? සත්‍යය හොයන්නද?

**උපාසිකාව :** ඇත්ත දැනගන්න.

**ආර්යයන් වහන්සේ** : සිතුවිලි නැති කර ගන්නද? දෙකෙන් එකයිනෙ වෙන්න ඕන.

**උපාසිකාව :** දෙකම එකක් නෙවෙයිද?

**ආර්යයන් වහන්සේ :** දෙකම එකයි.

**උපාසිකාව :** අන්න ඒක තමයි මට දැනගන්න ඕන.

**ආර්යයන් වහන්සේ** : දෙකම එකක් නොවෙන තැනක් පෙන්වන්න පුළුවන්. ඒක තමයි හුස්ම හැංගුනා ම සිතුවිලි එන්නේ නැහැනේ. ඒත් ලෝකේ සත්‍යය දැනගෙන නෑනෙ.

**උපාසිකාව :** එහෙමයි මට ඕන අන්න ඒක තමයි. සත්‍යය දැනගන්න එක. හරි හරි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඒක කරන්න පුළුවන් වෙන්නෙ එකම එක විදිහයි තියෙන්නෙ. **"ඒකායන මග්ගො අයං භික්ඛවේ"** එකම එක විදියයි තියෙන්නෙ. වෙන විදි ගොඩක් නෑ. එක පිළිවෙළින් යන ක්‍රමයක් තියෙනවා. **අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, අනුපුබ්බ ප්‍රතිපදා.** ඒ වගේ ම බුදුන් වහන්සෙ දේශනා කරනවා අනුපිළිවෙලින් යන මගක්.

එතකොට ඒකෙ මුල, මැද, අග අනුපිළිවෙලින් තියෙනවා. බුදුන් වහන්සේ සත්‍යය දැකල දේශනා කරපු දේ, අපිට පුළුවන් ඇත්ත දැකල අපේ තුළින් ම, බුදුන් වහන්සේ කියන්නෙත් මේ හිතන එකක් නෙවෙයි, විශ්වාස කරන දෙයක් ඇදහිල්ලක් නෙවෙයි. මේක තමන්ටම දැකගන්න විදියක් කියනවා. තමන් තමයි දැකගන්න ඕන. අපිට දැකගන්න විදිය කියනව මෙන්න මෙහෙම මෙන්න මෙහෙම කියලා. දැන් අපිට කවුරු හරි දුරේක්ෂයක් දීල, මේකෙන් බැලුවොත් පේනවා කියනව ඉරබටු තරුව. අපි දැන් ඕක පැත්තකින් තියලා ඉරබටු තරුව කියල උඩ බලාගෙන, ආ මේ ඉරබටු තරුවක් නෑනෙ, මේක ඕන්නෑ කියල පැත්තකින් තිබ්බොත් මොකද වෙන්නෙ?

**උපාසිකාව :** හරියන්නෙ නෑ. පේන්නෑනෙ.

**ආර්යයන් වහන්සේ :** ඉරබටු තරුවක් තියෙනවද කියල ඕකෙන්ම බලන්න වෙනව. අන්න ඒ වගේ දෙයක් තමයි. බුදුන් වහන්සෙ අපිට ක්‍රමයක් කියනවා. මේක බලාගන්න ඕන අපිමයි. ඉතිං බුදුන් වහන්සේ කියන අනුපිළිවෙලින් යන ක්‍රමය නොදන්නකමයි ඔබතුමියටත් අනෙක් අයටත් තියෙන ගැටලුව. අනුපුබ්බ, පූර්වභාග ප්‍රතිපදාව ඔබතුමිය හරියට සම්පූර්ණ කළාද? දැන් අපරභාග ප්‍රතිපදාව ද ඉතුරුවෙලා තියෙන්නෙ. මොකද්ද ඔබතුමිය බුදුන් වහන්සේ දේශනා කරපු ධර්මය තුළ දැන් මේ තාක් මේකයි බුද්ධ දර්ශනය වටහාගෙන තියෙන්නෙ.

**උපාසිකාව :** මම දන්නෙ එක දෙයයි. නිවන් දකිනවා කියල කියන්නෙ මේ හිත නිවාගැනීමනෙ. ඒ කියන්නේ හිත නිවෙනව කියන්නෙ ලෝභ, ද්වේශ, ඉබේම මෝහ නෑ කියන්නෙ, හිත නිවෙනවනෙ. ඒක මට තේරෙනව.

**ආර්යයන් වහන්සේ :** ඔව් දැන් කියපු එක හරි කියමු. දැන් ගින්නක් තියෙනව. වතුර එකක් දාන්න ඕන ගින්න නිවන්න.

**උපාසිකාව :** නෑ. දැන් මෙහෙමයි ආර්යයන් වහන්ස. දැන් මොකක් හරි සිතුවිල්ලක් ආවොත් බලනව, හැම තිස්සෙම මේක ඇයි එන්නෙ. ඒක දිහා හොඳට ඇනලයිස් කරල බැලුවම පේනව මේක තුළ එක්කො ලෝභය තියෙනව ද්වේෂය තියෙනව මොකක් හරි එකක් තියෙනව කියන එක මට තේරෙනවා. දැන් මේ ඊයෙ පෙරේදා දාපු රෙකෝඩින් එකේ

තිබ්බනෙ කෙනෙක් එක්ස්පරිමන්ට් එකක් කරල පෙන්සිල් කේස් එක මේ දෙක දිහා බලාගෙන ශබ්දයක් සහ රූපයක් කියල බලනකොට එයාට දැනුන කියල. එහෙම එකක් මට තාම දැනුනෙ නැහැ. ඒ කියන්නෙ මම තාම මිත්‍යාදෘෂ්ටිකයි.

**ආර්යයන් වහන්සේ :** ඒක එයාගෙ වැඩක්නෙ. ඔබතුමියට ඒක ගැලපෙන්නෙ නැති වෙන්න පුලුවන්. බුදුන්වහන්සේ කමටහන් හෙමත් එහෙමනෙ වෙනස් කරන්නෙ. එක්කෙනෙක් සුදු රෙදි කෑල්ලක් තියාගෙන රජෝහරනං කියල කිය කිය ඉන්නව. තව කෙනෙක් සුදු රෙදි කෑල්ල තියාගෙන රජෝහරනං කියල මූන පිහිදගෙන ගෙදර යනවා ඒක එයාට හරිගියේ. අරයට සමහර විට ලොකු ෂොක් එකක් වැදිලා ඒක හින්ද ඒකෙන් එයාට නිවන් මග පෑදෙනව. තව කෙනෙකුට ඒක හරියන්නෙ නෑ. සුදු රෙදි කෑල්ල අතගෑව කියලා හැමෝම නිවන් දකින්නෑ. මේ කමටහන් කියන ඒව කෙනාට කෙනාට වෙනස්. ඒක නෙවෙයි මෙතන වැදගත්. මෙතන ඉස්සෙල්ලම වැදගත්, බුදුන් වහන්සේ ඔය ඔක්කොම කියන්නෙ බුද්ධ දර්ශනය අවබෝධ කරලනෙ. බුද්ධ දර්ශනය ගැන අවබෝධයක් තියෙන අයටනෙ. එක පාරටම කියන්නෙ නෑ. දැන් පටාචාරාව ආවත්, අංගුලිමාල ආවත් කවුරු ආවත් දර්ශනයනෙ කියන්නෙ, ඉස්සෙල්ලම. දැන් පස්වග තවුසො ගාවට එනවනෙ බුදුවෙලා. පස්වග තවුසො බුදුන් වහන්සෙගෙ ගුරුවරු නේ. බුදුන්වහන්සේ ගෝලයෙක්නෙ. බුදුන්වහන්සේ එනකොට ඔය ගෝලය පොට වරද්දගෙන ආව කියල ගුරුවරු ටික ගණන් ගන්නෙ නෑනෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඊට පස්සෙ ධර්මය දේශනා කළත් ඔය පස් දෙනාගෙන් හතර දෙනෙකුම අවබෝධ කරගන්නෙ නෑනෙ. 'ධම්මචක්කපවත්තන' සූත්‍රය දේශනා කළාට හතර දෙනෙක් ම අවබෝධ කරගන්නෙ නෑනෙ. එතකොට එක්කෙනයිනෙ අන්න කොණ්ඩඤ්ඤට වැටහුණා කියල කියන්නෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** එතකොට ගුරුවරු. හිතමු මෝඩයො හොයාගෙන ගිහින් බණ කියන්නෙ නෑනෙ. බුදුන්වහන්සෙ බුදුවෙලා මේක

කියන්නබෑ කියල තේරුම් ගන්නවනෙ. ඒක මිනිස්සුන්ට තේරෙන්නෙ නෑ. මේක මිනිස්සු හිතන දේ නෙවෙයි කියල කෙලින්ම කියනව. පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු. මේ කවුරුත් එහෙම අහපු එකක් නෙවේ. කවදාවත් මේක අහල නෑ කියල දන්නව. මේක මිනිස්සු හිතන දේ නෙවෙයි කියලත් දන්නව. එතකොට එහෙම දෙයක් දැන් කියනව. පෙර නොඇසූ විරූ දහමක්. එතකොට කියනකොට මේක කාටවත් තේරෙන්නෙ නෑ. මේක ගුරුවරුන්ටත් තේරෙන්නෙ නැත්නම්, අර ඒකම කොණ්ඩඤ්ඤ තාපසතුමාට තේරුනේ නැත්නම්, බුදුන්වහන්සෙ ඕක අත් අරිනව. අන්න කොණ්ඩඤ්ඤට වැටහුණා කියල, එක්කෙනෙකුට හරි වැටහුණ නිසා තමයි බුදුන් වහන්සෙ උනන්දු වෙන්න ඉතුරු ටික පැහැදිලි කරන්න. මේක මේ බුද්ධ දර්ශනය නොදන්නකමයි මේ අද සමාජෙ තියෙන ගැටළුව. අද මේ ගොඩක් අය ඔබතුමිය දැන් ඔය කතා කරන්නෙ බණ අහනව හරි. බණ අහනකොට නමුත්, අපි හැම තැනම කියන දේ තමයි කාලයේ වැලිතලාවට සැඟව ගිය ඒ පරම සත්‍යය හෙළි කරමු කියල. එහෙනම් අපෙන් අහන්න ඕන පළවෙනි ප්‍රශ්නය තමයි මොකද්ද ඔබවහන්සේ ඔය හෙළි කරන බුද්ධ දර්ශනය.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස, මට කියන්න පුළුවන්ද ඔබවහන්සෙ හැම තිස්සෙම කියන නාමයක් සහ රූපයක් කියන්නෙ, ශබ්දයක් සහ රූපයක් කියලනෙ.

**ආර්යයන් වහන්සේ :** ඔබතුමිය ඔය මොනවා ඇහුවත් අපි දැන් උත්තර දෙන්නෑ ඔබතුමියට. ඒකට හේතුව තමයි ඔබතුමිය දැන් රාග, ද්වේෂ, මෝහ ගැන කතා කරනවා. සිත ගැන කතා කරනවා. දැන් නාම රූප ගැන කතා කරනව. ඔබතුමිය තනිකරම වයර් ෂෝට් වෙලානෙ දැන් තියෙන්නෙ. අපි තනිකරම ෂෝට් එක පුපුරවලා දාන්න හදන්නෙ. එතකොට ඔබතුමියට නිවන් හම්බ වෙනව. ඔය ප්‍රශ්න අහන ක්‍රමයෙන් ම අපිට තේරුම් යනව ඔය ෂෝට් එක පුපුරවලම දාන්න. ඒ කියන්නෙ මෙන්න මේකයි. බුදුන්වහන්සෙ ලෝකෙට හෙළිකරපු දර්ශනය මොකද්ද? මේක පොතයි කියල දැන් ළමයෙක් ඇවිල්ල කියනව. මේ ළමයට කොච්චර කිව්වත් එයාට මේ පොත කියවන්න බැරිනම් මොකද කරන්නෙ? ඔයා ඉස්සෙල්ල 'අ' යන්න 'ආ' යන්න දන්නවද කියල කියන්න. නෑ නෑ ඔය ඔක්කොම මට පුළුවන් කියනව. නෑ නෑ ඔයා මේ අයන්න

ආයන්න දන්නෙ නෑනෙ. ඔයා මේක කියවන්න කියල කිව්වොත් එයාට ඒක කියවන්න බැරිනම් මොකද කරන්නෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** 'අ' යන්න 'ආ' යන්න නේද ඉගෙන ගන්නෙ. බුද්ධ දර්ශනයයි නොදන්නෙ. ඒකයි අවිද්‍යාව.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** අපි ඔය දාල තියෙනවනෙ දේශනා සිය ගණනක් තියෙනවනෙ. ඇත්තටම දේශනා 600කට පස්සෙනෙ ඔය සාකච්ඡාවලට එන්නෙ. ඒත් අද වෙනකම් මොකද්ද අපිට කියන්න වෙලා තියෙන්නෙ. බුද්ධ දර්ශනයමයි. මේ තාක් දේශනා කරල තියෙන 1000ක් දේශනා කළානම් ඒ හැම දේශනාවක ම තියෙන්නෙ බුද්ධ දර්ශනය. දේශනා ප්‍රාතිහාර්යයක් වාගේ. අද වෙනකොට දේශනා දහස් ගණනක් යූටියුබ් එකට දාල තියෙනව. ඒත් බුද්ධ දර්ශනය සමාජයට ගිලිහිලා තියෙනව.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස මම ඒක පිළිගන්නව.

**ආර්යයන් වහන්සේ :** දැන් ඔබතුමියගෙන් අහන පලවෙනි ප්‍රශ්නය තමයි තාම ඔබතුමිය පිළිතුරු දුන්නෙ නැති එක. ප්‍රශ්න ගොඩක් අහ අහ ගියාට වැඩක් නැහැ. ප්‍රශ්නවලින් උත්තර හොයන එක. එහෙම නෙමෙයි ප්‍රශ්න නෙවෙයිනෙ උත්තර කියන්නෙ. එහෙනම් එක ප්‍රශ්නයකට උත්තර දීල ඉන්න ඕන. ඔබතුමියගෙන් අපි ඇහුව ප්‍රශ්නයක්. මොකද්ද ඒ බුද්ධ දර්ශනය කියන්නෙ මොකද්ද කියන එක. ඔබතුමිය ඒක හිතන්නවත් උත්සාහ කරන්නෙ නැහැ.

**උපාසිකාව :** බුද්ධ දර්ශනය නිවන් දැකීම. හිතේ ගින්න නිවීම.

**ආර්යයන් වහන්සේ :** හරිද එතකොට. දැන් බුද්ධ දර්ශනය අවබෝධ උනොත් නිවන් දකිනව කියන කොට. ඔබතුමිය කියනව නිවන් දැකීම තමයි කියල උත්තරේ. බුද්ධ දර්ශනය අවබෝධ කර ගත්තොත්නේ නිවන් දකින්නේ. එහෙනම් නිවන් දැකීම කියන එක නෙවෙයිනෙ උත්තරේ. දර්ශනය මොකද්ද කියන එකනෙ අහන්නෙ. දර්ශනය කල්පනා කරන්නවත් ඕනකමක් නැති එකයි අපිට තියෙන ගැටළුව. අපිට තියෙන ප්‍රශ්නය ගොඩක් අය හිතන්නෙ නෑ මොකද්ද මේ බුද්ධ දර්ශනය කියල.

**උපාසිකාව :** එහෙනම් ආර්යයන් වහන්ස මම මුල ඉඳල එකේ ඉඳන් හයසිය ගණන බලල ඉන්නද....?

**ආර්යයන් වහන්සේ :** නෑ... නෑ... ඒත් බැරිවෙනව කියල අපි කියන්නෙ. මේක මේ වචන දෙකෙන් උත්තර දෙන්න පුළුවන් ප්‍රශ්නයක්. ඔබතුමිය තවම ට්‍රැක් එක රේල් පීල්ලට දාගන්න බැරිව අපි මේ ඉන්නෙ. දැන් කෝච්චි පෙට්ටිය දාගෙන එහාට මෙහාට යනවනෙ. දැන් අපි බලන්නෙ කොහොම හරි පීල්ලට දාන්න. ඔබතුමියට යහපතක් තමයි මේ කරන්න හදන්නේ. ඔබතුමියම තමයි මේ පීල්ලට දාන්න හදන්නේ. ට්‍රැක් එකට. මොකද්ද බුද්ධ දර්ශනය, ඔබතුමිය හිරවෙලා ඉන්න තැන ප්‍රශ්න අහන්නෙ, ඔබතුමියගෙ දෘෂ්ටියෙ හිරවෙලා ඉන්න තැන කණ්ණාඩියෙ පාටින්, ඒකනෙ ඔබතුමිය දාගන්නෙ නෑ ට්‍රැක් එකට, හදාගන්නෙ නෑ. ඒකනිසා දැන් කල්‍යාන මිත්‍රයා කතා කරන මොහොතෙ, ප්‍රශ්නෙ විසඳගන්න පුලුවන්. හොඳින් හරි නරකින් හරි ප්‍රශ්නෙනේ විසඳෙන්න ඕන ... එහෙම නේද?

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඔව්. මොකද්ද ක්‍රමය කියන එක අදාළ නෑනෙ. බුදුන්වහන්සෙ සමහර වෙලාවට තුච්ච පෝට්ල කියල කියන්නෙ. ඒක තමයි කමටහන. මොකද පෝට්ල ඔක්කොම කරේ තියාගෙන ඉන්නෙ. අර තුච්ච පෝට්ල කියන වචනෙන් තමයි පෝට්ල රහත් වෙන්නෙ. ඒකට හේතුව ඒකෙන් තමයි වැටෙන්නෙ. ඔක්කොම ඔළුවෙ තියාගත්ත බැලුම් බෝලෙ පිම්බිච්ච බැලුම් බෝලෙ පුපුරන්නෙ එතනින්. පුපුරවල පෝට්ලට තේරෙනව ඇත්ත කතාව. මම තාම බැහැල නෑ ගමනට කියල. අන්න පෝට්ල ඊට පස්සෙ රහත් වෙනව. තුච්ච පෝට්ල කියපු නිසයි රහත්වෙන්නෙ. දැන් ඔබතුමියටත් ඒවගෙ තමයි. ගොඩක් අයට කියන්න තියෙනව ඒක. මේ බුද්ධ දර්ශනය මොකද්ද කියන එක. දැන් මේ ත්‍රිපිටකය සංයුක්ත නිකාය. ඒව අපිත් දානව. අපි දානව සූත්‍ර. සමුදය සූත්‍ර දානව. සලායතන සූත්‍ර දානව. එක එක සූත්‍ර දානව. දැන් මේ හැම එකම දර්ශනය පෙන්නන්නෙ. නමුත් කවුරුවත් හරියට කෝණය අල්ලගෙන නැහැ. බුදුන් වහන්සෙම කියනව අශ්ව ලෝමක් සියක් කඩකට පැලෙන්න විදීද, ඒ කාලෙ දුනුවායො හිටියෙ. එයත් විය හැකියි මහණෙනි, "මෙය සුකර නොවේ" කියනව. මොකද්ද මේ සුකර නොවේ කියන්නෙ. ඉදිකට්ටක්

මහ මුහදෙ වැටුනත් හමුවිය හැකියි. මෙය සුකර නොවේ කියනව. මේ බුදුන් වහන්සෙ දෙන උපමා බලන්නකො. පොඩිපහේ නෙවෙයිනෙ එකක්වත්. දැන් ඔබතුමිය දකින දක්‍ෂම වැඩක් අපි හිතමු. ඒකත් ලේසියි කියල. බුදුන් වහන්සෙ කියනව මේක සුකර නොවේ කියල. කවුරු හරි පරමානු බෝම්බෙ හදල පිපිරුවයි කියමු. ලෝකෙන් කෑල්ලක් ගියයි කියමු. අපි දන්නව අද හිටිය නම් බුදුන්වහන්සෙ කියනව, මහණෙනි පරමාණු බෝම්බෙ පුපුරල, ජපානයම හිරෝෂිමාවට බෝම්බ දාල විනාශ කළත් එයත් විය හැකියි මහණෙනි, හැබැයි මෙය සුකර නොවේ කියල. ඇත්තටම වෙන්නෙ නෑ මේක ලේසියෙන්. ඒකයි ධම්මචක්ක පවත්වන සූත්‍රයෙන් පස්වග තවුසන් 4 දෙනෙකුටම දර්ශනය අවබෝධ වෙන්නෙ නෑ.

මොකද්ද මේ බුද්ධ දර්ශනය. ඔබතුමියට තේරෙන්නෙ නැති වුණාට **මෙතන තියෙන්නෙ හරි පොඩි දෙයක්. ඒක තමයි අපි නිවන් දකිනව කියල දිගටම කරන්නෙ. එතනයි තියෙන්නෙ නූල්පොට. නූල ලිහෙනව. යටි නූල අහුවෙනව කියන්නෙ මැස්ම ලිහනකොට ඉඳිකට්ටෙන් අන්න ඒ පොට ඒකයි. මොකද්ද ඒ පොට.** අපි හැම සූත්‍රයකම කියනව. ඔබතුමියට කියපු ගමන් තේරෙනව. මොකද්ද මේ බුද්ධ දර්ශනය. ඔබතුමිය කියනව නම් අපි සතුටුයි. ඔබතුමිය ප්‍රඥාගෝචරද, ඔබතුමියට ඒ ඥාණ තියෙනවද? අපිට ඒක දකින්න පොඩ්ඩක් පහසුයි. ඔබතුමියට දැනෙන්නැද්ද? ඔබතුමිය හුඟක් දේශනා අහල තියෙනව. ඔබතුමිය ගොඩක් ධර්මයට ගෙඩක් කටයුතු කරන කෙනෙක්. මේක ප්‍රඥාගෝචර ධර්මයක්. මේක තියෙන්නෙ, අර ප්‍රඥාවන්තයගේ දහම. එහෙනම් අපේ ප්‍රඥාව අපි අවදි කරගන්න අපි හොඳ සූක්‍ෂම, අපි නුවන පාදා ගන්න ඕන. අපි නුවණ විමසන්න ඕන. අපි නුවන දියත් කරන්න ඕන. අපි පිහිය නිකන් තියාගෙන ඉඳල වැඩක් නෑ. මේක හොඳට මුවහත් කරගන්න ඕන. ඔව් ඔබතුමිය හිතන්න ඕන ඒක. දැන් මේක මනසිකාරය, මනසිකාරයෙන් ම නැති කරන එකක්නෙ මේ තියෙන්නෙ. එහෙනම් ඒකමනෙ දැන් ඔබතුමිය නුවණින් විමසන්න ඕන. මොකද්ද මේ දර්ශනය.

**උපාසිකාව :** මනසින් හිතන්නැතිව අපිට දැනෙන්න ඕන.

**ආර්යයන් වහන්ස :** ඔය කියන ඒවා එකක්වත් වැරදි නෑ. ඔය කියන ඒවා ඔක්කොම හරි. ඔබතුමිය ඔය දැන් නිවන කියන එකත් හරි. මොකද

සෑම මොහොතෙම රාග, ද්වේශ, මෝහ ගින්න නිවෙන එක තමයි නිවන. දැන් මනසට එය ඇත්තටම දැනෙනව කියපු එකත් හරි. ඒක තමයි. නමුත් පළවෙනි අකුර නැතුවනෙ මේ ඔක්කොම අකුරු ටික කියන්නෙ. අයන්න කියන්නෙ නෑනෙ.

**උපාසිකාව :** ආර්යන් වහන්ස මම දන්න කාලෙ ඉදන් මේ සිතුවිලි එනකොට මම බලනව ඇයි මේ සිතුවිලි එන්නෙ. එතකොට ඒ සිතුවිලි ලියනව පොතක. ලියල ඒක බලනව. මට පේනව එතකොට රාග ද්වේෂ ඒ ටික තියෙනව කියන එක පේනව. ඉතින් එහෙම ඒව අතෑර අතෑර ගියා උනාට මම අර කියන විදියට...

**ආර්යයන් වහන්සේ :** හරි අපි කියන්නම්කො එහෙනම්. අපි කියන්නම් කො උත්තරේ. බුද්ධ දර්ශනය කියන්නෙ මොකක්ද? ලෝකය ඇත්තක් නොවන බවයි.

**උපාසිකාව :** ආ... ලෝකය මායාවක් කියන එකයි.

**ආර්යයන් වහන්සේ :** ලෝකේ බොරුවක්

**උපාසිකාව :** බොරුවක් කියන එක. හීනයක් වගේ බොරුවක් කියන එකනෙ.

**ආර්යයන් වහන්සේ :** ඕක තමයි කියන්නෙ. මේ හැම වෙලේම කියන එක ඇයි ගන්නැත්තෙ කියන ප්‍රශ්නය අපිට තියෙන්නෙ. අපි මේ ලෝක සමුදය සූත්‍රය කියල කිව්ව. හැම සූත්‍රයකම කියල තියෙන්නෙ ලෝකය ඇත්තක් නෙවෙයි කියල. ඒක බුදුන් වහන්සෙ කියන්නෙ **"රූපං නිච්චංතෝ අනිච්චතෝ" "අනිච්චං භන්තේ."** ඔය සංඝයා කියන්නෙ රූපය කියන්නෙ මොකක්ද? එන අරමුණ. ශබ්ද රූපය, වර්ණ රූප, රස රූප, ගන්ධ රූප, පොට්ඨබ්බ රූප ආරම්මන මේ ද්වාර ඔස්සේ එන, ඒකෙන් තමයි ලෝකයක් හැදෙන්නෙ. ඒකයි "සලායතන ලොකෝ ලෝකෝ" කියන්නෙ. ඒ "රූපං නිච්චතෝ අනිච්චතෝ" කියල බුදුන් වහන්සේ අහන්නෙ මේ ලෝකය ඇත්තක් ද නොවේ කියන එකමයි. අනිච්චංභන්තේ කියන කොටම ඒ රූපය කියල බුදුන් වහන්සේ පෙන්නන්නෙ **මේ සේරම අපිට මේ පේන ඇහෙන ආරම්මණ රූපාරම්මණ බොරුවක්.** ඒක තමයි ඉස්සරලම අපි මේ දකින්නෙ, අපි අවිද්‍යාව කියන්නෙ ඕක. අවිද්‍යාව කියන්නෙ ලෝකය ඇත්තක් නොවේ කියන එක.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** බෞද්ධයෙක් වෙන්නෙ කොතනින්ද? දෙයක් තිබ්බොත් බෞද්ධයෙක් නොවේ. පොතක් තිබ්බොත් භවයක් තියෙනවා, දෙයක් තියනව. දෙයක් පොතක් නැහැ කියල හිතන එකයි බෞද්ධයෙක් කියන්නෙ. දැන් බලන්න. ධම්මචක්කපවත්තන සූත්‍රය කියන්න කලින් බුදුන් වහන්සේ ගිහිල්ල මොකක්ද කියන්නෙ පස්වග තවුසන්ට. "පෙර නොඇසූ විරූ දහමක්" එතකොට කියනව "පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු" මොකක්ද මේ දහම. ඇත කිව්වත් වැරදියි මහනෙනි. නැත කිව්වත් වැරදියි මහනෙනි, තියෙන ලෝකයක් නෑ මහනෙනි. එතකොට මේ කියන්නේ හේතුං පටිච්ච සම්භූතා හේතු නිරුජ්ජා නිරුජ්ජති" මේ හේතුං පටිච්ච සම්භූතා හේතු නිරුජ්ජා නිරුජ්ජති කියන්නෙ මේ ගස් වැල් මේව නෙවෙයි. මේ කියන්නෙ සංඛාර සිතුවිලි. මේ හිතන නිසයි ලෝකයක් මැවෙන්නෙ **"චිත්තේන නීයති ලෝකේ"** එතකොට බාහිර ලෝකයක් නෑ බුදුදහමෙ. බුදු දහමෙ තියෙන්නෙ **"මනෝ පුබ්බංගමා ධම්මා" "චිත්තේන නියති ලෝකෝ", "සංකප්ප ලෝකෝ"** කියන එක. එතකොට අපි දකින්න ඕන. අපේ දැක්ම මොකක්ද වෙන්න ඕන. බුදුන් වහන්සෙ මොකක්ද මේ පෙන්නන්නෙ. මොකක්ද පෙර නොඇසූවිරූ දහම. තියෙන දෙයක් නෑ. අපි මේ තියෙන දෙයක් තියනව කියල ගන්නෙ, මේසයක්, පුටුවක්, ඇඳක්, ගහක්, ඉරක් ඔක්කොටම නමක්. විඤ්ඤාණ මායාව අපි අතුලේ ඉන්නව කියන්නෙ මොකක්ද? මේ හීනෙ බලනකොට දෙයක්. **දෙයක් තියන එකයි හීනෙ.** පොත, මේසෙ, ඇඳ ඒව දකින්නෙ කොහොමද අපි.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස කිව්වනෙ පොත කියල දෙයක් දකිනව නම් තවම අපි මිත්‍යාදෘෂ්ටිකයි කියල. ඒක මට තවම අර බඩුවක් එලියෙ දකින එකක්.

**ආර්යයන් වහන්සේ :** ඒ අවිද්‍යාව. "අවිද්‍යා අශේෂ විරාග නිරෝධෝ" කියන තැන තමයි **මුළු බුදු දහමම තියෙන්නෙ.** ඒ කියන්නෙ දස සංයෝජන ගත්තත් සක්කාය දිට්ඨි, විචිකිච්චා, සීලබ්බත පරාමාස, කාමරාග, රූපරාග, පටිඝ, මාන, උද්දච්ච, අවිජ්ජා. **අවිද්‍යාව තමයි ඔක්කොම ගෙනියන්නෙ. අවිද්‍යාවෙන්මයි පටන් ගන්නෙ. අවිද්‍යා පච්චයා සංඛාරා. අපි මේ අවිද්‍යා පච්චයා සංඛාර කියන්නෙ මුළු කතාවම.** අපි කීව මේ පළවෙනියට අවිද්‍යා, දෙවැනියට සංඛාර ඔහොම යන එකක්.

මේ ඊට පස්සෙ නාමරූප, ඊට පස්සෙ විඤ්ඤාණ, නාමරූප, සලායතන ඒක නෙමෙයි. ඔය අවිද්‍යාපච්චයා සංඛාර කියන්නෙ මුළු කතාවම.

**උපාසිකාව :** ආ... දැන් වැටහුණා.

**ආර්යයන් වහන්සේ :** අපි දැන් මේ අවිද්‍යා පච්චයා සංඛාර කියන්නෙ පටිච්ච සමුප්පාදය. මේ පොතේ ලියල තියන ඔක්කොම ඒකයි කියන්නෙ බොරු කියල.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස මම මේ ගොඩක් බුදුදහම කියවල එහෙම අපි ඉස්කෝලෙ ඉගෙන ගත්තු එක ඇරෙන්න ලොකු දේවල් දන්නෑ.

**ආර්යයන් වහන්සේ :** හරි. අපි දැන් පොත් ගොඩක් කියවල පැත්තකින් දාල තියෙන්නෙ. පොත් කියවල තියෙනව අපි මේ එකතුකරල තියන පොත් දිහා බැලුවොත් එහෙම කාට හරි ලයිබ්‍රියක් දැමිය හැකි. කියෙව්වොත් එහෙම මිනිස්සු ඔළුව අවුල් කරගන්නව. ඒක නිසා අච්චු ගැහුවෙ නෑ. ඊරියකානේ චන්ද්‍රවිමල හාමුදුරුවොත් අන්තිමට කියනව මේ පොත් ගිනි තියල දාන්න ඕන කියල. ඒකට හේතුව මේ අවබෝධ කරගන්න කොට, නුවණ විමසන කොට පොත් ටික ලියවෙනව. හැබැයි ලිව්වට පස්සේ අවබෝධ කරන දේ බලනකොට පොත්වල තියන ඒව ඔක්කොම බොරු වෙනව. ඔක්කොම බොරු කියල අවබෝධ වෙනව. අන්තිමට පොතේ ලියපුව බොරු වෙනව කියල අන්තිමට අවබෝධ වෙනව. ඊට පස්සෙ ඒව කරේ තියාගත්තොත් කවුරු හරි මොකද වෙන්නෙ ඔක්කොගෙම නිවන ඉවරයි. හැබැයි ඒ ටිකම තමයි කියන්නත් ඕන. ඒකට හේතුව තමයි නොදන්නකම. ඒ ටික කියවනකොට කියවනකොට තමයි තේරෙන්නෙ මේක පොතේ තියෙන එකක් නෙවෙයි. හැබැයි මුලින් මේ වචන ටික පොතෙන් අල්ලගන්න අපිට හැකියාව තියනව. හැබැයි ඒක ගලපගන්න පසල් එක කියල අපි කියන්නෙ මේකයි. පසල් එක වගේ තියෙන්නෙ. ඔක්කොම අවුල්වෙලා තියෙන්නෙ. වචන ටික ඒව මේව අවුල් වෙලා තියෙන්නෙ. දැන් පසල් එක හදන්නෙ කවුද? අපි මේක හදාගන්න ඕන.

**උපාසිකාව :** අපිම මේක හදාගන්න ඕන.

**ආර්යයන් වහන්සේ :** අපිම හදාගන්න ඕන. ඉතිං මේක අවිද්‍යාව. මේ තනිකරම ඇවිල්ල සම්පූර්ණයෙන්ම අපිගාව තියෙන්නේ අවිද්‍යාව. දැන්

ඔබතුමිය ඔය කියපු හැම දේටම උත්තරේ කියන්න පුළුවන් එතනින්. ඒ කියන්නෙ දෙයක් නැත්නම්, දැන් ඔබතුමිය බලන්න හැම එහෙකටම උත්තරේ එන්නැද්ද කියල. නුවණින් මෙනෙහි කරල බලන්න. දැන් අපි හැම තිස්සෙම ප්‍රශ්නෙකට කාගෙන් හරි අපි බලාපොරොත්තු වෙන්නෙ අපි ඉගෙන ගන්න රටාවට මේ කොහේ හරි උත්තරයක් කවුරු හරි කියයි. එහෙම නැත්නම් පොතක තියෙයි. ඔන්න ඔහොම තමයි අපි හිතන්නෙ, ඒ සිස්ටම් එක වැරදියි.

**උපාසිකාව :** දැන් මට තේරෙනව ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** අභ්‍යන්තරයෙන් ම අපි විසින් නුවණින් මෙනෙහි කරල හදාගන්න ඕන පිළිතුර. අපි එහෙම රටාවකට යන්න ඕන. එහෙමයි බුද්ධිගෝචර, ප්‍රඥාගෝචර ඒකයි නුවණ. ඇත්තටම අපිට උපතින් මොකුත් නැහැනෙ. අපි මේ නුවණ පාදගන්න එපෑ. ඉතින් ඔබතුමිය අභ්‍යන්තරයෙන්ම ප්‍රාඥයෙක් වෙන්න ඕන. මේක ප්‍රඥාවන්තයින්ගෙ දහමක්. ප්‍රඥාවන්තයා කියන්නෙ කාගෙන්වත් එහෙම උත්තර ගන්න එකක් නෙමේ. තමා විසින් නුවණින් අවබෝධ කරගන්න එකක්. අවබෝධඤ්ඤාණයක් සංඛිත්තේන නිබ්බිදාය කියන අවබෝධඤ්ඤාණයක් කවදාවත් ම කාටවත් කියල කරන්න බෑ. බුදුන් වහන්සේ එහෙනම් නිවන් දක්කනව. බුදුන් වහන්සේට එහෙම නිවන් දක්කන්න බැහැ. තමන් අවබෝධ කරන්නම ඕන. **ඒ කියන්නෙ තමන් මේක නුවණින් විමසන්නම ඕන.**

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒ කියන්නෙ **අභ්‍යන්තරයෙන් හැම එකම ගලපන්න ඕන. හැමඑකම තමන්ට ගලපන නුවණක් තියෙන්න ඕන. හැම එකම මෙනෙහි කරන කුතුහලයක් තියෙන්න ඕන. ඒක තමයි විදර්ශනාව. විදසුන් නුවණ. විදගෙන යන්න ඕන. ගල් කැටයක් දැක්කත් ගල්කැටය කුඩු කරල බිලාස් කරල, නැති කරල, ආයි ගල් කැටයක් හම්බවෙන්නෙ නෑ.** ඒක අපි සමහර වෙලාවට පෙන්නනවා. මේ භෞතික පැත්ත සම්පූර්ණයෙන්ම කතා කරගෙන යනව. කතා කරල කතා කරල විශ්වය ගැනත් කතා කරල පෘථිවිය ගැනත් කතා කරල හැදෙන හැටිත් කතා කරල ඔක්කොම කියල අන්තිමට ම සේරම කුඩුවෙලා ගිහිල්ලා පෙන්නනවා මොකුත් නෑ කියල. භෞතික පැත්ත මොකුත් නෑ කියල

අන්තිමට ම පෙන්නනවා. හැබැයි මේ හරි ලේසි ක්‍රමයක් බුදුන් වහන්සෙ කියනව. ඒකට හේතුව තමයි හිත හැදිල තියෙන්නෙ ඒ න්‍යාය ඇතුලෙ. අර එක කොලයක් දිහා බලනව වගේ තමයි එක සිතක් ඇතුලේ මේ ඔක්කොම කතාව තියෙන්නෙ. දැන් අපි පැහැදිලි කරවනෙ ඒ කියන්නෙ ඔය ඔක්කොම හිත්. බාහිර ගත්තත් අපිට අභ්‍යවකාසෙට ගිහිල්ලතමයි නවතින්නෙ. ගල් කැටයක් හරි අතට ගත්තොත්, ගල් කැටේ අතට ගත්ත කියන්නකො. ගල් කැටේ අතට ගත්තොත් මේ ගල් කැටේ කොහෙන්ද ආවේ. පෘථිවියේ තිබ්බද? කොහොමද පෘථිවියේ හැදුනෙ. ඊට පස්සේ මේ ගල් කැටේට ආයිත් මොකක්ද වෙන්නෙ. මේකත් ආයෙ කුඩුවෙලා ගිහිල්ල අභ්‍යවකාසෙම වෙලා තමයි නවතින්නෙ.

**උපාසිකාව :** දූවිලි වෙලා.

**ආර්යයන් වහන්සේ :** දූවිලි ඉතුරු වෙන්නෙත් නෑ. අපි කියනව මොකක්වත්ම ඉතුරු වෙන්නෙ නෑ. අපි ගල්කැටේ දිහා බලා ඉන්න කොට අභ්‍යවකාසෙ පෙනෙන්නෙ, පුදුම හිතෙනව. අපි එකපාරක් ඔන්න කොස් ගහක් දිහා බලා ඉන්නව. මේ ඇත්තම කියන්නෙ. එතකොට කොස්ගහ කෑලි කෑලි කැපුව. ඊට පස්සෙ ගිනි තිබ්බ. ඊට පස්සෙ දුමක් වගේ නැතිවෙලා ගියා. කොස් ගහක් කියල එකක් නෑනෙ. දැන් මේක පැත්තකින් තියමුකො. ඊට පස්සේ පෘථිවිය ගන්න. පෘථිවියත් ඊට පස්සෙ බැලුව ඒකත් නැතිවෙලා යනව. අන්තිමට මොකක්වත් නෑ. දැන් ඇස් දෙක පියාගෙන මේක මෙනෙහි කරන කොට කොහොමත් අභ්‍යවකාසෙමයි පේන්නෙ ඊට පස්සෙ. දැන් එළියකුත් තියනව කියල දැනෙන්නෙත් නෑ. ඊට පස්සෙ දැන් ඇත්තටම මේක ධර්මය දිහා බලනකොට තේරෙනව අපි මේ හිතන එකනෙ. හිතනවනේ මේ ඔක්කොම.

**උපාසිකාව :** එහෙමයි. ඒකම තමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** හිතනව. පෘථිවිය කියලත් හිතනවා. අභ්‍යවකාසය කියලත් හිතනව, ගහ කියලත් හිතනව. දරුවො කියලත් හිතනව, හිතනවනේ... හිතනවනේ.. මේ ඔක්කොම. එතකොට හොඳටම තේරෙනවනෙ දැන් බාහිර කතාවක් කොහොමත් නෑ. දැන් ඒ කතාව කුඩුවෙලානෙ. දැන් හිතන කතාවනෙ තියෙන්නෙ.

**උපාසිකාව :** මේක තියෙන්නෙ ඔළුව ඇතුලේ. මේක සිතුවිල්ලක් විතරයි.

**ආර්යයන් වහන්සේ :** සිතුවිල්ලක් විතරක් නෙවෙයි. ඔය හිතන දේවල් ඔක්කොම බොරුවක්නෙ.

**උපාසිකාව :** ආ... ඒක එළියෙ නැත්නම් ඒක සිතුවිල්ලක් විතරයි.

**ආර්යයන් වහන්සේ :** එළියෙ කතාවක් නෙවෙයි. එළියෙ කොහොමත් මොකුත් නෑ. ඒ ගැන කොහොමත් කතාවක් නෑනෙ. ඔය ඒකයි මෙතන ධාතු මස්තකේ හරියට වැඩුවොත් ඒ ධාතු මනසිකාරය තුළත් මොකුත් හම්බවෙන්නෙ නෑ. ඇත්තට ම බැලුවොත් මේක, ස්කන්ධ පැත්තෙන් බැලුවත් මොකුත් හම්බවෙන්නෙ නෑ. ඒකයි ඔය කායානුපස්සනා කොයිපැත්තෙන් බැලුවත් මොකුත් හම්බ වෙන්නෙ නෑ. මේක දැන් හිත පැත්තෙන් මේක බලන්න. දැන් ඔක්කොම සිතුවිල්ලක් කියල ගත්තොත් මේකෙ මේ සිතුවිල්ලක් කොහෙද තියෙන්නෙ. ඒව අභ්‍යාවකාසෙටම තමයි වැටෙන්නෙ. සිතුවිල්ලක් හම්බවෙන්නෙ නෑ. දැන් පොතක් කියන කතාවක් කොහෙවත් නෑ. පොතක් කියන්නෙ ශබ්දයක්.

**උපාසිකාව :** ශබ්දයක් සහ රූප මේකේ මැවෙනවනෙ. අපිට රූපයක් මැවෙනවනෙ එකපාරට

**ආර්යයන් වහන්සේ :** ඇත්තට ම මෙතන කතාව බැලුවොත් මෙතන තියෙන්නෙ මෙච්චරයි. ඒ කියන්නෙ අපි මේ සමහර වෙලාවට, ඒ පර්යාය ගැඹුරු වැඩියි. ඒක පැත්තකින් කියමු. පැත්තකින් තියල දැන් ඔබතුමිය ඉන්න තැනට එමු. ඔබතුමිය ඉන්න තැනට ආවොත් මෙන්න මෙතනයි අපි මේ ධර්මය **ගොඩක් පොඩි ළමයකුට උනත් තේරෙන විදියට කියන කොට මෙන්න මෙහෙමයි. දෙයක් කියල දෙයක් නෑ. අපි මේ ඔක්කොම හිතන එකක්. අපි පොත කියල හිතන්නෙ. අපි මේ බාහිර දෙයක් තියනව කියලයි හිතන්නෙ. අපිට දැනෙන්නෙ, හිතන්නෙ. මේ තියනව කියලයි.** අපි හිතන්නෙ මේ පොත කියල. නමුත් මේකෙ තියෙන්නේ මහා භූත, අපිට මොකුත් පේන්නෙ නෑ. අර ඉපදුනු පුංචි දරුවා ළඟට ගිය ගමන්ම අපිට තේරෙනව, මේ කොහොමද මේක හැදුනෙ කියල බැලුවම. දැන් සමුදය බලන්න ඕන. මේක හැදුනෙ කොහොමද? කියල. දැන් පොත කියල කියනවනෙ, පොත කියල එනවනෙ. දැන් එන අරමුණ. දැන් මේ

මොහොතෙ එන අරමුණනේ දැක්කොත්, අපි කියනව නිවන් දකිනව කියල. එහෙනම් මේ එන අරමුණ අපි කීවෙ පොත කියල. පොත කීවේනේ, ලොකු තේරුමක් ඇතුව. පොත කියන්නෙ එක සිතයි. එක අරමුණයි. මේ එක සිතක් දැක්කොත් අපි කිව්වනෙ මේ ගහේ කොල 5000ම දැක්ක වෙනවානේ, එක කොලයක් දැක්ක වගේ, ඔක්කොම සිතුවිලි ඔහොමනෙ එන්නෙ. එක සිතක් හරියට දකින්නනෙ ඕන.

හරි දැන් අපි ගමු උපමාව පොත. පොත කියන එකක් බාහිර කොහොමත් නෑනෙ. දැන් බාහිර නෑ. පොත කියල නෑනෙ කවදාවත්, මම පොතය කියල. අපිනෙ හදාගත්තේ හැමදාම. දැන් **එතකොට මේ පොත කොහෙන්ද ආවෙ. බලන කොට ඔන්න දැන් ඕක හැදුනු විදිය බැලුවොත්, කවදද මුලින්ම පොත හැදුනෙ. ඒක පස්සට පස්සට ගියාම තමයි තේරෙන්නෙ අර පුබ්බේ නිවාසානුස්සති ඥානය පස්සට පස්සට යනව. සිතිවිලි පරම්පරාවක්, කොහොමද පොත හැදුනෙ කියල බලන්න. එතකොට පොත කියන එක එන්නෙ මොන්ටිසෝරි යන කාලෙ. එතකොට ඒක ඉපදෙන කොට තිබ්බද බලනවා. උපදින කොට දන්නෑ.** එතකොට එතනින් එහාට කතාවක් නෑ. **එතනින් මෙහාට හැදෙන්නෙ "ස්කන්ධානානං පාතිභාවෝ ආයතනානං පටිලාභෝ අයං වුච්චති ජාති" ඔන්න එනව එතනට.** එතනට ආවම **ඇසේ උපතයි මහණෙනි උපත. එතකොට බුදුන් වහන්සෙ දෙනව පොඩි ඉඟියක් දැන්.** එතකොට ඒක ගත්තම තේරෙනව හරි ඇස, දැන් පොඩි දරුවෙක් ගත්තම, **අපිට ජේනව පොඩි දරුවට ජේන්නෑ නෙවි, ජේනව. හැබැයි පොඩි දරුවට ශබ්දෙ එහෙනම් ඇවිල්ල නෑ. එතකොට ශබ්ද ටික වෙනම ආවත් පොඩි දරුව දන්නෙ නෑ.**

**උපාසිකාව :** ඉගැන්නුවා.

**ආර්යයන් වහන්සේ :** තව පැත්තකින්. දැන් ඇස්වලට මේ වර්ණ ටික ආවත් පොඩි දරුව දන්නෙ නෑ. තව පැත්තකින් මේ පොඩි දරුවාට මේ සුවඳ ආවම මොනවද කියල දන්නෙ නෑ. දැන් තොටිල්ලෙ තියල පොඩි දරුවෙක් දැන් බලාගෙන ඉන්නව. **පොඩි දරුව දැන් පාට උඩ බෝල බෝල එක දාල කැරකුවම අපට ජේනව පොඩි දරුවාට පාට ජේන්නේ නෑ කියන්න බෑ. පොඩි දරුවාට හිනාවක් එනව. පොඩි දරුවගේ ඒ අභ්‍යන්තර සෙන්සර්වල වෙනස, ඒවට වැඩකරන සිස්ටම් එක ජේනව. හැබැයි මේ පොඩි දරුව දන්නෙ නැති බව හොඳටම පැහැදිලියි.** පොඩි

දරුව මේ කහපාට කියල දන්නෑ. රතුපාට කියල දන්නෑ. පොඩි දරුව ඒ උනාට ඒවට අර දැනෙන ස්වභාවයක්, ඒ කියන්නේ **අර වර්ණවලට, වර්ණාලෝකයක් විතරයි පොඩි දරුවට. වර්ණ කියල කතාවකුත් නෑ, ආලෝකයක් විතරයි. හැඩතලයක් විතරයි. ස්පාක් එකක් විතරයි. ඇත්තම කතාව ස්පාක් වෙනව විතරයි. සාසවීයයි කියන්නෙ ඒකනෙ. සාසවීය කියන්නෙ ගම් එක තියෙනව.** ස්පාක් වෙනව කියන එක. ශබ්දවලට ස්පාක් වෙනව, වර්ණයක් ආවම ස්පාක් වෙනව. එච්චරයි. සමහර වෙලාවට ඔය යූටියුබ් එකෙත් දාල තියනව සමහර වෙලාවට පුංචි අතදරුවෝ සමහර විට මේ නපුරු සත්තු ගාව තියල තියනව. බල්ලෙක් ගාව තියල තියනව. පොඩි දරුවාට කයි කියලවත් හිතෙන්නෙනෑ. පොඩි දරුවාට මොකක්වත්ම එහෙම නෑ. ඒකට හේතුව සෙන්සර් එකට එහෙම එකක් නෑ. ස්පාක් එකක් විතරයි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** එතකොට ඇත්තට ම පොඩි දරුවා ඉස්සරහට හොල්මනක් ගියත්, හොල්මන් දකිනව පොඩි දරුවන්. ඒකට හේතුව තමයි පොඩි දරුවාට හොල්මන් නෑ.

**උපාසිකාව :** දන්නෑ මොකක්ද කියල.

**ආර්යයන් වහන්සේ :** පොඩි දරුවාට මළපෙරේතයෙක්, අපි දැන් හිතමු මේ මාරයයි කියල කියමු. මොන යකා ගිහින් තිබ්බත් පොඩි දරුව ළඟින් ගිහින් තිබ්බත් වැඩක් නෑ කියල අපි කියනව. ඒකට හේතුව තමයි පොඩි දරුවාට යකෙක් නෑ. දැන් අපිට මොකක්ද සිද්ධ වෙලා තියෙන්නෙ. අපිට මේ පොඩි දරුව වගේ ඉන්න බැරි ඇයි. පොඩි දරුව දුවන්නෑ කියල අපි දන්නව යකෙක් ආවත්.

**උපාසිකාව :** මට තේරෙනව දැන් ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** මට තේරෙන, සවිඥ්ඥානක එකම තමයි නොතේරෙන කම. ඔව් ඒ කියන්නෙ මෙතන ඇත්තටම සවිඥ්ඥානක ආත්ම කතාවක් නෑ පළමුවෙන්ම. මෙතන තියන්නෙ ශබ්ද, වර්ණ මේ ඇවිල්ල නිකං භෞතික එකක්. දැන් පොත කියන, දැන් අර අම්මා, කියන ශබ්දය ශබ්දයක් විතරයි. එතකොට ඒ වර්ණය, ශබ්දය මේ දරුව දැන් ගෙනිහිල්ල කැලේ තිබ්බ කියමු ටාසන් වගේ. අර ටාසන් කියල

කතාවක් තිබ්බෙ. කැලේනෙ හිටියෙ. අර හූවක් තියන්නෙ. අර ඒ වගේ කැලේ තිබ්බත් අර ශබ්ද ටික එකතු වෙනව වර්ණවලට. එතකොට ඉතිං ගෝත්‍රික හරි, වැදි භාෂාව හරි, එහෙම නැත්නම් හූවක් තියන එක හරි වඳුරෙක් වගේ අර රිලවෙක් වගේ කෑගහන එක හරි ඔක්කොම හරි. ඇයි අර ශබ්ද එන්නේ අර ගහ කොලවල ශබ්ද හරි ඒවා තමයි එකතු වෙන්නෙ.

**උපාසිකාව :** ආ... දැන් හරි

**ආර්යයන් වහන්සේ :** ඒ ටික තමයි එකතු වෙන්නෙ. ඕක තමයි අපි කියන්නෙ භාෂාව කියල. එතකොට මේ ස්වභාදහමත් බලනකොට ශබ්දයක් විතරයි. ශබ්දයක් එතකොට වර්ණයක් විතරයි. අම්මා කියන්නෙ ශබ්දෙකුයි වර්ණෙකුයි විතරයි. එච්චරයි මේ කතාව. ඔය කතාවෙ මේ **ශබ්දයයි වර්ණයයි තමයි අම්මා කියන්නෙ. එච්චරයි. ඒකට එකතු වෙච්ච තමයි ඊට පස්සෙ ආයි ආයි අභිසංකරණය වෙන්නෙ. කිරි දීපු අම්ම ආදරය කරපු අම්මා බේත් දීපු අම්මා ඕව හිතල හදාගත්තු ඒවා.** අන්න මනසිකාර චිත්ත චෛතසික, සංඛාර නිමිති අනු ව්‍යංජන හදනව කියන්නෙ. ඒ කියන්නෙ අභිසංකරණය වෙනව. නැවත නැවත නැවත නැවත අර ස්පාක් එකට තව ස්පාක් ගොඩක් එන එක. මේක ඇවිල්ල අදියර 4ක් 5කට දෙන්න ඕන කතාවක්. ඒ කියන්නෙ ඕක දැන් මුල් කතාව පටලව ගන්නව ඔය කතාව කිව්වොත්. ඒක අන්තිමට ම කියන්න ඕන එකක් දැන් කීවෙ. මුලි කතාවට ම යමු. ඒ කියන්නෙ ශබ්දයි වර්ණයි එකතු වෙන එක භෞතිකයිනෙ. අපි කිව්වනෙ ශබ්ද තරංග යකුත් වර්ණ තරංගයකුත් එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනව කියල. ඒක භෞතිකයිනෙ. දැන් ඔතන ආත්ම කතාවක් නැහැනෙ. ඔතන සවිඤ්ඤාණක මනසකින් බලන්නෙ අපිනෙ. නමුත් ඔතන තියෙන්නෙ ස්වභාදහමක්නෙ.

**උපාසිකාව :** දැන් තේරුනා මට.

**ආර්යයන් වහන්සේ :** දැන් ඔතනදි වන ස්පාක් එක, ශබ්ද ස්පාක් එකයි, වර්ණ ස්පාක් එකයි. අර අහසෙ විදුලි කොටන කොට මෙහෙ ජනෙල් හෙල්ලෙනව වගේ එලියෙ අම්ම කියන එකට, කර්ණසංකපටලය ප්‍රතිකම්පනය වෙනවනෙ. ඒකනෙ අපි ඇහෙනව කියන්නෙ. කර්ණසංකපටලය හෙල්ලෙන එකනෙ. ඒක කම්පනය වෙනවනෙ. ඒක

කම්පනය උනහම ඒ කම්පනයට ඒත් එක්කම ස්පාක් එකක් එනවනෙ අර කම්පනයට. එතනත් තියෙන්නේ ප්‍රසාදයනෙ, ප්‍රසාදය කියන්නෙ කම්පනයනෙ. එතකොට මේකත් කම්පනය වෙනව. වර්ණයත් ප්‍රසාද වෙනව. ඒ විතරක් නෙවේ. අම්මගෙ සුවඳ, උණුසුම, සීතල ඔක්කොම ප්‍රසාද වෙනව. ඒව ප්‍රසාද, මෙතන ස්පාක් ගුලියක් වගේ එකක්. **එකම ක්‍ෂණයෙ ශබ්දයත් ස්පාක් වෙලා. වර්ණයත් ස්පාක් වෙලා ඔක්කොම ස්පාක් වෙනව. ඔක්කොම එකට එකතු වෙනව. 'සම්පටිච්චන්න' වෙනව කීවෙ, මිශ්‍ර වෙනව.** මිශ්‍ර උනහම මොකද වෙන්නෙ. ඒක ඒ ස්පාක් එක, ඒ ස්පාක් එක. ඒ ස්පාක් එක කියන්නෙ ඔය සේරම. ඒකයි සංඛාරා කියන්නෙ. ඒ සංඛාරා එක තමයි විඤ්ඤාණය. ඒක තමයි සෙන්සස් වෙන්නෙ. අපි දැන් පොඩි කොටුවක් ගහමු පොතේ. එහෙම නැත්නම් රවුමක්. ඒක එතකොට අපි බ්ලොක් එකක් කරමු. අර කැමරාවෙන් ගන්න ෆොටෝ එක වාගේ. පොඩි බ්ලොක් එකක්. **ඒ බ්ලොක් එක ඇතුලේ අර ශබ්දෙ තියනව. දානව අර අම්ම කියන ශබ්දෙ. ඊට පස්සෙ අම්ම කියන රූපය අදිනව. ඊට පස්සෙ අම්මගෙ සුවඳ. ඊට පස්සේ අම්මගෙ තද ගතිය. උණුසුම ඔක්කොම දැන් අර බ්ලොක් එකේ. ඔය පිංතූරෙනෙ.** ස්පාක් එකනෙ. බ්ලොක් එකනෙ. ෆොටෝ එකනෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ : ඔන්න ඔය විදියට තමයි, මේ කැමරාවෙ ෆොටෝ රීල් එක වාගෙ දාගෙන දාගෙන දාගෙන දාගෙන යනව. හුස්ම වැටෙනවත් එක්කම දිගටම වදිනව. හුස්ම වැටෙන කොට දිගටම මේක දැන් වදිනව. නවතින් නෑ. හුස්ම නැවතුනොත් තමයි නවතින්නෙ.** ආශ්වාස ප්‍රශ්වාස වනවත් එක්ක, හාට් එක වැඩකරනව වගේ පෙනහැල්ල වැඩ කරනව වගේ මේ, මේ කර්මාන්ත ශාලාවෙන් කරන්නෙ ස්පාක් එක දෙන එකම තමයි. දැන් මේක, ස්පාක් කරන කර්මාන්ත ශාලාවක්. ස්පාක් කර කර දෙනව. වටේට දැන් තොරණ වගේ ලයිට් පත්තු වෙනව. වටේට දැන් බල්බ් එක වගේ මේක දැන් ආරෝපනයක් ඇවිල්ල ආලෝකෙකුත් එක්ක ඔක්කොම ස්පාක් වෙවී තියෙනව.

**උපාසිකාව :** ආ... හරි එතකොට මොහොතක අවධිය කියල කියන්නෙ එක මොහොතක් මම මේක හරියට බැලුවොත් මට මේක ග්‍රහනය කරගන්න පුළුවන්.

**ආර්යයන් වහන්සේ :** බෑ. ඇයි ඒ. ඇයි ඒ.

**උපාසිකාව :** දන්නේ නෑ ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** මේක වෙනමම පර්යායක්, ඔය කියන එක ඒකයි, **ඉස්සරලම අවබෝධ කරගන්න ඕන දර්ශනය. මොහොත කියන්නෙ ඇවිල්ල ප්‍රතිඵල.** ඒකයි කිව්වෙ අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, අනුපුබ්බ ප්‍රතිපදා කියල. කියන්නෙ මේ පූර්වභාග ප්‍රතිපදාව ගැන. ඒක නැත්නම් සත්‍ය ඥානය, එහෙම නැත්නම් කෘතමය ඥානය සත්‍ය ඥානය නැතුව කොහොමද කෘත්‍ය ඥානය කරන්නෙ.

**උපාසිකාව :** හරි දැන් එතකොට මට තේරෙනව. මම පළමුවෙන් ම කරන්න ඕනෙ මේ ලෝකෙ කිසි දෙයක් නෑ...

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ නෑ ඥානයනෙ. සත්‍ය නෙවෙයිනෙ ඥානය කියන්නෙ. සත්‍ය කියන්නෙ දැනුමනෙ.

**උපාසිකාව :** දැන් ඥානය අවධිකර ගන්න එකනෙ, ඥානය කියන්නෙ.

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ අවදි කරන එකකුත් නෙවේ. මේක මේ පොඩ්ඩක් අහගෙන ඉන්න ඕන ඉවසීමෙන්. ඒ කියන්නෙ කල්‍යාණ මිත්‍රයා කියන්නෙ හරි පුදුමයි. මේ ධම්ම චක්ඛුෂය තියනව නම් ඔබතුමියට තේරෙනව මේ කියන එක මොකක්ද කියන්න යන්නෙ කියල. ඒ කියන්නෙ දැන් මෙතන තියන්නේ මේ ස්පාක් වෙන එකනෙ. දැන් මේ ස්පාක් එක ඇවිල්ල අපි පෙන්නුවනෙ පින්තූරයක් වගේ එක ප්‍රේම් එකක් හැදුවනෙ. එකේ ශබ්දෙත් තියනව. වර්ණෙත් තියනව. උණුසුම සීතල ඔක්කොම තියනවනෙ. මේක ෂොට් එකක්නෙ වදින්නෙ කැමරාවෙන්. එක ෂොට් එකක්නෙ. එක ස්පාක් එකක්නෙ. ඒ ස්පාක් එකේ අර රූපය අම්මයි ස්පාක් එකනෙ එතකොට ඒ වර්ණයයි ඒ ශබ්දයි නේ ස්පාක් වෙන්නෙ

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** දැන් මේ එකකට එකක් වෙන් කරන්න බැරි මේ ෂොට් මේක පින්තූරයක් නේද? **පින්තූරයක් කියන්නෙ මේක ත්‍රිමාන පින්තූරයක්. එහෙම නැත්නම් මේක චිත්ත රූපයක්.**

**උපාසිකාව :** ඒ කියන්නෙ එච්චර ඉක්මනට මේක ත්‍රිමාන රූප හැදෙනව හිතේ.

**ආර්යයන් වහන්සේ :** මේක දැන් මේ කියන එකෙන්ම ගියා නම් හරි. ඒ කියන්නෙ මේ පෙන්නන්නෙ, මේ කියන්න යන දේ ගත්තොත් හරි. ඒ කියන්නෙ මේ පෙන්නන්න යන්නේ ඒක පින්තූරයක් කිව්වොත් අපි ඒකට කියන්නේ ෆොටෝ එකක් කියලනෙ. ඒක පින්තූරෙකුත් නෙවේ. දැන් ඒක ශබ්දයක් කියල ගත්තොත් අපි දකින්නෙ අර රෙකෝඩින් එකක් කියලනෙ. එහෙම එකකුත් නෙවෙයි. අපි දැන් මේක උණුසුම, සීතල තද ගතිය කියල එහෙම ගත්තොත් ඒක අපි වෙනින්ම මානයක්නෙ දකින්නෙ. එහෙම එකකුත් නෙවේ. මේක චිත්තයක් කියන එක වෙනමම කතාවක්. චිත්තයක් කියන එකේ, ශබ්දයකුත් තියනව. වර්ණකුත් තියනව. දැනෙන දැනීම් ඔස්සේ එන චිත්තයක් කියන්නෙ වෙනමම ශක්තියක් කියල අපි කිව්වනෙ. විද්‍යුතය කියන්නේ වෙනමම එකක්, ශබ්ද තරංග වෙනමම එකක් ඔක්කොම වෙනමම ශක්ති න්‍යායක්නෙ මුළු ලෝකෙම අපි පෙන්නුවෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒක නිකම් අර කොන්ටොම් වගේ අංශුවල ස්වභාවයක්නෙ පෙන්නුවේ මුළු ලෝකෙම. ඒ ස්වභාවය ඇතුලේම, මේක හදන අළුත් ස්වභාවයක් හැදිච්ච එකක්. හැබැයි මේකත් ඒ අංශුවලින්මයි හැදිල තියෙන්නෙ. ඒ අංශු ටිකම විදුලිය බවටත් හැරෙනව. ඒ අංශු ටිකම ආලෝකය බවටත් හැරෙනව. ඒ අංශු ටිකම ශබ්දය බවටත් හැදෙනව. ඒ අංශු ටිකම මේ විපරිනාමය වෙනව වේගයක් තුළයි මේක වෙන්නෙ. මේක වෙනම කතාවක්. මෙතන අපි වේගය කියන එකත් පැත්තකින් තියමු. මේක මෙතන දැන් අපි කතා කරන්නේ අපි තාම මේ බ්ලොක් එක ගැන පින්තූරේ ගැන. ඒකයි අපි කිව්වෙ පොතක අපි කොටුවක් ගහමු. කොටුව ඇතුලේ මේ ටික දැන් ලියමු කියල. දැන් මේකෙ පාටයි ෂොට් එක. දැන් මේ ෂොට් එකේ තියන විශේෂය තමයි, මේකේ මේ ආපු ෂොට් එකේ අර ආපු ආලෝක හැඩ තලය ආවත්, අර ටික ඔක්කොම එකට එනව කියල. දැන් මේක ගලවන්න බෑ. මේ චිත්ත කියන එක ඇවිල්ල ගලවන්න බෑ කියන එක.

**උපාසිකාව :** මේක ආලෝකය ආපු ගමන් මේක මැවෙනව.

**ආර්යයන් වහන්සේ :** මේක මේකයි දැන් කියන්නෙ යන්නෙ. දැන් මෙතන මැව්නෙ අම්මගෙ රූපෙනෙ මෙතන ෂොට් උනේ. දැන් අම්මගෙ

හැඩ තලය තියනව නේ මේ පින්තූරෙ ඇතුලේ. අම්ම කියන ශබ්දෙන් තියනවනෙ මේක ඇතුලෙ. දැන් මේ ශබ්දය ආවත් අර ෂොට් එකම එනව කියන එකයි කියන්නෙ.

**උපාසිකාව :** ආ... මට තේරුණා. වැටහුණා.

**ආර්යයන් වහන්සේ :** දැන් අම්මගෙ සාරියේ හරි සුවඳ ආවත්, අම්ම නැතත් මේ ඔක්කොම එනව අම්මා කියල.

**උපාසිකාව :** ටක්ගාල ඔක්කොම ටික ග්‍රහනය වෙනව.

**ආර්යයන් වහන්සේ :** මේක සෙට් එකක්. එකට එන්නෙ. එකක් නෙමේ, සෙට් එකක්. ඒ සෙට් එකේ ශබ්දෙ තියනව. වර්ණෙත් කියනව. දැන් මේ අපි එකක් දකිනවනෙ. දකින්නෙ වර්ණය උනාට ශබ්දෙත් තියනව. මේකෙ, ඒකට හේතුව චිත්තයක් දකින්නෙ.

**උපාසිකාව :** හරි හරි දැන් තේරුණා. දැන් තේරුණා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** මේ කොයි තරම් ගැඹුරු ධර්මයක්ද මේ කියන්නෙ. ඒකනෙ බුදුන් වහන්සෙ කියන්නෙ මේ ඕනම එකක් පුළුවන් උනාට මේක නම් ලේසි නෑ කියල.

**උපාසිකාව :** අද විග්‍රහ කරපු එක හොඳටම තේරුණා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** දැන් අපි මේ පැත්ත බලනකොට අපිට පේන්නෙ මේ ෂොට් එක. මේ ස්පාක් එක. අපි එක පින්තූරයයිනෙ ඇන්දේ දැන් පොතේ. මේ කොටුවක් ගහල ලිව්වනෙ ඔක්කොම ස්පාක් වුණු ටික. ඔය වගේ දැන් එකින් එක එකින් එක වදින්නෙ. මේ චිත්තය කියන්නෙ මේ සිතුවිලිනෙ. ඒ කියන්නේ වදින ඒව එකක් නෙවෙයි. වෙන් කරන්න බෑ.

**උපාසිකාව :** අපිට අර සද්දයත් එක්ක අර ඔක්කොම ටික ග්‍රහනය වෙනව. අපි අර ඉගෙන ගන්න වචනයක් තියනව. ඒ වචනෙට සද්දෙ ආපු ගමන් ඔක්කොම

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ නෑ අපි මොකුත් කතා කරන්නෙ නෑ. අපි කතා කරන්නේ මේ ෂොට් එක කියල විතරමයි. ඒක චිත්තයක් එහෙම නැත්නම් ස්පාක් එකක් කියන්නෙ මේකටයි. සංඛාරය කියන්නෙ

මේකටයි. මේ සංඛාරය කියන්නෙ මේක ඔක්කොම එකතු වෙච්ච එකක්. මේක චිත්ත රූපයක්, මේක ඇවිල්ල සංඥාව කියන්නෙ මේකටයි. මේක සංඥාවක්. මේ සංඥාවෙ දෙයක් තියනව. ඒ අම්මා. ඒකෙ අම්මගෙ රූපෙ තියනව. ඒකෙ අම්ම කියන ශබ්දෙ තියනව. ඒකෙ අම්මගෙ උණුසුම සීතල සේරම තියනව මේකෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** දැන් මේ සුවඳ කොහෙන් ආවත් අම්ම කියල කියනව. දැන් මේ මේ ස්වභාවය. මේක තමයි අපි කියන්නේ **"සමනන්තර"** ඒක ලොකු කතාවක්. දැන් මෙතනට එමුකො. ඒ කියන්නේ මේ මොකක් ආවත් මේ සෙට් එක එනව කියන එක. මේක තමයි සංඥාව **ඒක වෙන් කරන්න බැරිවෙනව. මොකද අපි ඇසුරු කරන්නෙ මේ වගේ සෙට්. අපි ඇසුරු කරන්නෙ වෙනම සද්දෙ. වෙනම වර්ණෙ නෙවෙයි.** දැන් මේ සෙට් එකෙන් සෙට් එක තමයි වදින්නෙ අපිට. මේක කැමරාවක් වගෙ. මැෂින් එකක් වගේ. එතකොට **චිත්තය කියන එක මේ කතා කරන්නෙ. චිත්තය කියන එක මැෂින් එකක් වගේ. චිත්ත රූප හැදෙන්නේ මේ චිත්ත රූප කියන්නෙ මේව තමයි ඔක්කොම** දැන් පේන්නෙ. ඇහෙන්නෙ. ඔක්කොම ඒවා. **ඇහෙන ඒවට, රූප කියනව. පේන ඒවට, ශබ්ද කියනව.** ඔක්කොම දැන් මේ ෂොට් තමයි වදින්නෙ.

**උපාසිකාව :** එහෙමයි

**ආර්යයන් වහන්සේ :** දැන් මේක ඇවිල්ල කැමරාවක් නම්, මේ කැමරාවෙන් තමයි **අපි ඔක්කොම ෆොටෝ ගන්නෙ. ඒකෙ ශබ්ද තියනව. දැන් එකක්වත් එන්නෑ. ඕකෙ නැති, ඕක මුල ඉඳන්ම හද හද එන එකක්.** ඒක තමයි මේක සේරම සංඛාරා කියන්නෙ. **සංඛාරා කියන්නෙ සකස් කර කර එන එකක්.** මැෂින් එකෙන් හදන්නෙ ඕක තමයි, සකස් කර කර හදනව ඔය දැන් මේ මොහොතෙත් ඒකම තව එකක් බවට පත් කරනව. ආයි තව එකක් හද හද ගගහ ගගහ යනව. දැන් ඊගාව පුදුමෙ බලන්නකො. දැන් මේ මොහොතෙත් අපි ෂොට් එකක් ගන්නවනෙ. ස්පාක් වෙනවනෙ. ඒ කියන්නෙ ආරම්මණයක් එනවනෙ. අරමුණක් එනවනෙ.

**උපාසිකාව :** එනව එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** එතකොට ඒ අරමුණෝ මේ එකයි තියෙන්නෙ. දැන් මේව තියනව ට්‍රිලියන ගණනක්. ඇදි ඇදී නැති වෙවී යනවනෙ. හැබැයි මේ ට්‍රිලියන ගානම එකට බද්ධ වෙලා තියනව. එක පින්තූරයක් වගේ පේන්නෙ. දැන් මේ ට්‍රිලියන ගානක් පින්තූර ගහනව. ෆොටෝ ගහනව. ගහල ෆොටෝ මිටියක් එනවනේ. දැන් පොටෝ ගහපු මිටියම අපි දැන් අර පොඩි එකකට සිම් එකකට ගන්නවනෙ අර සේරම ඩේටා ටික. අර කම්පියුටරේ තියන සේරම ඩේටා ටික අර සිම් කාඩ් එකකට ගන්නෙ. සිම් එකකට. දැන් ඔය ෆෝන් එකට දාල දැන් සිම් එකේ විශාල ප්‍රමාණයක් ඩේටා තියනවනෙ. දැන් සිම් එක කියන්නෙ, ඒ වුනාට එක තැටියයිනේ.

**උපාසිකාව :** එහෙමයි

**ආර්යයන් වහන්සේ :** මෙන්න මේ උපමාව එහෙම නැත්නම් අර ෆොටෝ ටික සේරම දැන් බිලියන ගානක් ෆොටෝ ගත්ත කියමු. ඒ ෆොටෝ ටික ඔක්කොම ප්‍රෙස් කරා කියමු. තද කරා මොකක් හරි එක පින්තූරයක් විදියට. **දැන් තියෙන්නෙ එක පින්තූරයයි. හැබැයි ට්‍රිලියන ගානක පින්තූර මේක ඇතුලේ.** දැන් තියන ප්‍රශ්නෙ මොකක්ද දන්නවද? දැන් තියන ප්‍රශ්නෙ දැන් ස්පාක් වෙන්නෙ එක පින්තූරයයි. හැබැයි ඒ පින්තුරේ ට්‍රිලියන ගාණක්, ට්‍රිලියන ගාණක් ස්පාක් වෙලා. ඒ ට්‍රිලියන ගානෙන් අරක එන්නෙ. ඒ ට්‍රිලියන ගානම ඕකෙ තියනව. ඕකෙ ආත්මයත් තියනව. ආත්මෙ හැදිල තියෙන්නෙ අර ප්‍රෙෂ් කරල. ප්‍රෙෂ් කරල ප්‍රෙෂ් කරල හදපු ආත්මෙ. දැන් ආත්මයක් දකින්නෙ. දැන් අර ප්‍රෙෂ් කරල ප්‍රෙෂ් කරල ප්‍රෙෂ් කරල ගන්නෙ. මොකක්ද ස්පාක් වෙන්නෙ ට්‍රිලියන ගානම අර දත්ත ඔක්කොම ප්‍රෙෂ් කරලනෙ තියෙන්නෙ එකට. ඒක දැන් අපි හිතමු මෙතන මෙතන දැන් අපි ඒක තමයි කිව්වෙ තාත්ත ස්පාක් වෙන්නෙ 33000යි. දරුව ස්පාක් වෙන්නෙ 5000යි කිව්වෙ. අර ෆොටෝ ගැන.

**උපාසිකාව :** ඒ කියන්නෙ අපි වයසට යන්න යන්න ෆොටෝ එකතු වන ප්‍රමාණය වැඩියි.

**ආර්යයන් වහන්සේ :** වයසට යන්න යන්න වැඩි වෙනව කියන්න බැහැ. මේක සිද්ධ වෙන්නෙ ෆොටෝ ගහන ප්‍රමාණය අනුවයි. සමහර විට අවු. 5 එක්කෙනා ගහන්න පුළුවන්. තාත්තට වැඩිය ෆොටෝ, ඒ

කියන්නේ තන්හාව වැඩිවෙන්න පුළුවන්. ඇයි දරුව ඇලෙනව වැඩි වේගෙන් ඇලෙන කොට, ඇලෙන කොට තණ්හාව තෘෂ්ණාව වැඩි වෙලා ඔක්කොම ගලවගන්න බැරිවෙන්න පුළුවන්. දරුව ගලවගන්න බැරි වෙන්න පුළුවන්. තාත්ත සමහරවිට ගලවල දාන්න පුළුවන්. ඒකට වයසක් කියන්න බැරි ඒකයි.

**උපාසිකාව :** ආ... හරි හරි. දැන් තේරුණා. දැන් වැටහුනා. ආර්යයන් වහන්ස. හොඳට වැටහුනා.

**ආර්යයන් වහන්සේ :** හැමදාම වැටහුනා වැටහුනා කියල ඉවර වෙලා, ආයි වැටහුනා කියන්න වෙනව. ආයි ආයි ප්‍රශ්න අහනව වැටහිලා නෑ. වැටහෙන්න විදියක් නෑ. ඒකට අපි හේතුව කියන්නම්. දැන් මේ පැත්ත බලනව. බිත්තිය. මේ පැත්ත බලනව පොත මේ පැත්ත බලනව බිම. අපි කියනව අර පොත දකින හිත නෙවෙයි, බිත්තිය දකින්නෙ. බිත්තිය දකින හිත නෙවෙයි මල දකින්නෙ. මල දකින හිත නෙවෙයි පුටුව දකින්නෙ. පුටුව දකින හිත නෙවෙයි, පොළව දකින්නෙ. ඔළුව වටයක් කරකවන කොට එතන එතන එතන එතන ෂොට් ටික වැදීගෙන යනව.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** දැන් එතකොට එක එක එක එකට අපි, දැන් මොකද අපිට වෙලා තියෙන්නෙ. දැන් නැතිඑකක් නෑ. නැති වෙලාවක් නෑ. හැමවෙලාවෙම මොකක් හරි එකක් තියනව. මොකක් හරි ස්පාක් එකක් තියනව. ඒකෙන් තමයි එන්ජින් එක ස්ටාට් වෙලා තියෙන්නෙ. දැන් එන්ජින් එක ස්ටාට් වෙලානෙ තියෙන්නෙ. දැන් ස්ටාට් වෙලා තියෙන්නෙ ඒකෙන්.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** හුස්ම වැටෙනකම්ම ස්ටාට් එකේ තියෙන්නෙ. ඒ කියන්නෙ අපිට පේන්නේ නැති වුණාට, ඇතුලේ මැෂින් එක වැඩ. දැන් එන්ජින් එක ස්ටාට් එකේ තියනව කියන්නෙ හරියට නිකං අපිට පන තියනව වගේ. පන තියනව වගේ කියන්නෙ අපිට ආත්මීය ස්වභාවය. ඒ කියන්නේ මේක ස්පාක් වෙමින් තියෙන නිසයි තියෙන්නෙ. මේ ස්පාක් ඇතුලේ තියනව ආරෝපනේ. ඒ කියන්නේ බල්බ් ඒකෙ ස්පාක් ගොඩ නිසා තියෙන ආරෝපනය වගේ, අපිට තියෙනව ආත්මීය ආරෝපණයක්,

මම ඉන්නව ලෝකෙම මේකෙ තියනව. **දැන් අපි ඇස් දෙක පියාගෙන හිටියත් පුදුමෙ කියන්නෙ අපි ඉන්නව කියල දැනෙනව. නෑ කියන්න බෑ. ඒක තමයි අරූපය කියන්නෙ.** අරූපෙට මුකුත් නෑ කතාවක්. ඉන්නව කියල දැනෙන එක විතරයි. ඒකෙ රූප බැලුවොත් අර ටික තියනව. ඒකෙ ආසාවන් පැත්ත බැලුවොත් කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය මේ සිතේ තියනව. මේ සිතේ තුන් භූමියම තියෙනව. අරූපය තමයි මේකෙ තියන ගැඹුරුම තැන. දැන් අපිට පේන්නැති දෙයක් නේද ඒක. ඒ කියන්නෙ ඉන්නව වගේ දැනෙන එක.

**උපාසිකාව :** දැනෙනව. ඉන්නව වගෙ දැනෙනව.

**ආර්යයන් වහන්සේ :** මේක තමයි කම්පන චංචල ස්වභාවය කියල අපි කියන්නෙ. සංඥාව සුකුම වෙනව කියන්නෙ මේකට. සංඥාව සුකුම වෙනව කියන්නෙ මෙන්න මේ ලොට් එක අඩුවෙන එක. ලොට් එක අඩුවෙනව කියන්නෙ, ලොට් එක අඩු කරන්න බෑ. දැන් පින්තූර ගලවන්න බෑ. පින්තූර ප්‍රෙෂ් කරල ඉවරයිනෙ. පින්තූර ප්‍රෙෂ් වෙනකොට තදවීම නිසා ඇතිවුණු වෙනමම තියනව, මේක කන්වර්ට් වෙලා. ආරෝපනයක් නැත්නම් මේක කරන්ට් එකක් බවට පත්වෙලා එහෙම නැත්නම් ඒ වගේ ස්වභාවයකින් තමයි මේක බලයක් ඇතුලේ නිර්මාණය වෙලා තියෙන්නේ. මේක අපි කියනවනම් මුලින් මුලින් පින්තූර ඔක්කොම කියල ගන්න, මේකේ තියෙන්නේ තන්හාව. එහෙම නැත්නම් මේකේ තියෙන්නේ අස්මිමානය. එහෙම නැත්නම් මේකෙ තියෙන්නෙ රාග ද්වේෂ මෝහ තමයි, තණ්හාව තමයි රාග ද්වේෂ මෝහ කියන්නෙ. මේ වචන ගොඩක් විතරයි. මෙකෙ තියනව ආරෝපනයක්. ඒ ආරෝපනයෙ තියනව දැනෙන ගතියක්. ආත්මීය ගතිය. ඒ ආත්මීය ගතිය තමයි අපි කිව්වෙ මෙ.වො. 3000 කියල කිව්වෙ, කරන්ට් එක. ඒ කරන්ට් එක තමයි අපි මේ පෙන්වන්නෙ මේක ෂෝට් වෙනව කියල හැමතැනම. එතකොට අර ෂෝට් වෙන්නෙ අර ෂොට් තමයි වදින්නෙ. අර මුලින් අර පොතේ ඇන්දෙ කොටුවක්. ඒ වගේ ෂොට් තමයි වදින්නෙ. ඒ හැම එකම දැන් පේනකොට දැන් රූපයක් එතකොට සද්දයක් එන්නෙ. ඔක්කොම ටික එනව. අර ෂොට් එකේ තියෙන ඒවා ඔක්කොම එනව. **සුවඳක් ආවොත් එකේ තියන වර්ණයත් එනවා. ශබ්දත් එනව. උදා: විදියට පිච්ච මලේ සුවඳ. පිච්ච මල කියන සද්දෙත් තියනව. පිච්ච මල කියන රූපෙත් තියනව පිච්ච මලෙ සුවඳ එනකොට.**

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** දැන් රස එනකොට අන්නාසි කියන සද්දෙත් එනව. අන්නාසි කියන රූපෙත් එනව. අර ෂොට් එකක් එන්නෙ.

**උපාසිකාව :** ආ... අපිට දැනෙනව එතකොට.

**ආර්යයන් වහන්සේ :** දැන් සීතලක් එනකොට නුවරඑළියත් සිහිවෙන්න පුළුවන්. අර ෂොට් එකක් එන්නෙ. මෙතන දැන් මේ ස්පාක් එක තමයි දැන් හැම මොහොතෙම අර එන්ජින් එක ස්ටාර්ට් වෙනකොට ඇතුලෙ කැරකෙනවනෙ ඉන්ජෙක්ටර් ටික අපිට පෙන්නැති වුණාට වැඩ කරනවනෙ. මෙන්න මේ වගේ බඹරේ වගේ ඇතුලේ වැඩ කරනව. බඹරෙ වගේ කැරකෙනව. ඒ කියන්නෙ එකක් එනව යනවා. තව එකක් එනව යනව. තව එකක් එනව යනව. බඹරෙ වගේ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** එතකොට මේ වේගෙට මොකද සිද්ධවෙලා තියෙන්නේ තුන්කාලෙකුත් තියනව. මේ පැත්ත බලනකොට පොත තියනව. ආය මේ පැත්ත බලන කොට බිත්තිය තියනව. ආයිත් මේ පැත්ත බලන කොට කලින් තිබ්ච්ච පොත තව තියනව කියල, ආයි තව ෂොට් එකක් වැදිල දන්නෙම නැතිව. දන්නෙම නැතිව කලින් තිබ්ච්ච පොත, දැනුත් තියෙන්නෙ ඒ පොතමයි කියල ෂොට් එකකුත් වදිනව. ඒ කියන්නෙ තවත් එකක් වදිනව. ඒකයි මේ අභිසංකරනය අති ගැඹුරුයි මේ පැහැදිලි කිරීම. **ආයේ මේකෙ දැන් කාලයක් හැදෙනව. පොඩි කාලෙත් මං හිටිය, දැනුත් මං ඉන්නව. අනාගතයෙත් මං ඉදියි. මේ තුන් කාලෙ හැදෙන එක.** ඒක තවත් ෂොට් එකක් වදිනව. ඒක ඇතුලේ තවත් ෂොට් වදිනව.

**උපාසිකාව :** ආ... හරි හරි.

**ආර්යයන් වහන්සේ :** ඒ තමයි මනෝ විඤ්ඤාණය කියල කියන්නේ එලියෙන් ගහපු ෂොට් එකක් නෙවෙයි. අර වේගය තුළ මැවෙන ෂොට් ටිකක් තියනව

**උපාසිකාව :** ඇතුලෙන් එකක්.

**ආර්යයන් වහන්සේ :** ඇතුලෙන්ම වේගෙන් වදිනව ෂොට් එකක්. බඹරෙ වගේ. ඒව නැවත නැවත වෙනස් වෙනව. දැන් කලින් වැදුනු ඒව

තියනවනෙ ෂොට්. දැන් ෂොට් කියල කියන්නෙ අපේ මේ චිත්ත රූපෙට. ඔන්න දැන් ෂොට්. දැන් එතකොට කලින් වැදුනු ෂොට් එක තියනවනෙ, ඒ ෂොට් එකත් මේක ඇතුලේ නැවතත් වෙනස් වෙනව. ඒ කියන්නේ කලින් වැදුනු ෂොට් එකේ අම්ම හිටිය. ඒකේ ශබ්දෙ තිබුණ. ඒක දැන් වැදිලනෙ තියෙන්නෙ. හැබැයි දැන් ඊට පස්සෙ ඒව මෙහෙම උනානං හොඳයි. මෙහෙම උනානං හොඳයි. අපරාදෙ ඒ කාලෙ දුක් වින්දෙ. මේව තිබ්බ නම් අපිට සැප විඳින්න තිබ්බ. ඔන්න ඔය වගේ මහ පුදුමාකාර විදිහෙ අන්තිමට හිතාගන්න බැරි මල්ටිබැරල් එහෙකින් ගැහුව වගේ එකපාරට මේක ඇතුලේ දරාගන්න බැරිතරම් වෙනස්කම් වෙනව.

කොච්චර වෙනස්කම් වෙනවද කියනව නම් මේක නිකං අර වෛරල් වගේ. ඒ කියන්නෙ මේක නිකං වේග රූපයක් කියන්න පුළුවන්. ඒ කියන්නෙ විශාල ස්පාක් ගොඩකට ලක්වෙනව ඒක ඇතුලෙ. ඒක ඇතුලෙම, ඒ කියන්නෙ ඒක වදින තැනම වදින කොටම ස්පාක්. ඒ කියන්නෙ ඒක වැදිල ඉවරවෙන කොටම, වෙන එකක් එනව. මේ පැත්තේ ඒක විපරිනාමයෙ තියන අති ගැඹුරුම දේ. ඒ කියන්නෙ දැන් බිත්තිය දකිනවනෙ. බිත්තිය දැකල මේ පැත්තෙ පොත දකින කොට ඒ පැත්තෙ බිත්තිය දකින ඒකත් වෙනස් වෙලා තියෙන්නෙ. ඒ කියන්නෙ මේ පැත්ත දකින කොට අන්න හිතනව බිත්තිය දැක්ක. ඊට පස්සෙ මේ පැත්ත දකින කොට හිතනව පොත දැක්ක. ආයේ මේ පැත්ත දකිනකොට හිතනව අර පොත හරියන්නෑ. ඔන්න ඔය වගේ. ඒක වෙනස් වෙනව. ඒක ඇතුලෙම වෙනස් වෙනව. ෂොට් එක ඇතුලෙම ෂොට් එක වෙනස් වෙනව. මේක වෙන්නෙ වේගෙ තුළ. දැන් මුලින් එච්චර එහෙම දැනෙන් නෑ. මේව වැදිල වැදිල වැඩිවෙන්න වැඩිවෙන්න මේක විපරිනාම වෙනව. ඒක එකක් විදියකට කොහෙත්ම ඊට පස්සෙ නෑ. ඒක හැම ක්‍ෂණයේ ම ඒක නලියනව. **අර වේගෙට අහුවෙලා. කරන්ට් එක වගේ ඉපදිල. ඊළඟට කරන්ට් වදිනව වගේ දෙයක් සිද්ධ වෙනව. ඊට පස්සෙ මොකද වෙන්නේ දැන් අළුත් ඒවයි පරණ ඒවයි ඔක්කොම මිශ්‍රවෙන ෂොටුත් වදිනව. විශාල අභිසංකරණයක්. ඒක විශාල අභිසංකරණයක්. මේව මෙනෙහි කරන එක තමයි ඇත්තටම මේ භාවනා කරනව කියල මේ හුස්ම දිහා බලං ඉන්නවට වැඩිය, මේක විශාල විපස්සනාවක් තියෙනව මේකෙ.**

මේ අභිසංකරණය. "රූපං රූපත්තාය සංඛතං අභිසංකරෝති කියන එක. 'වේදනං වේදනත්තාය සංඛතං අභිසංකරෝති.' 'සංඛාර

සංඛාරත්තාය සංඛතං අභිසංකරෝති' කියන එක 'විඤ්ඤාන විඤ්ඤානත්තාය සංඛතං අභිසංකරෝති' කියන එක. හැම එකම විශාල විදියට ඒ කියන්නේ ඕක මෙනෙහි කරනව නම් පුදුමාකාර අවබෝධයක් එනව. පුදුමාකාර විදියට දැනෙන්න ගන්නව. ඒකයි මේ ප්‍රථම ධ්‍යාන ද්විතීයික ධ්‍යානයෙන්, තෘතීයික ධ්‍යානයට වැටෙන්නෑ කවුරුත්. ධ්‍යාන කියන්නෙ ඒක අභ්‍යන්තරයෙන්ම එන සංඥාවේ වෙනස්වීමක්. සංඥා වෙනස් වීමක්. විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා කිව්වට ඕක ඔයිට වැඩිය, හුස්ම දිහා ඒකාග්‍ර කරගෙන යනකොට උග්ගහ නිමිත්ත පටිභා නිමිත්ත එනකොට ඒ, ඒ පටිභානිමිත්තත් මේක සුකුම වෙනව තව තව. ඒ හටගන්න සංඥාව නෙවෙයි නිරුද්ධ වෙන්නෙ. වෙන සංඥාවක්. එක සංඥාවක් නැතිවෙලා **'සික්ඛා ඒකා උප්පජ්ජති' 'සික්ඛා ඒකා නිරුජ්ජති' 'සංඥා ඒකා උප්පජ්ජති' 'සංඥා ඒකා නිරුජ්ජති' ඒ කියන්නෙ එකම සංඥාවත් වෙනස් වෙනව කියන එක.** ඒක නිසා තමයි ධ්‍යාන මාරුවෙනව කියල බුදුන් වහන්සෙ පැහැදිලි කරන්නෙ. නැත්නම් ප්‍රථම ධ්‍යානෙ ඒ සංඥාවෙම හිරවෙන්න ඕන. ඒ සංඥාවත් ඒක ඇතුළෙම වෙනස් වෙලා ඊගාව ධ්‍යානෙට වැටෙන්නෙ. ඒකට හේතුව තමයි එකම සංඥාවක් වෙනස් වෙනව.

දැන් මේ පැත්ත දිහා බලාගෙන, අපි මේක කියල කිව්වට අපිට පෙන්නෑ. වේගයක් **විශාල වේගෙකින් ඒ පොත කියන සංඥාව ඇතුළට එනව ඒ ක්ෂණයේ ම මේක මෙහෙම උනානං හොඳයි වගෙ දැනීමක්. ඒක කියන්න කලින් ඊළඟ එක එනව. ෂොට් 2ක් වැදිලයි තියෙන්නේ, අපි දන්නැතුව. ඊට පස්සෙ හීනෙන් පේන්නෙ දෙවෙනි ෂොට් එක, වැදිල දැක්කෙ නැති ෂොට් එක. දැක්කෙ නැති ෂොට් එක හීනෙන් පේනව. මොකද ඒව සැඟවිලා ගියාට කැරකෙනව. අර ස්පාක් එකේ තියනව. ඒවා නැති වෙන් නෑ. ඒකයි මෙතන අවශේෂයක් තියනව කියන්නෙ. නිරවශේෂ විරාග නිරෝධයක් කියන්නෙ ඒකයි. අවශේෂ එකක්වත් හිටින්නෑ කියන එක.** දැන් මේ කතා කරන්නෙ තනිකර සසර ගමන හැදෙන හැටි. මේ මොහොතෙම අපි ඊළඟ භවය සදන හැටි. දැන් මේක පෝනෝභවිකා කියන මේ ක්ෂණයෙම ඊගාව සිත හැදෙන්න හේතු වෙනව. ඒකට හේතුව මේ ඉලිප්පීම මේ ආත්මීය ස්වභාවයමයි, මේ හැම මොහොතෙම ස්පාක් වෙන්න හේතු වෙන්නෙ.

**උපාසිකාව :** ඒක අපි දැන් ඤාණයෙන් දැක්කට පස්සෙ අපි ඊළඟට සිතිවිලි හදන එක අඩුවෙනවද ආර්යයන් වහන්ස?

**ආර්යයන් වහන්සේ :** ඔය දැන් ආයෙ පටලවගන්න හදන්නෙ. ආයේ යන්න හදන්නෙ. දැන් මේ කතා කරන්නෙ සමුදය විතරයි. ඔය කතා කරන්නේ නිරෝධය ගැන.

**උපාසිකාව :** හරි. හරි ආර්යයන් වහන්ස මම අහගෙන ඉන්නං.

**ආර්යයන් වහන්සේ :** අපි පොඩි එකෙක් එක්ක කතා කරන කොට පොඩි එකා කතා කළොත් මේ ලොකු වෙලා ඉන්නව වගේ. ඊට පස්සේ කතා කරන එකත් මොකද වෙන්නෙ. දැන් පොඩි ළමයෙක් එක්ක අපි කතා කරන කොට පොඩි ළමයා කතා කරනව ලොකු එක්කෙනෙක් වගේ. එතකොට අපි පොඩි එකෙක් එක්කද කතා කළේ කියල ප්‍රශ්නයක් එනව නේද?

**උපාසිකාව :** හරි ආර්යයන් වහන්ස තේරුණා තේරුණා. මං අහගෙන ඉන්නං.

**ආර්යයන් වහන්සේ :** දැන් ඒකනෙ මේ සමුදය ගැනයි කතා කරන්නෙ. සමුදය ඤාණං කියන එක. සමුදය ඤාණං කියන එක ප්‍රායෝගික පැත්ත කොච්චර පුළුල් කරන්න පුළුවන් ද? කොයි තරම් පුළුල්ව දකින්න තියනවද? **මේ "ඉති රූපං සමුදයෝ" කියන එක. මේ රූපය හැදෙන හැටි කොහොමද රූපය දෙයක් වෙන්නෙ කියන එක. කොහොමද පොත දෙයක් උනේ කියන එක. මේක කොහොමද ඊළඟට පෝනෝභවිකා කියන එක. 'පෝනෝභවිකා' කියනඑක ඇත්තටම මේ මොහොතෙම සකස් වෙනව. මේ මොහොතෙම දැන් උත්තේජය දීල ඉවරයි.** දැන් එන්නෙ කොයිවෙලාවෙද? අභ්‍යන්තරයෙ තියනව ඒ ස්වභාවය. ශක්තිය ඇතුලෙම සකස් වෙලා. ආපු ගමන් අර දෙවෙනි ෂොට් එක වදිනව. ඒ කියන්නෙ දැන් මොකක් හරි දකිනකොට මතක් වෙනව. අර පොත තාම ආ. ඒ පොත ගත්තනං හරි. ඒකෙ තව පිටු 3ක් ඉතිරිවෙලා තිබුණා. ඒ පොත ගත්තනං අපිට ඒ වැඩේ කරන්න තිබුනා. මේ කොහෙන්ද මේක ආවෙ. අර පොත දැකපු වෙලාවෙ, පොත පෙරලන වෙලාවෙ, එයා නිකංවත් ඔළුවෙ තිබුනෙ නැති එකක් තමයි පොතේ ඉඩ තිබුන බව අර වැදිච්ච ෂොට් එක. මෙතනදි ඒක එනව ටක් ගාල. ආ... ඒක ගන්න

පුළුවන්. මේක ගන්න පුළුවන්. අරක ගන්න පුළුවන්. අරක පුළුවන්. මේක පුළුවන් ඔක්කොම අන්තිමට මෙයාට, මෙයාට තියනව ලොකු කතාවක්. මේකෙ ඔක්කොටම වැඩිය තියන ඒක තමයි, මෙතන මේ බාහිර දැන්. මේ සේරම දැන් ඔක්කෝම, මෙහෙම දැන් මෙහෙම මේක භෞතිකයිනෙ කතාව. මේක දැන් මෙතන ආරෝපනයක් තියනවනෙ. මේ ආරෝපනය තමයි මෙතනදි අර ආත්මීය ස්වභාවයක් පෙන්නනවනේ. මෙතන කෙනෙක් ඉන්නවනෙ.

දැන් ඒ කියන්නෙ, මෙතන අපි හිතමු දැන් අම්ම ඉන්නව. අපි අර පුංචි දරුවගෙම කතාවට යංකො, දැන් පළවෙනි ෂොට් එකටම යමුකො. අම්මා ඊට පස්සෙ දැන් මෙන්න මෙහෙම මෙන්න මෙහෙම ඒ අම්ම ඒ තාත්ත, අර අයිය, අර නංගි ඊට පස්සෙ ඒක ඇතුලෙම ආරෝපණ ෂොට් එකක් වදිනවා, අර පළවෙනි ෂොට් එක වගේ වදිනව, කණ්ණාඩිය දිහා බලල, මේ මම මට තමයි පේන්නෙ. මම තමයි දැක්කෙ. මගෙ තමයි මේව. ඔය පැන්සල දෙන්නෑ. ඔය පැන්සල මගේ. හොඳට බලන්න. දැන් පොඩ්ඩක් ලොකු වෙච්ච ළමයි චුට්ටක් නිකං අර මොන්ටිසෝරි යන්න ඔන්න මෙන්න වගේ ඉන්න ළමයි. පාට පාට ඒව දැක්කහම දෙන්නෑ. අනිත් ළමයට බනිනව. ගහන්න යනව. එතනම ඇලිල තියෙන්නෙ. ගැටිල තියෙන්නෙ. අතන අර වෙන් කරන්න, වෙන් කරන්න ඇලෙනව ගැටෙනව. අතනින් දෙනව, වෙන් කරල දෙනව. මේක දැන්, පොඩි දරුවාට මොනව හරි සෙල්ලම් බඩුවක් දෙනව කියල. ඊට පස්සෙ එයා ඒක ලෙව කනව. එයා ඒක මිරිකනව, ඉඹිනව. ඔක්කොම කරල ඊට පස්සෙ ඒකට එයාගෙ බැඳීමක් ඇතිවෙනව. ඒක එයා අත් අරින්නෑ. ඊට පස්සේ ඒක තව තවත් ඔබ ඔබ ඉදල ඊට පස්සෙ ඒකත් එක්ක එයාගෙ සම්බන්ධයක් ඇති වෙනව. දන්නෙම නැතිව. ඊට පස්සෙ ඒක ගන්න බලන්න එයා අඬනවා.

ඇයි ඒ එතකොට එතනම ඒ දරුවට ඇලීමේ තණ්හාවේ ස්වභාවය ඇති වෙනව. එතකොට එතනට, **ඒ පුංචි දරුවගෙ ඇලෙන ස්වභාවය තමයි රාග ද්වේෂ මෝහ ඒ රාග ද්වේශවල ස්වභාවය ඇලෙන ගැටෙන ස්වභාවය තමයි ටික ටික ටික ටික වැඩිවෙලා ලොකු වෙන කොට භාෂාව බවට පත්වෙන්නෙ.** ඒ කියන්නෙ මේක කහපාට, ඒවගෙ තව එක එක එකතුවෙනවනෙ, අර මොන්ටිසෝරි යද්දි එයාට උගන්වනවනෙ. මේ තැඹිලි පාට, කහපාට, මේ පාට ලස්සනයි කියල හිතෙනව. එයාට සුදුසුයි කියල හිතෙනව. රතුපාට කහපාට වෙන් වෙනව. එතකොට වෙන්

වෙන්නෙ, මේ ශබ්දෙම්මයි. හොඳට බලන්න. එතකොට මේ ප්‍රේම් එකේ සද්දෙ දැම්මට පස්සෙ වෙන් වෙනව. කහපාට එකම ප්‍රේම් එකේ, කියල අපි හිතමු. මේ කහපාට කියල සද්දෙ දැම්ම ඊට පස්සෙ ඒ ප්‍රේම් එකේම අඳිනව තව පින්තූරයක්, ඇඳල රතුපාට කියල සද්දේ දානව. එතකොට අර ප්‍රේම් එකේ ඒ පාට ටික දැම්ම, මේ ප්‍රේම් එකේ මේ පාට ටික දැම්ම. දැන් මෙන්න මේ වගේ දැන් ඔය පාට ටික වෙන් කරන්න කලින්, අපිට මේ ඔක්කොම එක ප්‍රේම් එකයි. දැන් ඕක ආලෝක හැඩතලයක් විතරයි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** හැබැයි අර පාට දාල තමයි ප්‍රේම් ටික ආයිමත් ගහන්නෙ. රතු මේ කහපාට, අර මොන්ටිසෝරි යන කාලෙ වගේ. පුතේ මේ කහපාට, මේ රතුපාට යෙලෝ, රෙඩ්, මේ නිල්පාට බ්ලූ ඔන්න ඔතන ඉදන් මේ පාට වෙන්වෙලා පේන්න ගන්නව. පුංචිම කාලෙ මෙරිගොරවුන් එකේ අර තොටිල්ලෙ ඉන්නකොට පාට වෙන්වුණේ නැහැ. තොටිල්ලෙ ඉන්නකොට හිනාවෙවී හිටිය පාට වෙන්වුනේ නැහැ.

**උපාසිකාව :** ආශාව නෑ

**ආර්යයන් වහන්සේ :** පාට වෙන් වුනේ නැහැ. ශබ්දවලින් තමයි වෙන් කළේ.

**උපාසිකාව :** ආ... හරි හරි හරි තේරුණා.

**ආර්යයන් වහන්සේ :** එතකොට මේ ශබ්ද වලින් එන දිට්ඨ, සුත මේ ලොකු කතාවක් මේ තියෙන්නෙ. මේ ඔක්කොම යන්නෙ එකම සිස්ටම් එකක් වුනාට, ඔය දෙක ලොකුවට බලපානව. ඒ දෙකෙන් තමයි මේක, දැනුත්, මේක අපිට රතුපාට මේ කහපාට මේක නිල්පාට මේක වෙන්කරල තියෙන්නේ ශබ්දෙන්. ශබ්දෙ තමයි මේක ඇවිල්ල ධ්වනියක්නෙ. කම්පනයක්නෙ, කම්පනයන්. දැන් වර්ණත් එක්කනෙ තියෙන්නෙ. මේ ධ්වනියම තමයි නාමය පැත්ත බලගැන්විලා තියෙන්නෙ. ඒ කියන්නේ මේ ශබ්දෙන්නෙ මේ ඔක්කොම, දැන් බාහිර රූපය කියල දෙපැත්තට කරකැවිල තියෙන්නෙ. මේ දෙකමයි බලන කොට දැන් එතකොටම එනව සද්දෙ, බාහිර කියල ගන්න බෑ. ඒක සංඛාර. ඇත්තටම මේකෙ අන්ත දෙකක් නෑ. මේ එක ෂොට් එකයිනෙ තියෙන්නෙ. ඒ ෂොට් එකේම නේ වර්ණෙත් තියෙන්නෙ. ඒ ෂොට් එකේමනෙ ශබ්දෙත් තියෙන්නෙ. ඒ වුනාට

අපි ගන්නෙ එළියෙ කියලනෙ. එළියෙනෙ පෙන්නන්නෙ. ඒ උනාට ඒකේ දෙකක් නෑනෙ. මෙතන මම, එතන ඒක කියල දෙකක් නෑනෙ. දැන් මෙතන කියන්නෙ මමද, ඒක දකින්නෙ දැන් මම කොහෙද ඉන්නෙ. දැන් මේ එළිය කොහෙද තියෙන්නෙ? දැන් මේ සිත ස්පාක් එක හැදෙන්නෙ එතනම නම් දැන් මේ කියන එක පැටළුනද දන්නෑ. ඒ කියන්නෙ.

**උපාසිකාව :** ඒක පැටළුණා.

**ආර්යයන් වහන්සේ :** දැන් මෙතන පොත තියනව කියල හිතන්නකො, එළියෙ, දැන් එතකොට පොත දකින්නෙ මමයි කියලනෙ හිතන්නෙ, මේක දැන් ශබ්දෙයි වර්ණෙයි එකටනෙ තියෙන්නෙ. දැන් එලියෙද පොත තියෙන්නෙ.

**උපාසිකාව :** ආ... හරි මගෙ හිතේ.

**ආර්යයන් වහන්සේ :** මගෙ හිතේද තියෙන්නෙ. දැන් පොත කොහෙද තියෙන්නෙ දැන් මම කොහෙද ඉන්නෙ

**උපාසිකාව :** ඒ ඔක්කොම එකක්.

**ආර්යයන් වහන්සේ :** මෙතන මම කියල කෙනෙක් නෑ. මේ ඇවිල්ල මේ පේන්නේ මෙතනම, දැන් මෙතන ඉදන්නෙ බලන්නෙ. දැන් මෙතන ඉදන්නෙ අර ඈත පෙනෙන කන්ද පේන්නෙත්. එතකොට මෙතනනෙ ස්පාක් වෙන්නෙ කොහෙවත් නෙවෙයිනෙ. එහෙනම්, මෙතනනේ මේ ඔක්කොම තියෙන්නෙ.

**උපාසිකාව :** අ... මෙතන තමයි ස්පාක් වෙන්නෙ ඔක්කොම

**ආර්යයන් වහන්සේ :** මෙතන තැන් දෙකක් නෑ. අන්ත දෙකක් නෑ. අජ්ජත්ථ බහිද්ධ කියන අන්ත දෙකෙන් මිදුනු ධර්මයක් දේශනා කරන්නෙ. මේකෙ අනිත් පැත්තට යංකො. එතන ඒක නැත්නම් මෙතන මේකත් නෑ.

**උපාසිකාව :** එතකොට මම කියල කෙනෙකුත් නෑ.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි සෝතාපන්න භූමිය වෙන් කරල අනාගාමී භූමිය කරන්න හේතුව. **සොතාපන්න භූමිය කිව්වේ මෙතනම ඔක්කොම වෙන්නෙ කියන එක. දැන් මෙතනනෙ ඔක්කොම වෙන්නෙ. ඒක සෝතාපන්න භූමිය. එතකොට එතන නෑ. ඒ කියන්නෙ බාහිර ලෝකෙ නැතිවෙනව. මෙතනම ස්පාක් වෙනව කියන එක.** ඕක නිසා තමයි

මෙතන භූමි 4 පෙන්නන්නෙ. සෝවාන්, සකදාගාමී, අනාගාමි, අරහත් පෙන්නන්න හේතුව ඕකයි. වෙන හේතුවක් නො වේ. මේක අවබෝධ නොවී කව්රුත් රහත්වෙන්නෑ කිව්වෙත් ඒකයි. කවුරුත් නිවන් දකින්නෑ කිව්වෙ ඒකයි. අපිට එක මහත්මියක් කියනව සෝතාපන්න ඕව ගැන අදහසක් නෑ. අනාගාමී ඒව ගැන අදහසක් නෑ. මේක රාග ද්වේෂ මෝහ ක්ෂය වෙන මග. ඒක නිසා ඒව ගැන විතරක් කතා කරමු කියල කියනව. දැන් එයාට දර්ශනය පැහැදිලි කරන්නයි ඕන. එතකොට එයාට මේක පැහැදිලි කරන්නෙ කොහොමද? මේක පැහැදිලි කරන්න වෙනව. ඒකයි කිව්වෙ මෙතන ප්‍රතිපදාව පැත්ත වෙනයි. මේ මුල් එක වෙනයි. මුල් එකේ දර්ශනය පැහැදිලි කරන කොට ඔය ටික කියන්න වෙනව. බාහිර තියෙන දෙයක් නෙවෙයි. මෙතනමයි සකස් වෙන්නෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ : හැබැයි මේක අනාගාමී කියන්න හේතුව, එතන දෙයක් නැත්නම් මෙතනත් දෙයක් නෑ. එතන හැඩතලයක්නෙ ආරම්මණය කියන්නෙ එතන හැඩ තලයක් නැත්නම්, මෙතනත් නෑ. එතකොට පොතමයි මම වෙන්නෙ.** අනාගාමී භූමියෙ ප්‍රතිපදාව වෙන් කරන කොට ඕක පැහැදිලිව කිව්ව. **අනාගමී භූමියෙ මේක දෙපැත්ත මාරුවෙනව කියල ප්‍රතිපදාව. දෙපැත්ත මාරුවෙන හේතුව තමයි ඊට පස්සෙ අරමුණක් එතකොට ඒක සෝවාන් භූමියෙදි බාහිර නෙවෙයි, හිතනව කියන එක. ජේනව නෙවෙයි හිතනව. හැබැයි ඒක අනාගාමී භූමියට යන කොටත් හිතන තැනත් දෙයක් නෑ.** ජේන පොතමයි. තමන් අනිත් පැත්තට යනව. **අන්තිමට දෙපැත්තම නැතිවෙලා තමයි "පච්චේපරිග්ගහ ඥානය" කියන්නෙ අරහත් භූමියට එනව.** ඒකයි අනාගාමී භූමිය කියන්නෙ දෙකම නැති වෙන එක. අනාගාමි භූමියෙන් එහා කියන්නෙ දෙකම නෑ කියන එක.

**උපාසිකාව :** එතකොට අපිට මොකක්වත් ජීවත් වෙනව දැනෙන්නෑ.

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ නෑ ජීවත් වෙනව කියල දෙයකුත් නෑ. ඔය කියන්නෙ ආත්ම දෘෂ්ටියකින්. කෙනෙක් නෑ, ජීවත්වෙන්නෙ කවුද? ආයිමත් ඔබ තුමිය පනින්නෙම අර පොඩි ළමයගෙ තත්ත්වෙට. ඔබ තුමියගෙ අභ්‍යන්තරෙ ඉන්නව දඩබ්බර හිතුවක්කාර අර අපි කියන්නෙ දඟයි කියන්නෙ. හිත ඇතුල දඟයි.

**උපාසිකාව :** වෙන්න පුළුවන් ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඔව් ඔව් හිත ඇතුලෙ තියනව ගතියක්. ඇයි මේ පනින්නෙ. ඇයි මේ ආයි ආත්ම දෘෂ්ඨියක් කොහෙන්ද. දැන් මේකෙ ආත්ම කතාවක් නෑ කියලනෙ පටන් ගන්නෙ. දැන් පටන්ගත්තු තැන ඇයි අමතක කරල තියෙන්නෙ. ඔබතුමියට දැන් දැනෙන්න එපායැ ආත්ම කතාවක් නෑ කියල. ඔය වචන කියනව කියන්නෙම ඒක තියනව කියන එකනෙ. ඔය කොච්චර කතා කලත්, ඒකනෙ කියන්නෙ මේ දැනුම වෙනයි. ඥානය හරි ගාම්භීරයි මේ දැනෙන එක. ජානතෝ පස්සතෝ කියන කතාව. හිතන එක නෙවෙයි **මේකෙ තියෙන්න ඕන අභ්‍යන්තරයට මේකත් එක්ක යන්න ඕන. ඒකයි මේ ධර්මයම ජීවිතය බවට පත්වෙන්න ඕන. ධර්මය වෙනයි මම වෙනයි කියල දෙකක් නෑ කියන එක. ඒකයි ධම්ම කියල කියන්නෙ. ඒකයි 'සෝ ධම්මං පස්සති සෝ මං පස්සති' කියල කියන්නෙ. ඇත්තටම ධර්මය බවට පත් වෙන තැනයි බුද්ධ බවට පත්වෙන්නෙ.** ධර්මය බවට පත්වෙන්න බැරුවයි අපි මේ ඉන්නෙ එහෙනම් සොබාදහම බවට පත්වෙනව. ඇයි මේ අපි ගන්නෙ තාම ආත්ම දෘෂ්ඨිව තේරුනා නේ.

**උපාසිකාව :** ඔව් වැටහෙනව ආර්යයන් වහන්ස වැටහෙනව.

**ආර්යයන් වහන්සේ :** ඒකතමයි අපි ඔය කොච්චර ලොකුවට කතා කලත් අපිව විශ්වාස කරන්න එපා කිව්වේ. ඒකයි සිතුවිලි විශ්වාස කරන්න එපා කියල කිව්වෙ. සිතුවිලිවලින් නිවන් දකින්න බෑ කිව්වෙ ඒකයි. ඒකයි කිව්වෙ හිතල කාටවත් නිවන් දකින්න බෑ කියල. මේක ඒ කියන්නෙ අභ්‍යන්තරයට දැනෙන ඥානේ තමයි ඇත්තටම, ඒ සිහිය තමන්ටම දැනෙනව අභ්‍යන්තරයට, ඒ තමන්ගේ ආත්මීය ස්වභාවය, දැනෙන ස්වභාවය, තමන් ඉන්න බව, ජීවත් වෙන බව, මේ ඔක්කොම අර කම්පන ස්වභාවයන් එක්ක දැනෙනව. අවබෝධය තුළ, අර මේකෙ සත්‍ය දකිනකොට මෙනෙහි කරනකොට ඒක දියවෙනව. හරියට නිකං අර ඇසිඩ් ටිකක් වැටිල අර මොනවද දියවෙලා යන්නෙ, අන්න ඒ වගේ. අර වර්ණය දියවෙලා යන්නෙ වතුරටම අර දියවෙන ඒව දැම්මෙ දියවෙලා යන්නෙ, අන්න ඒවාගේ තමයි මේ ආත්මීය එකක් කොහෙවත් නෑ. කතාවෙ ඒක හැදිල තියෙන්නෙ ආරෝපනයෙන්. මේක වේගයෙන් ස්පාක් වෙනව කියල වේගයක් තුළ දැන්. ඒ වේගෙට ආපු ස්පාක් එක

තමයි ලයිට්චලිය වගෙ ආලෝකෙ, ආලෝකය තමයි අපි ආත්මීයව මම ඉන්නව කියල දැනෙන එක.

දැන් ඒ උනාට ෂෝට් එකක් තියෙන්නෙ. ස්පාක් ගොඩක් වෙන්නෙ. නමුත් ආරෝපණයක් තියෙනව. මෙන්න මේවගෙ අපේ ආරෝපනය වෙන එක තමයි, ආත්මීයව මම ඉන්නව, මේ මම ඉන්නව, මට දැනෙනව. මම හිතන්නෙ මේ මට පේන්නෙ. මේ මට ඇහෙන්නෙ. දැන් මම ඉන්නෙ කොහෙද ? **දැන් හිත තියෙන්නෙ ශක්තියක් ඇතුලෙ නම්, මේ සේරම ස්පාක් වෙන්නෙ ශක්තියක් ඇතුලේ නම් තරංගයක් ඇතුලෙ නම්, ඒකයි අපි කිව්වෙ බල්ලගෙ ඇඟ ඇතුලෙත්, බල්ලනෑ කියල. එහෙනම් තිරිසන් ලොකෙ කොහෙද තියෙන්නෙ කියල. ඒකයි මෙතනට දෙයියෙක් ආවත්, දෙයියගෙ ඇඟ ඇතුලෙ දෙයියනෑ කියල කියන්නෙ. දැන් එතකොට මේ ඔක්කොම කතා ටික තේරෙනව. දැන් මගේම ඇඟ ඇතුලෙ මම නැත්නම්, ඒකත් ස්පාක් එකක්නම්, ඒකත් ආරෝපනයක් නම්, මේ ඔක්කොම බොරුවක් වෙනව. දැන් මම කොහෙද ඉන්නෙ. දැන් මම කියල කෙනෙක් භෞතිකව අල්ලන්න පුළුවන්ද? දැන් ඔය හිත නැති නිසා නේද කය වලලන්නෙ.** එහෙනම් තියාගන්න එපෑ, මම කියනම්. මම කයනෙ, එහෙනම් කය තියාගන්න එපායැ. හිතනෙ මැරී මැරී උපදින්නෙ. දැන් කයට කාගෙ හරි හිතක් දාලා ගන්න පුළුවන්නෙ. එහෙම කරන්න බෑ. මේක මැෂින් එකක්. මේ මැෂින් එක කර්මාන්ත ශාලාවක මැෂින් එක හදන්නෙ, කර්මාන්ත ශාලාවේ විකුනන් නෑනෙ. කර්මාන්ත ශාලාවෙ හදන දේනෙ විකුනන්නෙ. මෙන්න මේවගේ තමයි, අපිට හිත නැත්නම් මේ කර්මාන්ත ශාලාවෙන් වැඩක් නැ. අපිට මේ ශරීර කූඩුවෙන් වැඩක් නෑ. ඒකයි මෘත කලාබරේ කියන්නෙ. ඒ මැෂින් එකෙන් හදන එක තමයි මම. ඒ ආත්ම ආරෝපනේ. මේකෙන් හදනව දැන් කරන්ට් එකක්.

දැන් අපි කරන්ට් එක හදනවනේ ජල විදුලිබලාගාරේ චුම්භකයක් දාලා, වතුර දාලා කරකවනවනෙ. හැබැයි ඒකෙන් ගන්න කරන්ට් එක වගේනේ, මේ මම කියල අරන් තියෙන ආත්මෙ. ඒකනෙ බයිසිකල් ඩයිනමෝවෙ උපමාව. හැම මොහොතෙම ස්පාක් වෙනව. රෝදෙ කැරකෙනව, ස්පාක් එක නිසා තියනව වගේ. බාහිර තියෙනව කියල හිතන එකම තමයි, ස්පාක් එක බාහිර ආරෝපනය වෙන්නෙ අර වේගය තුළ තියනව කියන දැනීම. ස්පාක් වගේ වේගය තුළ අපි **තව විදියකින් ඒක කිව්ව. ස්පාක් වෙන වේගය තුළ මි.වො. 5ක කරන්ට් එකක් උපදිනව**

**කියල. ඒ ස්පාක් එක තමයි තියනව වගේ 'සමුදය'. හැම තිස්සෙම ස්පාක් එක අළුත් වෙනව. තියනව තියනව කියල කැරකෙනව. සමුදය සමුදය සමුදය කියන්නෙ, අළුතින් අළුතින් අළුතින් තියනව කියන එක, අර 'පෝනෝභවිකා' එක.** ඒක වෙනස් වෙන්න ඕන. දැන් දවල් කාපු එක රෑට කන්න බෑ. හෙට කන්නබෑ එකම දේ කන්නබෑ. ඒක වෙනස් වෙන්න ඕන. ඒක තමයි ආත්මය කියන්නෙ. අඳින ඇඳුම වෙනස් වෙන්න ඕන. **හැම එකම වෙනස් වෙන එක තමයි, ජීවත් වෙනව කියන්නෙ.** ඒ කියන්නෙ වෙනස් වෙන්න ඕන. ඉර පායන්න ඕන. බහින්න ඕන. අර වේගයක් තුළ ස්පාක් එක තමයි ෂෝට් එක තමයි ඒක විපරිනාම වෙන එක තමයි අපිට පන දෙන්නෙ. දැන් දැනීම, ජීවයක් දෙන්නෙ. දැන් දැනීමක් තියනවනේ, මේකෙ තියනවනෙ තණ්හා මාන දිට්ඨි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** තණ්හා මාන දිට්ඨි කියන්නෙ මම, මගේ, මගේ ආත්ම කියන එකනෙ. එතකොට දෙයක් තියනවනම්, දෙයක් තියනව වගේ දැනෙන එකනෙ මම කියන්නෙ. මම කියන්නෙ, මගේ කියන්නෙ එකම දේනෙ. **දෙයක් කියල දකින එකම තමයි අර දෘෂ්ටිය තුළින්ම දැකපු අර කණ්ණාඩියෙ දැකපු රූපෙ. මම මම මම හැබැයි මේක හොඳට වෙන් වෙන්නෙ මේක ශක්තියක් කියල දැක්කහම. එතකොට මේ අතේ මම ඉන්නවද? කකුලෙ මම ඉන්නවද? මේ කොහෙවත් නෑ.** එහෙනම් කොහෙද ඉන්නෙ. අර අර ස්පාක් එකේ දෘෂ්ඨියෙ, දෘෂ්ටිය කොහෙද තියෙන්නෙ. අර කණ්ණාඩියෙන් දැක්ක රූපෙ, හිතාගෙන ඉන්නව මම කියල. හිතාගෙන ඉන්න එකක්. දැන් හිතාගෙන ඉන්න එක ආරෝපනය ඇතුලෙ තියෙන්නෙ. ආරෝපණය ඇතුලේ වේගය තුළ තියෙන්නෙ. ඒක මේ භෞතික ශරීරෙ කෙහෙවත් නෑ. ඒකයි මේක වේගෙ ඇතුලේ, ස්පාක් වෙවී තියෙනව. මම ඉන්නව හැම තිස්සෙම ස්පාක් වෙවී කැරකි කැරකී. මගේ ඇඟ ඇතුලේ කොහෙවත් කියන්න බෑ. අර සිරස අල්ලනව වගේ තරංග වගේ ශක්ති සකස් වෙවී තියනව. **අර ගිනි බෝලෙ කරකවන කොට ගිනි වලල්ලක් පේනව වගේ මේක ඇඟ ඇතුලෙම කැරකිල කැරකිල කැරකිල ඇතුලෙම මාණික්‍යයක් වගෙ දිලිසෙන ආත්මීය මමෙයි කියන එක ඇවිල්ල. ඒක ස්පාක් ගොඩක් විතරයි. ඔය එය සිතුවිලි ගොඩේ තියෙන්නෙ. ස්පාක් එකේ තියෙන්නෙ.**

'රූපංතිකෝ ආවුසෝ රූපං' කීවෙ ඒකයි. රුප්පනය කියන්නේ කැරකෙන එක. "රුප්පංතිකෝ ආවුසෝ රූපං" ඒකයි. 'රූපත්තාය සංකතං අභිසංකරෝති' කියල කීවේ, ඇඟ ඇතුළේ කොහේවත් මමෙක් නෑ, කයේ කොහෙවත් නෑ. අර සිතුවිලිම ආයෙ කැරකිල කැරකිල වේගය තුළ ස්පාක් එකේ ආරෝපනය, කරන්ට් එකේ තමයි ඉන්නෙ. තන්ඩර් තන්ඩර් තන්ඩරිං වගෙ ඒ කියන්නෙ අර විදුලි කොටන්නෙ. අර විදුලි කොටන කොට එනවනෙ එළියක්. ඒක කොහෙවත් තියන එකක් නෙවෙයිනෙ. අන්න ඒ වගෙ තන්ඩරිං ආලෝකයක් වගෙ තමයි මේක දැන් කම්පනය වෙනව. කොහෙහරි වැදුනොත් ෂෝට් වෙනව. මට ගැහුවෙ. මට බැන්නෙ. අන්න ඒ වගේ. මගෙ ඇඳුම, මගෙ ගෙදර, අර අර තන්ඩරිං එක ඇතුලෙ ඉන්නෙ. අර 'ලයිටින්' එක එන්නෙ. විදුලි කොටලා වහින කොට අර එළියක් එන්නෙ. ඒක කොහෙද තියෙන්නෙ. ඒක තියන තැනක් නෑ. ඒකම කැරකි කැරකි තිබ්බොත් මොකද වෙන්නෙ.

**උපාසිකාව :** අකුණු ගහනව වගේ පේනව.

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ ආලෝකයක් බෝලයක් වගේ ආත්මීය එකක් දැන් තියෙනව. **තමන්ගාවම තියෙනව ආරෝපනයක්. ඒ ආරෝපනය තමයි අපි මේ කියන්නෙ ආත්මීයව දැනෙන ආරෝපනය කියල. ඒ ආරෝපනය තමයි අපි කියන්නෙ අර භාවනා කරන කොට හෙම, අර සත්තුන්ට හෙම දැනෙන්නෙ අපේ තියන අර ඕරා එක කියන්නෙ. ඒකම තමයි ඒ. ඒක තමයි ක්ෂේත්‍ර ගියාම ඒක අළුපාට වෙනව. හිත නිවෙන කොට සුදුපාට වෙනව.** ඒ ඕරා එක තමයි ආත්මය මම කියන්නෙ. ඒක තමයි මි.වො. 5 අර ඒක කෙනාට කෙනාට වෙනස් වෙනව අර හමේ තියන තෙල්ගතිය වගෙ ස්වභාවයත් එක්කල සුකුම ස්වභාවයක් එක්කල, ඒක අර තණ්හාවෙ ස්වභාවයත් එක්ක තමයි සිත එන්නෙ. තණ්හාවෙ ස්වභාවය වැඩි වෙනකොට වෙන කොට තමයි ආලෝකය වැඩිවෙන්නෙ. ඒක අනිත් පැත්තට යනකොට දියවී ගෙන තමයි අර නිරෝධ සමාපත්තියට සමවදින කොට තමයි අර ආරෝපනය කාටවත් පේන්නෑ. ඒකයි ඕරා එක  පේන්නෑ.

මේක දැන් සිතුවිලි. මේක දැන් තනිකරම මේක තේරුම් ගත්තට පස්සෙ මේකෙ සත්ව පුද්ගල කතාවක් කොහෙවත්ම දැනෙන් නැතිවෙනව. ඊට පස්සෙ මොකක්ද පේන්නෙ. එහෙම එකක් නෑ. ඊට පස්සේ මොකක්ද

වෙන්නෙ. ඒවත් එක්ක ගනුදෙනු වටිනාකම් ඒව මේව නෑ. මේකෙ ඇත්ත පේනවනෙ. **මෙතන කෙනෙක් නැහැනෙ. මට ගැහුවයි කියල කතාවකුත් නෑ. මට බැන්නයි කියල කතාවකුත් නෑ. ඇඟේ කෑල්ලක් ගියත් අවුලක් නෑ. ඇයි ඒ ඇඟ මගේ නෙවේ. මම කෝ. මම කියන්නෙ ඇඟේ කෑලි ටික සේරම නැතත් හිත තියනව. සිතක් කියල දෙයක් නැති බව අවබෝධ වෙනකොට මමෙයි කියල කෙනෙක් නැති වෙනකොට ඇත්තටම පුදුමාකාර ශාන්ත සුවයක් දැනෙනව.** මුලින් මොකක් හරි වැඩක් කරන කොටත් හදල දෙන්නෙ. මනසිකාර කර දෙනව කියන්නේ හදල දෙන්නෙ. සිතුවිලි හදල දෙනව ඕන නම් අනිත් අයට ආ.. එහෙම කරන්න. මෙහෙම කරන්න කියල හදල දෙනව. ඒක ඇතුලේ එයා නෑ. එයා මාරුවෙලා ඉවරවෙලා මොකක් හරි වැඩක්. ඒක ගණන් ගන්නෙවත් නෑ. සමහර වෙලාවට දීපු එක්කෙනා පිච්චි පිච්චි දඟලනවා.

**උපාසිකාව :** හරි ආර්යයන් වහන්ස එතකොට අපිට කිසිම ගැටීමක් නැතිව ඉන්න පුළුවන්

**ආර්යයන් වහන්සේ :** ගැටීමක් එන්නෙ කොහොමද? තමන් කොහෙද ඉන්නෙ. ආත්මයක් කොහෙද තියෙන්නෙ. පොතක් තියනවද? දැන් මේකෙ පොත නැති වෙන එකමයි මම නැති වෙන්නෙ. දැන් බාහිර මොකක්වත්ම දෙයක් දැනෙන්නෙ නෑ කියන්නෙ සිතුවිලි නැති වෙනව. ෂොට් ටික නැති වෙනව. ෂොට් ටික නැතිවෙනව කියන්නෙ බාහිර තියනව කිව්වොත් අපේ හිතමනෙ. එතකොට හිතින් බාහිර මොකුත් තියනව කියන්නෙ නෑ ඊට පස්සෙ. ඒ කියන්නෙ බාහිර නැතිවෙනව කියන එක. බාහිර නැතිවෙනව කියන්නෙ තමනුත් නැති වෙනව. ඒකයි කියන්නෙ කණ්ණාඩියෙ වැටෙන්න දෙයක් නැත්නම් ප්‍රතිබිම්බය නෑ කියල. මේ බිම්භය තමන් හැදුවෙත් නෑ. වෙන අයෙක් හැදුවෙත් නෑ. 'නයිදං අත්තකථං බිම්බං නයිදං පර කථං අගං හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජති' දැන් හරි නේද? දැන් ඔක්කොම ගලපල බලන්න. ඔය කන්සෙට් එකට දාල ගලපල බලන්න. හැම එකම ගලපාගත හැකි. ඔය හැම එකම ගලපන්න හැකි ඊට පස්සෙ ඔය හැම ධර්ම පර්යායක් ම ඕක ඇතුලේ. **සබ්බේ සංඛාරා අනිච්චා. සියලු සිතුවිලි අනිත්‍යයි. යදා පඥ්ඥාය පස්සති. යථාභූතව හැදෙන හැටි දැක්කොත්, 'අතිනිබ්බන්ති දුක්ඛේ' සියලු දුකින් මිදෙනව. 'අනිච්චාවත සංඛාරා' සියලු සිතුවිලි අනිත්‍යයි. 'උප්පාද වය ධම්මිනෝ'**

**ඇතිවෙන නැතිවෙන ධර්මතාවයක් ඇතුලෙයි තියෙන්නෙ. 'උප්පජ්ජිත්වා නිරුජ්ජන්ති' ඇතිවෙන නැතිවෙන බව දැක්කොත් 'ඒතං වූපසමෝසුඛෝ' එකම කතාවනෙ යන්නෙ.** "ඒතං ශාන්තං ඒතං ප්‍රනීතං යදිදං සබ්බසංඛාර සමතෝ" සියලු සිතුවිලි සමනය වන තැන මහා ශාන්ත සුවයයි.

'ඒතං ශාන්තං, ඒතං ප්‍රනීතං සබ්බ සංඛාර සමතෝ' සබ්බ සංඛාර කියන්නේ මේ සිතුවිලි සමනය වන තැන ප්‍රනීත සුවය එනව. අන්න සම්භූපදි පටිනිස්සග්ගෝ එකතු වෙලා එකතු වෙලා උපදි ගොඩ එන තැන, අන්න අත්හැරිල යනව. 'පටිනිස්සග්ගෝ' අන්න නිරෝධ වන තැන. 'විරාගෝ' 'නිරෝධෝ' 'නිබ්බාණෝ' ඒ වුනාට ඒක ටිකින් ටික ටිකින් ටික ක්‍ෂය ධම්ම, වය ධම්ම විරාගය ඒකට නිබ්බිදාව. ඒ කියන්නෙ මේ හැදිච්ච මේ ආරෝපන ගුලියටයි, නිබ්බිදාව තියෙන්නෙ. කලකිරෙනව ආරෝපන ගුලියට, බාහිර මේක මේ සම්මුතියව කියන කලකිරීම නෙවෙයි මේක. තමන්ගෙම අභ්‍යන්තරේ, තමන් ගැනම තමන්ම නැතිවෙන තැනක් තියෙන්නෙ. ඒ කියන්නෙ සිතුවිලි මායාවටයි කලකිරෙන්නෙ. ඒ කියන්නෙ කලකිරීමක් නෙවෙයි මේක සිතුවිලි මායාවෙ ආරෝපනය නැතිවෙන එකයි නිබ්බිදාව කියන්නෙ. ඒ ආරෝපනය දියවෙන එක තමයි, එතකොට ඒකෙ තියෙන අර ඇලෙන ගතිය ගම් එක ගතිය විරාගය නැතිවෙනව කියන්නෙ ඒකම තමයි. "නිබ්බිදන්ති, විරාගන්ති, නිරෝධන්ති" ඒක මිදි මිදී යනව. පටිනිස්සග්ගානුපස්සී නැවත මේ ආරෝපනය වෙනව දැනෙන් නෑ එයාට. **ආරෝපනය වෙන එක දැනෙනව නම්, අන්න ආත්මීය ස්වභාවය දැනෙන ගතිය, ආරෝපනය වන එක දැනෙන්නැත්නම්, අන්න එයාට දැනෙනව දැන් රහත් කියල.** දැන් බාහිරින් මිදෙන එකත් දැනෙනව. සෝතාපන්න එක. දැන් අනාගාමී එකත් දැනෙනව. ඒක දෙපැත්තෙන්ම මිදිල. කෙනෙකුත් නෑ කියල දැනෙනව. ඊට පස්සෙ කෙනෙකුත් නෑ. බාහිරෙත් නෑ මොකක්වත් නෑ. හැමදාම වගේ අන්තිමටම.

**උපාසිකාව :** එතකොට දැන් ආර්යයන් වහන්ස ජීවත් වෙනකොට අමාරුයි තේරුම් ගන්න.

**ආර්යයන් වහන්සේ :** දැන් හුස්ම ගියා කියල හිතන්නකො. මේ මොහොතෙ. මේ ක්‍ෂණය විතරයිනෙ. දැන් ෂොට් එකයිනෙ වැදුනෙ මේ කතාවෙ. ෂොට් එක වදින්නෙ නෑ කියල දන්නව. එච්චරයි.

**උපාසිකාව :** හරි හරි හරි ආර්යයන් වහන්ස තේරුණා.

**ආර්යයන් වහන්සේ :** දැන් මොකද වෙන්නෙ. **ෂොට් එක වදින්නෑ. දැන් හුස්ම යනව. හුස්ම කියන්නෙ කොහොමත් ඉතින් ඒක අපේ දේකුත් නෙවේ. අපිට අයිති දේකුත් නොවේ. ඒක නවතින එක නවතිනව. ඒක ස්වභාදහමනෙ. ආවෙත් සොබාදහමෙන්. ගියෙත් සොබාදහමෙන් සොබාදහම බවට පත්වුනාට පස්සේ හුස්ම තිබුනත් එකයි. නැතත් එකයි. හිටියත් එකයි. නැතත් එකයි. ඊට පස්සෙ එයා සොබාදහම කෙනෙක් නෑ. තනිකරම තමනුත් නැතිවෙලා මැරිල ඉවරයි ඔය කතාව කියනකොට. ඒකයි භයතු පට්ඨාන ඥානය කියන එක.** ඒ කියන්නෙ මේක මුල හරියෙ තියනව. 'උදයව්‍ය ඥානය' ඇතිවෙනව නැතිවෙනව දකින එක. ඊට පස්සෙ 'වයඥානය' 'භංග ඥානය' මේක භංග වෙනව දකිනව. ඊට පස්සෙ 'භයතු පට්ඨාන ඥානය' ඇඟ කිලිපොලා යනව. රෝමකූප කෙලින් වෙනව. කෙනෙක් නෑ. මුකුත් නෑ ඔක්කොම එකපාරටම දරාග න්න බැරිවෙනව. ආත්මීය ස්වභාවය බාහිර කියල ඒ ආරෝපනය වුන ස්වභාවය අර ඕරා එක දියවෙන්න ගන්නව. අනිත් පැත්ත හැරෙන්න ගන්නව. පටිසෝතයට එනව. චිත්ත කම්පන ගොඩකට ලක්වෙනව ඔය හරියෙදි. ඊට පස්සෙ තමයි එන්නෙ 'මුඤ්චිතු කම්‍යතා ඥානය' මේව වැඩක් නෑනෙ. 'ආදිනවානුපස්සනාව ඥානය' දකිනව ආදීනව. ඥානෙට හසුවෙන්නෙ ඔක්කොම. ඥාන ඥාන කිය කිය යනව. ඒ කියන්නෙ පටිසංඛාර. සැක සංකා මොකවත් එන්නෙ නෑ. ඊට පස්සෙ 'සංඛාර උපේක්ෂා ඥානය' එතනත් තියෙන්නෙ 'සංඛාර උපේක්ෂා ඥානය' ඒ කියන්නෙ සියලු සිතිවිලි සමනය වුනු බව දැනෙන ඥානය. දස ඥාන කියන්නෙ ඔතනයි. සංයෝජන, ධර්ම ගන්නෙත් එහෙමයි. අවිජ්ජා, අවිජ්ජා කියන්නෙ නොදන්න කම.

**උපාසිකාව :** ඒක තමයි ආර්යයන් වහන්ස ඇත්තටම මම පිළිගන්න ඕන අර භයසිය ගාන බැලුවෙ නෑ කියන එක නමුත් දැන්නම් මට ගොඩක් පැහැදිලිය මේක තුළ මං කොහොමද ඉස්සරහට යන්න ඕන කියල.

**ආර්යයන් වහන්සේ :** මොකක්ද කිව්වෙ. ඉස්සරහට යන්න ඕන.

**උපාසිකාව :** ඉස්සරහට යන්න නෙවෙයි. මේක මට ග්‍රහනය කරගන්න ඕන කියල ඉස්සරහට යනව කියල කියන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඔය ඔය හැම තැනම ආත්මීය ගතියක් දැනෙනව. ආරෝපනය තාම ඉතින් කොහොමත් තියනවනෙ. තාම

ඉතින් රහත්වෙලා නැහැනෙ. ඔබ තුමිය ඒක දකින්න. ආරෝපනය වෙන හැටි.

**උපාසිකාව :** ඒක තමයි, කිව්වෙ ඒකමයි. වාඩිවෙලා ආරෝපනය වෙන හැටි දකින්න.

**ආර්යයන් වහන්සේ :** ඔතන දැන්මෙන්න මෙහෙම දෙයක් තියනව. ඔය දැන් සත්‍ය ඥානයනෙ කිව්වෙ. එතකොට කෘත්‍ය ඥානය පැත්තෙදි මෙන්න මෙහෙම දෙයක් තියනව. ඔය හිත් 2ක් අතරෙ හිදැස කිව්ව නේ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඔය කතාවෙ වැරැද්දක් නෑ. ඕක පොතේ ලියන්න පුළුවන් ඔහොමයි. හැබැයි ප්‍රායෝගික පැත්ත අතිශයින් වෙනස්. අතිශයින් වෙනස් කියන්න හේතුව, මේ ආරෝපනය නැතිවෙන තැන හිඩසයි. ඒකට හේතුව මෙන්න මේකයි. අර ෂොට් එකක් එකක් එකක් ගානෙ වදින කොට ඒ එකක් එකක් ගානෙ හිඩසක් තියනව කියල ගත්තොත් හිඩස් ටික කැරකෙනව. හිඩස් ටික කැරකිල ආරෝපනය නොවෙයි, හිඩස් ටිකයි කැරකෙන්නෙ. හිඩස් ටික කැරකුනු තැනට පත්වෙන එක තමයි මොහොතට අවදිය කියන්නෙ. එතකොට දැන් කැරකෙන්නෙ ආරෝපනය නෙවෙයි, හිඩස් ටික. හිඩස් ටික කැරකෙන එකට අවදි වෙලා ඉන්න එක තමයි අර සිතුවිලි කැරකෙනව, රූප වැදි වැදි කැරකෙනව. හැබැයි එතන හැම තිස්සෙම සිතුවිලිවලට හිඩසක් තිබුනනෙ. ඒ සිතුවිලි ටික කැරකෙන එකට අවධි වෙනවා එයා. එයා ඊට පස්සෙ සිහිය තුළයි ඉන්නෙ. ඒකයි සිහියට අවධි වෙනව කියන්නෙ. ඒකයි සිතක්, සිතක් ඇති වුන බවට දැනෙන්නෙ ඥානෙටයි කිව්වෙ. සිතක් හටගන්න බවට දැනෙන්නෙ ඥානෙටයි කිව්වේ. ඒක පොත කියල දෙයක් නොවන බව සිතෙන්නෙ ඥානෙටයි කිව්වෙ. හැබැයි තාමත් පොත නැතිවෙලා නැති බව දැනෙන්නෙ ඥානෙටයි කිව්වෙ. ඔන්න ඔය ඥානෙට අවධි වෙනව. ඔය ඥානෙට අවදි වෙන කොට, අර ආරෝපනය නෑ, ඥානෙ අර ආත්මීය ආරෝපනය ඥානෙ නෑ. සිතුවිලිවල ආරෝපනය, ඥානෙ නෑ. සිතුවිලිවල පලක් නැතිවෙනව. සිත සාමාන්‍ය විදියට හැසුරුනාට, ඒකෙ කෙනා නෑ. මෙයා ඉන්නෙ මෙතන හිඩසෙ. හිඩසට සිහිය පවත්වනව. ඒ හිඩසට සිහිය පවත්වනව කියන්නේ, ඉන්නෙ අර ආරෝපනයෙ නෙවෙයි. ඒ කියන්නෙ උපමාවක් විදියට පොත කියල දෙයක් නෑ කියන කොට දැන්

මේ මෙතන ප්‍රායෝගිකව අතිශය ගැඹුරු, ඒ කියන්නෙ මේක කාටවත් කීවට වැඩක් නෑ දැනෙන්නම ඕන.

ප්‍රත්‍යක්ෂතාවය තුළ දර්ශනයට පත්වෙන්නෙ මෙන්න මෙහෙමයි. වෙනදා විදියටම වැඩ කරනව. වෙනදා විදියටම කනව බොනව. සේරම තියනව, හැබැයි ඒ එකකවත් එයා නෑ. එයා ඔක්කොම ටී.වී. එක බලන් ඉන්නව වගේ, වෙනස් ස්වභාවයක් එනව. **එයා, එයාගෙ දිහාම බලන් ඉන්නව එයාගෙ චිත්‍රපටි. ඒක පුදුමාකාර අවදියක්.** ඒක ගැන කියන්න ගියොත් ඒකට කෙනෙක් අත් දකින්නම ඕනි. **මැරෙන සිතෙත් එයා නෑ. අන්තිමට එයා කොහෙවත් නෑ. අන්තිමට එයා සොබා දහමේ.** එයා තමයි ගොඩක් වෙලාවට ඔය ඉන්නෙ තණ පිඩැලි උඩ. වැතිරිලා එයා ඉන්නෙ එයාගෙ එකකවත් නෑ. හරයක් සමහර විට සුලඟ වගේ. සමහර විට සුළඟ ඔක්කොම වෙනස්ම විදියකට දැනෙන්න ගන්නව. ඒ දැනෙන්නෙ අර විදවන විදිය නෙවෙයි. දැන් ඇස් දෙක පිනවන කාමේසුච්ඡ්‍යය කියන පැත්තෙ නෑ. එයා ආයතන පිනවන ඒ කියන්නෙ එන අරමුණු එක්ක එයාගෙ කතාවක් නෑ. එයා ඉන්නෙ වෙනස්ම අවධිමත් ස්වභාවයක. ඒකයි ලොව්තුරු සුවය. ඒක තියෙන්නෙ මොහොතට අවධිය තුළ. නාම රූප තියනකං ඒක නෑ. නාම රූප සියල්ල මිදුණු තැන ආර්‍යය භූමිය. ඒ ආර්‍යය. ඔය ආර්යයන් වහන්සේ කියන වචනෙ ඉතිහාසෙ එක එක තැන්වල තියෙනවා. නමුත් මේ භාවිතා කරන්නේ බුදුන් වහන්සෙ මේ වචනෙ මෙතනට භාවිතා කරනව. මේ ආර්යය භූමිය කියල මේ වචනෙ මෙතෙන්ට පාවිච්චි කරනව විතරයි. වචන එකක්වත් ඇත්ත නෙවෙයි. වචන සේරම ලෞකිකයි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** නමුත් මේ ස්වභාවය පෙන්නන්න පුළුවන් මේ වචන භාවිතා කරල. පෙන්නනව විතරයි. මේ ස්වභාවය තුළ කෙනෙක් නෑ. තමන් ඉදිද්දිම තමන් මැරිල. සළායතන නිරෝධෝ නිබ්බාණෝ. ආයතනවලින් මිදිල. අන්න භව නිරෝධෝ නිබ්බාණෝ. බාහිර දෙයක් කියල ගත්තෙ නෑ. එතනින් මිදිලම ගිහිල්ල. දැන් අරහත්වයට පත් වෙලා. ඉතිං නැවත උපතක් නෑ. 'නහිජාතු ගබ්භ සෙය්‍යං පුනරේ තීති. ඒකයි දිට්ඨිංච අනුපගම්භ සීලවා' සම්මා දිට්ඨිය මෙන්න මෙතෙන්ට එන එක. දර්ශනයට පත්වෙන එක. දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන

සම්පන්නෝ කාමේසු විනෙය්‍ය දැන් එයා කම්සැප ඒව මේවා කතාවක් නෑ එයාට. ආයතන පස්සෙ දුවන්නෑ. ආයතනවල කතාවත් ඉවරයි. 'කාමේසුවිනෙය්‍යය ගේධං නහිජාතු ගබ්බ සෙය්‍යං පුනරේතීතී' කොහෙද දැන් එයාට ඉපදෙන්නෙ? ඔක්කොම බොරු කියල දන්නකොට කොහෙද එයාට හිතක් පහල වෙනවද?

**උපාසිකාව :** නෑ

**ආර්යයන් වහන්සේ :** ඔක්කොම බොරු සද්ද ටිකක් විතරයි. ඔක්කොම බොරු. දිව්‍ය ලෝකද? නිරද ඔය ස්වභාවය. ඔය ධර්මය තුළ, ඔය ස්වභාවය තුළ ඔක්කොම බොරු වෙනව. ඒකයි න පඨවි න ආපෝ, න තේජෝ, න වායෝ, න විඤ්ඤාණානංචායතන, න ආකිඤ්ඤායතන, න ආකාශඤ්ඤායතන 'නායං ලෝකෝ' වෙලවක් නෑ න පරලෝකෝ පරලොවක්නෑ, න ලෝකයක් 'න උභෝ චන්දිම සුරියෝ' සඳ හිරු කියල දෙයක් නෑ. න ගතිං වදාමි. න ගතිං න චුතිං න උප්පත්තිං, න අපටිත්තං න අපවත්තං, න අනාරම්මනං ආරම්මණයක් වත් නෑ. **මෙලොවක්නෑ පරලොවක්නෑ ඒමක් නෑ යාමක් නෑ, චුතියක්නෑ. උප්පත්තියක්නෑ, ඔය කියන ලෞකික භූමිය තුළ පෘතග්ජන භූමිය තුළ කියන සේරම බොරු වෙනව. ඒකයි බුදුන් වහන්සෙ ඔය සම්බෝධි සුත්‍රවල කියන්නෙ, මරුන්, බඹුන්, දෙවියන්, මිනිසුන් සහිත භූමියට මම සම්මා සම්බුද්ධත්වයට පත්උනා කියන්නෙනෑ ඕකෙන් මිදුනෙ නැත්තං කියල. ඔක්කොම ඉන්නෙ හිරවෙලා ඒක කියන්නෙ නොකියා.**

මේ ඔක්කොම මිනිස්සු දාගත්ත ශබ්ද ටිකක්. එහෙම දේවල් ලෝකෙ කෙහෙවත් නෑ. මනුස්ස ලෝකය, **මනුස්ස ලෝකය කියල දෙයක් කොහෙද තියෙන්නෙ. එහෙම දෙයක්නෑ. දැන් අනිත් ලෝක තියනවද? එහෙම දේවලුත් නෑනෙ. දැන් ඕව තියනව කියල හිතන එකෙන් මොකද වෙන්නෙ. ආරෝපනයක් එනව. ආරෝපනය තුළ අර තරංගය වගේ අර** තලවල සකස් වෙන්න හේතු වෙනව. මෙතන තියනව සසර කතාවක්. දෘෂ්ඨිය තුළයි තියෙන්නෙ. අවිද්‍යාව තුළයි තියෙන්නෙ. ලෝකෙ තියනව කියල හිතන නිසයි තියෙන්නෙ. මේ ධර්මය අබමල් රේණුවක් වත් අඩුවැඩි කරන්න බෑ කාටවත්. **මේ පැහැදිලි කරන පැහැදිලි කිරීම ඉතාම නිර්මලයි. පාරිශුද්ධයි. 'බුද්ධ' වචනෙමයි.**

**උපාසිකාව :** සාදූ සාදූ සාදූ

**ආර්යයන් වහන්සේ :** අපිට ඒක සක්සුදක්සේ පැහැදිලයි. ඒක කියන්න අවශ්‍යතාවයක් නෑ. කෙනෙක් පුද්ගලයෙක් කියනව නෙවෙයි. මේක මේ ස්වභාවය, ස්වභාවය විසින් දේශනා කරනව. ඒ ස්වභාවයට, ස්වභාවය දේශනා කරන්න පුළුවන් මහා ගාම්භීර විදියට  සමහර විට ඒ ශබ්දත් ඇහෙනව. අපෙත් මේ ශරීර කූඩුව සමහර විට මේ ස්වරාල මේ විදියට භාවිතා වෙනව විතරයි.

**උපාසිකාව :** සාදු සාදු සාදු

**ආර්යයන් වහන්සේ :** ඒක ශූන්‍යතාවය. ඒ අනිමිත්තයි නිමිති නෑ. අප්‍රනීතයි. එහෙම දේවල් ආත්ම කතාවක් කොහෙවත්නෑ. ශූන්‍යයයි. මේක අනාත්ම ධර්මයක්. ඒක පෙන්නන් තමයි බුදුන් වහන්සේ කියන්නෙ චක්ඛුං නිච්චතෝ, චක්ඛුං කියන්නේ පොතමයි. ඇස කියන්නෙ පේන බව. මස් ඇහැ නෙවෙයි. එහෙනම් පේන බව කියන්නෙ පොතමයි. උපමාව චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ. 'අනිච්චං භන්තේ'. ඒ කියන්නේ පොත කියල දෙයක්නෑ. ඊට පස්සෙ කියන්නෙ ඇස අනිත්‍ය නම් මහනෙනි, එය දුකද? සැප ද? 'දුක්ඛං භන්තේ' පොත කියන්නෙ පොත තියෙනව. පොත කියන කොටම අගයක් තියනව. අගයයි විදීම දුක කියන්නෙ, අගයක් තියනව නම්, ඒක 'සුඛ දුක්ඛං දුක දුක්ඛං.' දුකමයි උපදින්නෙ. දුකමයි පවතින්නේ දුකමයි නිරුද්ධ වෙන්නෙ කියන්නෙ, අගයක් ඇතිවෙනව. පොත කියන්නේ දෙයක්. දෙයක් නම් අගයක් ඒකමයි දුක. ඇස අනිත්‍ය නම් මහණෙනි, දුක නම් ආත්ම වශයෙන් ගත හැකිද? 'නෝ හේතං භන්තේ.' ඕකයි කියන්න ඕන වෙන්නෙ. මේක අනාත්ම ධර්මයක්. බාහිර පොත, මේසේ, ඇඳ කියල දෙයක් නැති බවයි අනාත්ම කියන්නෙ. මේ ශරීරය අනාත්ම කියන එකක් නොවෙයි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** බාහිර දෙයක් නැති බවයි අනාත්ම ධර්මය. ඒකයි රූපං නිච්චතෝ අනිච්චතෝ කියල ඇහුවෙත්, ඒකමයි. අනිච්චං භන්තේ. රූපය කියන්නෙ දෙයක් නැතිබව. සමහරවෙලාවට අපිට එනව කතා කරන්න. කතා කලහම ඔක්කොම කුඩුවෙලා. මේ වෙනකම් කතාකරපු හැමෝම කුඩුවෙලා තියෙන්නෙ, කවුරුවත් මේ පොත් බලල පොත හොයනව. පස්සෙ කියනව ආර්යයන් වහන්ස මෙකේ බැටිරි බැහැල කතා කරන්න විදියක් නෑ. පස්සෙ කතා කරන්නම් කියල. මෙයාව

නලියනව. එයාට නවත්ත ගන්න බැරුව. ඊට පස්සෙ බලන කොට එයාට උත්තර දීගන්නබෑ. එයා පොත බලන්න තමයි ට්‍රයි කරන්නෙ. අපිට හොඳට තේරෙනව. පොත කියන්නෙ කියල. පොත් ටික සේරම කියවල ඊට පස්සෙ කතා කරන්නෙ කියල. අපි කියනව ඕවා පොත්වල නම් හොයන්න හම්බවෙන්නෙනෑ කියල.

**උපාසිකාව :** නෑ නෑ නෑ ආර්යයන් වහන්ස අපිට දැන් මේ පුංචි කාලෙ ඉදං මේ උගන්නල ඒ එක එක විදිහ තමයි. බලනකොට ඉතිං ඇත්තටම ඔක්කොම බොරු.

**ආර්යයන් වහන්සේ :** ඔක්කොම බොරු වෙනව. අපි කිව්වෙ නිකං නෙවෙයි. අපි කිව්වෙ ඒක තමයි ඔය ශබ්දයයි වර්ණයයි හරියට, මොන්ටිසෝරියේදි රවට්ටන එකනෙ කරන්නෙ. ඕකට රැවටුනොත්නෙ ලකුණු දෙන්නෙ. රැවටුනෙ නැත්නම් ටොක්ක අනිනවනෙ.මොන්ටිසෝරියෙ පුංචි දරුවට ඒ ප්‍රඥාවන්තයටයි ටොක්ක අනින්නෙ.

**උපාසිකාව :** ඒක තමයි. ඒක තමයි. දැන් තමයි ඒක හොඳට වැටහෙන්නෙ.

**ආර්යයන් වහන්සේ :** මේ රැවටීමයි තියෙන්න. ඔය දැන් මොනව හරි කියනවනෙ පට්ටමක් ගැන. ඒ හොඳටම රැවටුනා කියනඑක.

**උපාසිකාව :** ඔව් ඒක තේරෙනව.

**ආර්යයන් වහන්සේ :** මම තමයි මේ ලෝකෙ හොඳටම රැවටිලා හොඳටම ඉන්නෙ. අර උන්මන්තකයෝ වගේ ඉන්නෙ කියල, බුදුන් වහන්සෙ පෘතග්ජන උන්මත්තක කියන්නෙ ඒකයි. එයා යන්නෙ සසරට. එයා තමයි සසරෙ දුගතියට වැටෙන්නෙ. එයා තමයි භව කතරෙ යන එක්කෙනා. බුදුන් වහන්සෙ ඔය සංස්කෘත භාෂාවෙද කොහෙද නිර්මාතෘ කියල 'පානි' කියල, ධර්මයේ ඕක තියනව. ඔය 'පානි' ඉපදුනයි කියනව අංගවිකල වෙලා, මන්දබුද්ධික වෙලා. බුදුන් වහන්සේ වඩිනකොට සංඝයා වහන්සේලත් එක්ක මන්දබුද්ධික දරුවෙක් දැකල සිනා පහළ කලයි කියල. ඊට පස්සෙ ආනන්ද හාමුදුරුවො අහනවනෙ ස්වාමීනි, සිනහපහල කරන්න කාරණාව කිම. පේනවද ආනන්ද මේ කවුද කියල. මේ තමයි මේ සංස්කෘත භාෂාව තමයි අපිට දන්න විදියට ඒ භාෂාව එතකොට ඒ කාලෙ තිබුන භාෂාවෙ නිර්මාතෘ ඒ 'පානි' ඒ මහා මාන්නෙකින්

මම තමයි දන්නෙ කියල උගන්නනකොට මේ වචන වැරදියි, මේක තමයි අර්ථය, අරක නිරුක්තිය මේකයි ගගා කියවනවනේ. ඔක්කොම උන්මත්තකයො වෙලා උපදින්නෙ. මන්දබුද්ධික වෙනව ඊළඟ ආත්මෙ දැම්මම ඊළඟ ආත්මෙ මන්දබුද්ධික වෙන විදියට වැඩකරනව. මහා ඝෝර සසරක්. ඒකට හේතුව සංඥාව. ඔය මාන්නෙ තුළ සකස්වෙන සංඥා ස්වභාවය අති භයානකයි. ඒකයි මානීය මක්කටෝ, අති මානීය කුක්කුරෝ කියල කියන්නෙ. මානය නිසා වඳුරෙක් වෙලා උපදිනව. තව ටිකක් මානය වැඩි උනොත් බල්ලෙක් වෙලා උපදිනව කියල. ඒකම තමයි අර 'පානී' කියන කතාවෙන් ඒකයි. මානය කියන්නෙ මේ මැනීම තමයි ඇත්තටම තන්හාවෙ උපරිම මිනුම් දණ්ඩ. ඒ කියන්නෙ අතිමානය. මම ඉන්නව කියල දැනෙනඑක. මම තමයි ලොකු කියල හිතනඑක. මගෙන් තොර කෙනෙක්නෑ කියල හිතන එක. මම තමයි ඔක්කොම. මම තමයි අරක කලේ. මම තමයි මේක කලේ මම තමයි දන්නෙ. එයා ඇවිල්ල මහා අඥාන, මෝඩ, තකතීරුවෙක්. මේ කාටවත් කියන එකක් නොවේ. ධර්මය පැහැදිලි කරනව විතරයිනෙ. ධර්මයෙ ඉතිං අඥාන කියන වචනෙ තියනවනෙ. ඒක කියන්නත් එපායැ කොතන හරි. මෝඩයෝ කියලත් තියනවනෙ. මෝහය කියලත් තියනවනෙ.

**උපාසිකාව :** ඔව්. එහෙමයි ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** තියෙන දේනෙ. ඒ හින්ද අපි දන්නෙ නෑ කොයි විදියට ගැලපෙයිද කියල.

**උපාසිකාව :** ආර්යයන් වහන්සේ දැන් මට මේ දේශනාව දෙන කොට ඒක නිකං ස්වභාව ධර්මයෙන්ම එන එකක් තියනව නේද?

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි. ඒක එතන අපි **ශූන්‍යතාවය පැහැදිලි කරන කොට ඒක හොඳට තේරෙනව. ශූන්‍යතාවය පැහැදිලි කරන කොට ඇත්තටම ශූන්‍යතාවය ටියුන් වෙනව. මේ පැත්තෙන් ෆ්‍රීකොන්ස් වෙනව. ඊට පස්සෙ ඉතිං ශූන්‍යයි තමයි. ආයෙ මොකක්වත් කතාව එන්නෑ ඊට පස්සෙ. ඊට පස්සෙ ඉතිං දේශනය ඉවරකරනවනෙ. ඊට පස්සෙ තව ගන්නව කවුරු හරි එනකොට මේ පැත්තෙ තියෙන්නෙ ශූන්‍යතාවය සමහර විට කතාකරන කෙනාට ඒක ගැලපෙන්නෙනෑ. එතකොට අපි කෙලින්ම වෙලාවක් දෙනව, මොකද දැන් මේ පැත්තෙන් මේක දැන් ටියුන් වෙලා තියෙන්නෙ. සමාධි වගේ ස්වභාවයක් එනව.**

අනිමිත්ත අප්‍රනිත ශූන්‍යත ඔතන තියෙනව සමාධි ස්වභාවයක්. ඔය දේශනා කරන කොට දේශනා ශෛලිය තුළම ඒක එනව. ඒ ශූන්‍යතා සමාධියක් උපදිනව. ශූන්‍යතා සමාධිය තුළ මොකක් හරි ඊට පස්සෙ දැන් ගත්තත් ඒ ස්වභාවය තමයි ඉස්මතු වෙන්නෙ. ඒක නිසා තමයි ඊට පස්සෙ කවුරුහරි කතා කරනව දැන් එයාට ඒක ගැලපෙනව නම් කියනව. එහෙම නැත්නම් වෙනම වෙලාවක් දෙනව ඒ දේශනා කරන්න. යන්නෑ මොකද හේතුව, ඒ ශූන්‍යතාවයම තමයි කියවෙන්නෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** මොකද ඊට පස්සෙ මේක සමාධිමත් ස්වභාවය තුළ උපදින්නේ. මේක හැමෝටම වෙන්න පුළුවන්. නමුත් මේ පැත්තේ ඒ ස්වභාවය තියනව. දැන් බුදුන් වහන්සේ උනත් ඒ අනිමිත්ත සමාධිය තුළ වැඩ සිටිනව. ඉතිං අනිත් එක මේක සතර ඉරියව්වෙමත් තියෙනව. ඒ කියන්නෙ දකින කොටත් ඒව පේනව. ඒ කියන්නෙ මුකුත් නැතිවෙලා නෙවෙයි. අභ්‍යන්තර අවබෝධය තුළ අර අපි කිව්වෙ ආරෝපනය නෑ. ආත්මීය ආරෝපනයක් තියනව කීවේ. ආත්මීය ආරෝපනය නෑ. දියවෙලා. ඒ විදියටම අර ඊට පස්සෙ දැනෙන් නෑ. අරතමයි, 'අරහත්ත සමාධිය' කියල ඒ එතනටමයි. එතන ඉතිං අමුතුවෙන් කියන්න දෙයක් නෑ. ඒක බුදුන් වහන්සෙ මනාකොට ම කියනව අපි 'පංචාංග' කියන සූත්‍රය පැහැදිලි කළා. ඒකෙ 'නිරෝධ සමාපත්තිය' ගැන පැහැදිලි කළා. ඒ නිරෝධ සමාපත්තියට ඒ කියන්නෙ වේදනා සංඥා නිරෝධ සමාපත්තියක් වේදය තුළ තියනව ඒක වෙනම කතාවක්. හුස්ම ඒකාග්‍ර කරල. ඒක සංඥා නොදැනෙන තැන ස්වභාවය අසංඥතලයේ ඉන්න එක. නමුත් මේකෙ එහෙම නෙවෙයි. මේ ලෝකෝත්තර භූමිය එහෙම එකක් නෙවෙයි. ඒකම ඒ සූත්‍රයෙම තියනව අන්තිමටම දාල තථාගතයන් වහන්සේ එය නොපිළිගනී. ඒ අත්තුඩු පිරිවැඩියන්ගේ. ඒ කියන්නෙ අන්‍යාගමිකයන්ගේ වේදනා සංඥා නිරෝධ සමාපත්තිය තථාගතයන් වහන්සේ පිළිගන්නෙ නෑ. වැටහෙනවද?

**උපාසිකාව :** වැටහෙනව

**ආර්යයන් වහන්සේ :** හැබැයි එතනත් වේදනා, සංඥා නිරෝධයක් තියනව. සංඥාවක් දැනෙන්නැති එකම සංඥාවක ස්වභාවයක ඉන්නව සුකුම ස්වභාවයක තියාගෙන. හැබැයි එතන කෙනා ඉන්නව. මොකද

**මෙතන කෙනා නැතිවෙන්නෙ, මේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කිරීමෙන් පමණයි. කෙනා  නැතිවෙන්නෙ මේ අවබෝධයෙන්. මේ සත්‍යාවබෝධය තුළ දර්ශන අවබෝධය තුළ පමණයි. ඒකයි මේ සංඛිතේ නිබ්බිදා ය. මේක අවබෝධශ්‍රද්ධානයක් නිවන කියල කිව්වෙ. අවබෝධශ්‍රද්ධාන තුළින් තමයි ඒ ගින්න නිවෙන්නෙ. ඒ කියන්නෙ ආත්මය කියන ගින්න නිවෙන්නෙ. නිවන් දකින්නෙ. ඒකයි සංඛිතේ නිබ්බිදාය කියල කිව්වෙ. ඒකයි 'සබ්බේ ධම්මා නාලං අභිනිවේසා' කිව්වේ. සිතුවිලිවලට රිංගන්නෙ නැති සිතුවිලිවලින් මිදුනු ඒ අවබෝධය තුළයි ඒ ආත්මයෙ කෙනෙක් නැති බව අවබෝධයට පත්වෙලයි, අරහත්ත සමාධියටයි සමවදින්නෙ.** වැටහෙනවද?

**උපසිකාව** : වැටහෙනව ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** අරහත්ත සමාධිය කියන්නෙ රහ නැතිවෙලයි එන්නෙ. රහත්නෑ හරයක්නෑ තේරෙනවද?

**උපාසිකාව :** තේරෙනව

**ආර්යයන් වහන්සේ :** ඒකයි 'ගුබුජ්ජති' කියල කියන්නෙ. කියනව හරයක් නෑ. රහක් නෑ. ඒ කියන්නේ **'අඛොප්පා චේතෝ විමුක්තිය.'** කම්පනයක් නෑ. අපි කියනවනෙ අර ආත්මීය ස්වභාවය බාහිර අරමුණුවලට කම්පනය වන ස්වභාවය. ඒකත්නෑ. ඒකයි සුකුම ස්වභාවය. ඒකත් ඇත්තටම බුදුන් වහන්සේ කියන්නේ, තත්‍ර තත්‍ර **යන්හි යන්හි එතන එතන යම් වේදනාවක් නිරෝධ වෙනව නම් අන්න එයයි කියනව ලෝකෙ තියන පරම සුඛය.** නිරෝධ සමාපත්තිය පරම සුඛය කියල පනවන් නෑ. යන්හි යන්හි තත්‍ර තත්‍ර කියන තැන භාවිතා කරල බුදුන් වහන්සේ කියනව ඒකයි කියනව පරම සුඛය. නිරෝධ සමාපත්තිය පරම සුඛයක් නොවේ. නිරෝධ සමාපත්තිය කියන්නෙ සංඥා සුකුම කරල එකම ස්වභාවය. ඒ තුළ පැවතීමයි සමාපත්ති සුවය කියන්නේ.එය නිවන නෙවෙයි. ඒ සංඥා සුකුම ස්වභාවය තුළ, කෙනෙක් නෑ. ඒ ස්වභාවය තුළ ඉන්නව අරහත්ත සමාධිය. හැබැයි එතනත් සංඥා නිරෝධ සමාපත්තිය තමයි. හැබැයි ඒක වේදය තුළ තියන එකේ කෙනා ඉන්නව. බුදුන් වහන්සේ ඒ නමම භාවිතා කරනව. මොකද සංඛාරමනෙ වචන

කියන්නෙ. නිරෝධ සමාපත්තිය කියන නම තමයි ගැලපෙන්නෙ. නමුත් ඒක බුදුන් වහන්සෙ ඉන්න එක නෙවෙයි වේදය තුළ ඉන්න අය ඉන්නෙ. දෙක ආකාර දෙකක්. ඒකෙ කෙනෙක් ඉන්නව. මේකෙ කෙනෙක් නෑ. ඕකයි වෙනස. නමුත් වචනෙ විදියට ගත්තම ඒ ගොල්ලොත් කියනව ඒකට නිරෝධ සමාපත්තිය කියල. ඒ නිසා තමයි අන්තුඩු පිරිවැඩියන් එහෙම නිරෝධ සමාපත්තිය සමවදිනව කියල කියන්නෙ. නමුත් බුදුන් වහන්සේ නිරෝධ සමාපත්තියට සම වදිනව. ඒ දෙක දෙකක්. අනිත් එක 'අරහත්ත' සමාධිය තමයි ඇත්තටම මේ මාර්ගයේ යන අය සමවදින සමාධිය. ඒකට කියන්න ඕන නම අරහත්ත සමාධිය. සමාපත්ති සුවයක් විදියට අර සංඥා සුකුම ස්වභාවය සමාපත්ති සුවයක් කියල ගන්නවා. සමාපත්තියක් විදියට නමුත් සමාධිය අරහත්ත සමාධිය. ඒ කියන්නෙ හතර ඉරියව්වෙම මේ අරහත්ත සමාධිය පවතිනව. වැටහෙනවද?

**උපාසිකාව :** වැටහෙනව, වැටහෙනව.

**ආර්යයන් වහන්සෙ: හැම මොහොතෙම, ඒ කියන්නෙ සතර ඉරියව්වෙම කිසිම දේකට ඒ කියන්නෙ ඇල්මක් ඇති නොවන සමාධිමත් සුවයකින් කටයුතු කරනව ඒ අරහතුන් වහන්සේලා.** ඒක අමුතුවෙන් සමාධිය කියලා පාව් පාව් ඉන්න කියල අමුතු දෙයක් නෙවේ. මේ සියල්ලෙන් මිදුනු ස්වභාවයට කියන නම. ඒක නිසා තමයි පෙරදින කුමන විහරනයකින් වැඩ සිටියේද? ස්වාමීනි ඔබගේ මුවමඬල හරි පැහැපත්ය. ඔන්න ඔහොම ආනන්ද හාමුදුරුවෝ සැරියුත් හාමුදුරුවන්ගෙන් විමසනව. ඒක බොජ්ඣංග සූත්‍රවල විශේෂයෙන් දකින්න ලැබෙනව. ඉතිං ගොඩක් සූත්‍රවල තියනව. ඒ කියන්නෙ ඇත්තටම අරහතන් වහන්සේලට ගින්නක් නෑනෙ. කොහොමත් සුවෙන් තමයි පසුවෙන්නෙ. ඉතිං පර්යංකෙ ගොඩ වෙලාවට මනුස්සයෙක් ඉන්නෙ කොහොමද? හිටගෙනද ඉන්නේ රෑට. එකත් ඉතිං සමහර අයට තේරෙන්නෑ කීවාම. මේ ධර්මය අවබෝධ උනාම දැන් බුදුසමයෙ ගොඩක් වෙලාවට දැන් මේ මෑත යුගයෙ උනත් අපිට පේනව. බිම තමයි ඉන්දියාවෙ බොහෝ අය ඒ කාලෙ ඉතිං ලංකාවෙ උනත් චීනෙ උනත් එහෙම තමයි. බිම තමයි ගොඩක් වෙලාවට වාඩි වෙන්නෙ.

**උපාසිකාව :** දැන් අපේ මේ සිතුවිලි හැම තිස්සෙම එන එක අපි දැන් තේරුම් ගත්තනෙ...

**ආර්යයන් වහන්සේ :** අපි ඕක පැහැදිලි කරන්නං. ඔය එකක්වත් හිතන්නෑ. හිතනව කියල දෙයක්නෑ. දැන් වතුර බිව්ව නම් එච්චරයි. වතුර බීව කියල දෙයක් නෑ. නමුත් ඒක වෙනව දැන්. ඔබතුමිය බලන්නකෝ ඔක්කොම වෙනව සාමාන්‍ය විදියට ඕව හිතන්නෑ. හුස්ම ගන්නෙ හිතල නෙවෙයිනෙ.

**උපාසිකාව :** නෑ නෑ නෑ

**ආර්යයන් වහන්සේ :** දැන් ඇගේ කෑම දිරවන්නෙ හිතලද? ඔය ගොල්ලො දැන් පොඩ්ඩක් ඉන්න මේ කෑම දිරවනකන් කියල.

**උපාසිකාව :** ඒව ස්වභාව ධර්මයෙන් වෙනවනෙ.

**ආර්යයන් වහන්සේ :** දැන් බල්ල කියනවද ඔය එක එක ඒව නෑනේ. සත්තු කියන්නෑනේ. අපි මොකටද ඕව දැනගන්නෙ. **දැන් සාමාන්‍ය ඔය මැෂින් එක දුවනව, ඒක මැෂින් එක. අපි නොවේ, මැෂින් එක දුවනව. ඒ කියන්නෙ සිතුවිලිවල අපිනෑ. දැන් ඔබතුමිය හිතනව කිව්වොත්, ඔබතුමිය සිතුවිලිවල ඉන්නෙ.** දැන් මේකෙන් අයිනට වෙලා ඉන්නව කියන්නෙ සිතුවිලි මම නෙවෙයි.

**උපාසිකාව :** සිතුවිලි දුවන්න ඇරල ඔහේ ඉන්නව.

**ආර්යයන් වහන්සේ :** සිතුවිලි දුවනව. ඔහේ ඉන්නව නෙවෙයි.

**උපාසිකාව :** ඔව් ඒකට ඇලෙන්නැතිව ඉන්නව.

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ අපි අවධිවෙලා ඒක දිහා බලන් ඉන්නව.

**උපාසිකව :** ආ... අර ගඟක යන කොවේ දිහා බලං ඉන්නව වගේ නිකං බලන් ඉන්නව.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි කීවේ අර උපමාවකින් අපි. ෆිල්ම් එක බලං ඉන්නවා. **අපි අපේම චිත්‍රපටිය බලාගෙන ඉන්නෙ.** ඒ කියන්නෙ අපිට සිහිය තියනව. සිහිය තියනව කියන්න, හේතුව බලං ඉන්නව කියන එක. ඒකයි **'ජානතෝ පස්සතෝ'** කියන්නෙ. **ඒ කියන්නේ දනිමින් දකිමින් ඉන්න එක.** දනිමින් දකිමින් ඉන්නව. **ඒ කියන්නෙ දැනගන්නව** ධර්මය මෙකේ මෙහෙම දෙයක්නෑ කියල. **නමුත් අපි 'දකිමින් ඉන්නව' කියන්නෙ, ඒක එයාට අභ්‍යන්තරයට දැනෙනවා.** මේක කොයි පැත්තට වචන දෙක

කැරකෙයිද කියන්න දන්නෙ නෑ. මේක හිතනව නෙවෙයි. ඒ කියන්නෙ මේක අභ්‍යන්තරය සිහියට අවදි වෙලා ඉන්නෙ. දකිමින් දනිමින් ඉන්නව කියන එක තමයි වචන දෙක. **දකිමින් ඉන්නව කියන්නෙ දන්නව කියන එක.** ඒක මේ පැත්තට එන්න ඕන. **දකිමින් ඉන්නව කියන්නෙ, සත්‍ය දකිනව කියන එක,** සත්‍ය දකින එකයි. **සාමාන්‍ය අරමුණක් එනකොට ඒක අභ්‍යන්තරයට තමන්ට දැනෙනවනෙ, අන්න ඒක දැනෙන එකට සිහිය පවත්තමින් ඉන්නව.** ඒ කියන්නෙ දෙයක් අපි හිතුව කියල නැතිවෙන් නෑ. ඒක ටික ටික දියවෙලා අන්න ඒක දකිමින් ඒක දකිමින් ඉන්නව. ඔය වචන කොයිපැත්තට කැරකුනත් මේක වචන ගොඩක්නෙ. තේරුම මොකක්ද කියල ගත්තොත් එහෙම දැන් අපි පොත ගත්තොත් එහෙම පොත අරමුණ එනකොටම පොත කියල ඒක සිහියක් තියනව. ඒ වගෙම අපි ඒක යථා භූත, එහෙම දෙයක් නැති බවට මෙනෙහි කරපු බවට සිහියක් තියනව. ඒ කියන්නෙ යථාභූතව යෝනිසෝ මනස්කාරයෙන්, යථාභූත ඥානයෙන් දැකපු බවට සිහියක් තියනව. හැබැයි ඒ පොත ඒ උනාට මිදුනද කියන එකටත් සිහියක් තියෙන්න ඕන. මිදුනෙ නැති බවට තමන්ට යම්කිසි මට්ටමක් දැනෙනව. මේ මේ මේ ගානට දැන් අපි පොතට සාමාන්‍යයෙන්, පොත අතහැරෙන ස්වභාවය තමන්ට දැනෙනව. දැන් කලින් තරම්නෑ. දැන් ඊට වැඩිය පොඩ්ඩක් දැනෙන ස්වභාවය වෙනස්. දැනෙන ස්වභාවය හිතන එකක් නොවේ. හිතල ගන්නත්බෑ. හිතුවොත් එන්නෙත්නෑ. මේක දැනෙන එකට සිහිය පවත්වනවා විතරයි. අමුතුවෙන් හිතන එකක් නෑ. හිතනව කිව්වොත් හිතලනෙ ගන්නෙ. සිහියෙන් ඉන්නව කියන්නෙ තමන්ට දැනෙන එකට, සිහියෙන් ඉන්න එකක්නෙ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** සිහියෙන් ඉන්නව කියන එක, දැන් අපි සිහියෙන්නෙ ඉන්නෙ. ඒ කියන්නෙ වෙන දේ ඒක සොබාදහමනෙ. ඒ කියන්නෙ ඒක, දැනෙන එක සොබාදහම.

**උපාසිකාව :** ඔව්. එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒකට අපිට කරන්න දෙයක්නෑ. ඒකට ඇලුනා කියමු. ඒකට දැන් ඇලුන බවට සිහියක් තියනව. ඒක තමයි ඤාණේ කියන්නේ ඒකට ඇලුන කියල තමන් දන්නව. ගින්න ගන්න බව දන්න එක්කෙනාටනෙ ගින්න නිවෙන බව දැනෙන්නේ. ගිනිගන්නව බව දැනෙන්

නැත්නම්, නිවෙන බව දැනෙන්නෙත්නෑ. එහෙනම් ඒක දියවෙනවත් ටිකින් ටික දැනෙනව සිහියට. ඒ කියන්නෙ අපි, පොත නැතිවෙන්න කැමතිනෙ.

**උපාසිකාව :** කැමතියි.

**ආර්යයන් වහන්සේ :** ඒක වෙන්නෑ. ඒක සිතුවිල්ලක් නිසයි වෙන් නැත්තෙ.

**උපාසිකාව :** ඒක අපිට දැනීමෙන් වෙන්න ඕන.

**ආර්යයන් වහන්සේ :** එහෙම වෙන්න ඕනියි කියල හිතන්නෙ නැති උනාමයි, එහෙම වෙන්නෙ. අර ආනන්ද හාමුදුරුවෝ රහත් වෙන්න හිතාගෙන සක්මන් භාවනාව කරනවනෙ. ඊට පස්සෙ අඑයම ඔක්කොම අත ඇරල දානවනෙ රහත් වෙන්නෑනෙ. අන්න එතකොටයි ඒක වෙන්නෙ.

**උපාසිකාව :** දැන් තේරුණා. හොඳට තේරුණා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඔය පටන් ගත්ත වෙලාවෙ ඉදලම තේරුණා කියනව. දැන් පැයකට පස්සෙත් කියනව. ඇයි දැන් තේරුනා කියන්නෙ මොනවද?

**උපාසිකාව :** නෑ නෑ දැන් තේරුණා කියල කියන්නෙ කියපු දේ මට වැටහුනා.

**ආර්යයන් වහන්සේ :** ඔබතුමියට භාෂාව තුළ තියනව. ඒක හොඳයි. අපිට දාගත්ත වචන තියනවනෙ. දැන් සමහර අය කියනව හැම වචනෙටම එහෙමයි, එහෙමයි, එහෙමයි. සමහර අය කියනව සමාවෙන්න ආර්යයන් වහන්ස මොකක්ද ඒ සමාවෙන්න ආර්යයන් වහන්ස මොකක් ද ඒ. මේ වැරැද්දක් වෙලා නෙවේ මේ කියන්නේ එයාගෙ භාෂාවෙ වැරැද්දක්. මේ අපේ පුරුදු.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** අපි මේ සංනිවේදනය ඒ පුරුදු අනුව සිද්ධ වෙන්නෙ. ඒක එච්චර දෙයක් නෙවේ. ඒකයි, ඒක තේරුණා කියන්නෙ. ඒක නරක දෙයක් නෙවේ. මෙතන කියන ප්‍රශ්නෙ ඒක නෙවේ. තේරුණෙ නැති එක.

**උපාසිකාව :** නෑ දැන් ආර්යයන් වහන්ස තේරුනේනෑ කීවට මේ ඔක්කොම ටික අපහු මෙනෙහි කරල මම

**ආර්යයන් වහන්සේ :** දැන් ඔබතුමියගෙ තියන පළවෙනිම දෝසෙ කියන්නද?

**උපාසිකාව :** හරි

**ආර්යයන් වහන්සේ :** ඔබතුමිය මොකුත් නොකර ඉන්න දන්නෙනෑ.

**උපාසිකාව :** ඒක වෙන්න පුළුවන්.

**ආර්යයන් වහන්සේ :** මේකෙ තියෙන්නෙ මොකුත් නොකර ඉන්නයි. ඒ කියන්නෙ නිවන් දකිනව කියන එකත් පැත්තකින් තියල මේ ධර්ම මාර්ගය කියන එකත් පැත්තකින් තියල ඔබතුමිය තියන දෙයක් කාල හොඳට නාල පොඩ්ඩක් හාන්සිවෙන්න. පුදුම සැහැල්ලුවක් දැනෙයි. අන්න ඒක තමයි නිවන්මඟ. දැන් ඔය මොනවා හරි කාපු දෙයක් තියනව නේද? ඕක අමුතුවෙන් බරක් ගන්නැතිව, හිමින් සැරේ ඕක බිමින් තියන්න. ඕක නැතිවෙන්නෑ. **අවබෝධයට පත්වෙන එක ඇවිල්ල හිතන එකක් නොවේ. ඒ මොහොතට දැනෙන එකක්. එය පස්සෙ දැනෙන එකක් නෙවේ. දැන් දැනිල ඉවරයි. ඔබතුමියට දැනෙන්න ඕන ටික දැනිල ඉවරයි.** දැන් බරක් ගන්න දෙයක්නෑ. ඕක ඔහොම්ම බිමින් තියන්න. මොකද ආරෝපනය පොඩ්ඩක් අඩුවෙලයි තියෙන්නෙ. ඒක අමුතුවෙන් ගත්තොත් වෙන්නෙ තව ආරෝපනය වෙන එකතමයි. කොයි වෙලාවෙත් දැන් කරන්න හොඳම දේ තමයි අර වගේ තියන දෙයක් කාලා පොඩ්ඩක් නාල කාල සැහැල්ලුවෙන් ඉන්න එක. ඔය සැහැල්ලුවෙන් ඉන්න කොට සැබෑ සුකුම ස්වභාවයක් එක්ක පුදුමාකාර විදියට මේ ධර්මය, ඇත්තම කිව්වොත් මේ ධර්මය කියන්නෙ දෙයක් නැති බවනෙ. දියවෙලා යනව. තෙරුවන් සරණයි.

# 02

# ඉපදීමක් මරණයක් නැති ලොවකට පියමැන යන්නට, මංපෙත් විවර විය

**උපාසක මහතා :** ආර්යයන් වහන්ස දැන් ඔබ වහන්සේ කියන මේ ශූන්‍යතාවය කියන තැනදි, මේ දේශනා අහන්න කලින් ලංකාවේ දේශනා කරන ස්වාමීන් වහන්සේලගේ දේශනා අහල, මේ පැත්තට නැඹුරු වෙලා සෑහෙන කාලයක් වෙනව. නමුත් ඔබ වහන්සේගේ දේශනාවලින් තමයි මම මේ පිරිසිදුව මනසේ තියන ස්වභාවයට focus කරන්න පුළුවන් උනේ. එතකොට ඔබ වහන්සේ කියන විඤ්ඤාණය අනිදස්සනයි කියන තැනදි, මමත්වය කියන ස්වරූපයෙන් ඉවත්වෙන කොට ශරීරය සාමාන්‍යයෙන් එක එක්කෙනාට එක එක විදියට ඒකේ ස්වභාවය පොට්ඨබ්භය ඒ කියන්නේ කියන තැන මෘත ශරීරය සාමාන්‍යයෙන් ඒ කියන්නෙ ශරීරය කියන ස්වරූපයක් තේරෙන්නෙ නැත්නම්. සාමාන්‍යයෙන් ශරීරය නිතර සැහැල්ලු වෙලා. ඒක චලනයක් එක්ක නිකං පාවෙනව වගේ නිකං ඒ කියන්නේ සෙලවෙනව වගේ වෙන අවස්ථාවෙදි, එතන තියන මානසික මට්ටමේ ස්වරූපය ටිකක් ආර්යය වහන්සේට පැහැදිලි කරන්න පුළුවන්ද?

**ආර්යයන් වහන්සේ :** ඒ කියපු එක ටිකක් පැහැදිලිව කියන්න. තේරුණේ නෑ.

**උපාසක මහතා :** දැන් ඔබ වහන්සේ කියන දේශන අහල ඉවරවෙලා අපි එතෙන්ට යනවනෙ මනසින්. මේක හොයන කෙනා ධර්මය කාලයක් තිස්සෙ අහල දවසින් දවස දවසින් දවස අහන දේශනවලින් අපිට තේරෙනව විඤ්ඤානය අනිදස්සනයි සංඥාව සුකුමයි කියන තැනදි

මට පේරෙනව පැද්දි පැද්දි, පැද්දි පැද්දි තැනක් නැති විදියට මේ තියෙන්නෙ කියල. ඒ කියන්නෙ ශරීරය නිකං සියුම්ව සෙලවෙන්නෙ. අන්න එහෙම මනෝභාවයකට පත් උනාට පස්සෙ හරියට එතන්ටම සියුම්ව සියුම්ව සංඥාව අරමුණු කරනකොට එතන එහෙම ස්වරූපයක්, එතන මොහොතකට උනත් නාමරූප වශයෙන් දැකල අර කියන තත්වයට නාම රූප උනාට මෙහෙම නේද කියන අදහසට දේශන තුළින් ගත්ත ඥානයෙන් හසු වෙන කොට ස්වාමීන් වහන්ස, අර ස්වරූපය දැනෙනව මට. ඒක මොකක් හරි මිථ්‍යාවක්ද? කියන එක පළවෙනි ප්‍රශ්නෙ දැනගන්න ඕන. අනික එහෙම අපි එදිනෙදා ජීවත් වෙන කොට බාහිරින් ඒ පිළිබඳව උඩින් ජීවත් වෙනව වගේ ඝනට රළුවට වගේ තිබ්බ දෙයක් ගැඹුරට ධර්මයට පිවිසෙන්නට පෙර බාහිර තිබ්බ දේවල් ගැන එහෙමනේ ඒ මනසේ තිබුන සිතුවිලිවලින්ම තියන දෙයක් ද? නැත්නම් පරිබාහිරව තියෙන දෙයද? කියන එක මට පැහැදිලි කරගන්න බැහැ. ඒක ටිකක් පැහැදිලි කර ගන්න ඔබ වහන්සේට පුළුවන් ද?

**ආර්යයන් වහන්සේ :** පළවෙනි ප්‍රශ්නය නම් චිත්ත කම්පනයක් තියෙන්නෙ. ඒ කියන්නෙ ඒක ආත්මීය ඒක දිගට පැහැදිලි කරන්නත් පුළුවන් කෙටියෙන් පැහැදිලි කරන්නත් පුළුවන්. ඒ කියන්නෙ දැන් ඔය අපි මේ කතාකලාට හිත කියල දෙයක් නැහැ.

**උපාසක මහතා :** එහෙමද?

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම එතන කම්පන ගොඩක් තියෙන්නෙ. ඒ කියන්නෙ ස්පාක් ගොඩක් තියෙන්නෙ. ඒ කියන්නේ ස්පන්දනය තියෙන්නේ ප්‍රතිකම්පන තියෙන්නෙ. එතකොට සෙන්සස් තමයි ඔය ද්වාර කියන්නෙ. එතකොට චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණන, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ කියන මේව ඇවිල්ල ද්වාරවලට ස්පාක් වෙනව. ඒ කියන්නෙ වර්ණෙට, ශබ්දෙට, ඝනදේට, රසට, උණුසුම, සීතල, තදගතියට මේව තමයි Spark වෙන්නෙ. ඒව තමයි සෙන්සස් කියල කියන්නෙ. ඉතිං තියෙන්නෙ ප්‍රතිකම්පන ගොඩක්. ඒ කියන්නෙ මෙතන මේ වේගයක් තුළ Spark වීම තුළම ඇතිවන කම්පන. ඒක කියන්න ඕන එකට ස්පන්ධනය වීම. 'ස්පන්ධනය' කියන්නෙ එකට මිශ්‍ර වෙනව කියන එක ස්පාර්ක් එක. **එතකොට ශබ්ද තරංගයි. වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනව** කියනඑක.

මේක විද්‍යාත්මකව පැහැදිලි කරනව නම් ඒක ඒ විදියට පැහැදිලි කරන්න පුළුවන්. එතකොට සාමාන්‍ය විදියට කෙනෙකුට තේරුම් ගන්න පුළුවන්. පේන්නෙ ශබ්දයක් වෙන්න බෑනෙ. දැන් ඉස්සරහ මොනවද තියෙන්නෙ.

**උපාසක මහතා :** මගේ වාහනේ තියනව.

**ආර්යයන් වහන්සේ :** පේන ඒවා කියන්න මොනවද පේන්නෙ.

**උපාසක මහතා :** පේන්නෙ, පොල්ගසක් පේනව, කණුටික පේනව, ඉස්සරහා ගාඩ්න් එක, තණකොළ පේනව.

**ආර්යයන් වහන්සේ :** ගාඩ්න් එක කියන්නෙ තණකොළ කියන්නෙ ශබ්දයක්නෙ. වාහනේ කියන්නෙ ශබ්දයක්නෙ. ටයිල් කියන්නෙ ශබ්දයක්නෙ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** පේන්නෙ ශබ්දයක් වෙන්න බැහැනෙ, පේන්නෙ වර්ණයක්නෙ. වර්ණ කොහෙද ශබ්ද දැන් අපි කැමරාවකින් ගන්නෙ ෆෝටෝ එකක්නෙ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඒකෙ තියෙන්නෙ පිංතූරයක්නෙ. දැන් පිංතූරෙක තියනවද ඕව.

**උපාසක මහතා :** පින්තූරෙක නෑනෙ ඕව.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි. පේන්නේ පින්තූරයක්නෙ. පේනව කියන්නෙ වර්ණ හැඩ තලයක්නෙ. ඇහැට ශබ්ද ඇහෙන්නෙ නෑනෙ. ඇහැටනෙ පේන්නෙ. දැන් ඇහැට කොහොමද ඕවට නම් තියනවද. දැන් වාහනේ කීවෙ නැහැ වාහනේ කියල. තණකොළ කීවේ නෑ තණකොළ කියල.

**උපාසක මහතා :** ඔව්. ඒ ටික.

**ආර්යයන් වහන්සේ :** එතන තියෙන්නෙ ශබ්ද

**උපාසක මහතා :** ඔබ වහන්සෙගේ ධර්මය අහන කොට ඒ ටික තේරෙනව, මට දැන්.

**ආර්යයන් වහන්සේ :** දැන් ඔතන චිත්තයක් තමයි ඔය ඇසුරු කරන්නෙ, බාහිර තියන දෙයක් නෙවෙයි. චිත්තෙක තමයි ශබ්දයි වර්ණයි එකට එකතු වෙලා තියෙන්නෙ. ඒකට තමයි සංඛාර කියන්නෙ. සංඛාර කියන්නෙ කොහොමත් තියන එකක් නෙවෙයි. සංඛාර කියන්නෙ සකස් වෙනව කියන එක. සකස් වුනු දෙයක් කියන්නෙ චිත්තයක්. එළියෙ කොහෙවත් නෑ ඒව. මහා භූත විතරයිනෙ. දැන් මැටි ටික එක හැඩේකට කියනව. මල් පෝච්චිය කියල තව හැඩේකට අපි කියනව කලයක් තව හැඩේකට මුට්ටියක්, තව හැඩේකට පිඟානක්, කෝප්පයක් ඔක්කොම මැටිනෙ.

**උපාසක මහතා :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** අලියෙක් ආවොත් ඔක්කොම පාගගෙන යනව. මැටි විතරයිනෙ. ඉතිං මැටිවල හැඩවලට නම් දැම්මෙ කවුද? එතකොට කොහොමද මේවට ශබ්ද ආවෙ. අපි ඉපදෙනකොට, මොන්ටිසෝරි යන දරුවට ඔය ප්‍රශ්න තිබුනද? ඒ කියන්නෙ ඉපදෙන ගමන් පුංචි දරුවට එහෙම දේවල් තිබුනද? ඉරිසියාවක්, වෛරයක්, ඉපදෙන ගමන්. දැන් මේ අවස්ථාවේ ඔබ තුමාගෙම මව්කුසෙන් ආපු මුල් අවස්ථාවට ගියොත්, කොතනින්ද මේක පටන් ගන්නෙ, කොහොමද මේක හැදුනෙ කියල ඕක ලිහාගන්න පුළුවන්. පුබ්බේ නිවාසානුස්සතිඥානයනෙ. පුබ්බේනිවාසානුස්සති ඥානය කියන්නේ, මේ සිත් පරම්පරාව දකින එක.

**උපාසක මහතා :** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඉතිං මේක තේරුම් පුළුවන්නෙ මනුස්සයෙකුට මෙනෙහිකරණ කොට සතෙකුට තේරෙන්නැති උනාට, ඔබතුමා ඉපදෙනකොට, ඔබතුමාගෙම මුලට ගියහම ඉවරයි. ඔබතුමා දන්නැහැනෙ ඕව.

**උපාසක මහතා :** අන්තිමටම මගේ ජීවිතේ පටන්ගත්තු තැන මෙහෙම ස්වාභාවයකින් තමයි. මගේ මතකය පිළිබඳ පිටිපස්සට හිතල බැලුවහම ඔබවහන්සේ කියනව වගෙ මෙතන ඉදං තමයි මම හැදුනෙ කියන එක මට තේරෙනව.

**ආර්යයන් වහන්සේ :** කොතන ඉදන් ද?

**උපාසක මහතා :** අපි පොඩි කාලෙදි මොරටුවෙ මගේ ගෙදර ඉන්දැද්දි දැකපු සටහන් දෙකතුනකින් තමයි මම පටන් ගත්තෙ කියන එක මට මතකයි.

**ආර්යයන් වහන්සේ :** ඔච්චර දුර යන්න ඕන නෑ. දැන් ඉන්න පුංචි දරුවෙක් දිහා බලන හැකිනෙ. ඔබ තුමාට දරුවෝ ඉන්නව නේද?

**උපාසක මහතා :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒ දරුවා ඉපදුන කාලෙට පොඩ්ඩක් ගිහින් බලනහැකි. ඒ දරුව ඉපදෙනව දැක්කනෙ. ඒ දරුව ඉපදෙනකොට දරුව තොටිල්ල තිබ්බනෙ. ඒ දරුව කතා කළේ නෑ. දඟල දඟල හිටියා දරුව මොකුත් දන්නෙනෑ. දරුව මොන්ටිසෝරි යනකොට කියනවනෙ මේ රතුපාට Yello, Red, Blue දැන් ඕව දාල රූපයක් පෙන්නල ශබ්ද දාන එකනෙ උගන්නනව කියන්නෙ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමින් වහන්ස

**ආර්යයන් වහන්සේ :** දැන් රූපයක් පෙන්නලනේ ශබ්දයක් දාන්නෙ රූපෙ පේන්නෙ ඇහෙන් ශබ්දෙ එන්නෙ කනෙන්. දෙක එකට එකතු කරගෙන අපි ඊට පස්සෙ කහපාට කියල දැනගන්නව. දැනගන්නව කියන්නෙ ඒ දෙක එකතු කරගන්නව.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමින් වහන්ස

**ආර්යයන් වහන්සේ :** එකතු කරල හැදෙන එක චිත්තයක්, සංඛාරයක්. **ශබ්ද වර්ණ විතරක් නෙවෙයි ඒ සියල්ල එකතුවෙනව ශබ්ද, වර්ණ, ගද, රස, පහස සියල්ලම සොබාදහම ඒව ඔක්කොම නියාම ධර්ම, ඍතුනියාම, බීජ නියාමෙ, කම්මනියාම, චිත්ත නියාම.** වහින්නෙ පායන්නෙ ඕව ඔක්කොම සොබාදහමක් තියෙන්නෙ. ශබ්ද වර්ණ ඕව එකට එකතුවෙන එක සොබාදහමක්. ස්පන්ධනය වෙන එක. එකට මිශ්‍රවෙලා ඒ ක්ෂණයෙම එකට එකතුවෙලා සොබාදහමක් තියෙන්නෙ. ගස්වලටත් ශබ්දයක් දැම්මහම ගස්වල සෙන්සස්වලට ස්පාර්ක් වෙනව. විද්‍යාගාරවල පර්යේෂණවල ඔප්පු වෙලා තියෙනව ගස්වලට දැනෙනව. ශබ්දය ඒ කියන්නෙ ශෛලවලට හැමතැනටම මේ ශබ්ද දැනෙන ස්වභාවය. ඒ කියන්නෙ ශබ්ද වර්ණ මේව කියල නැහැ. මේව ඔක්කොම තරංග. දැන් කොන්ටම් න්‍යාය දිහා බැලුවම දැන් ඉන්න තරුණයකුට තේරෙනව දැන්

ඔක්කොම තරංග තියෙන්නෙ. ශබ්ද තරංග, වර්ණ තරංග, හර්ට් 20යි 20,000යි. ආලෝකය ගත්තොත් තරංග තාපය තරංග ඕනම එකක් සිරස, දෙරණ, හිරු රේඩියෝ නාලිකා අරව මේව හැම එකම තරංග කියන්නේ අංශු ගොඩක් තියෙන්නෙ. අංශු එකතුවෙලා සකස් වෙන එක.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමින් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඒ අංශු ස්වභාවයමයි. මෙතන තියෙන්නෙ සකස්වෙන එකක්. දැන් ඔබ තුමා දේශනා කොච්චර වගේ ඇහුවද?

**උපාසක මහතා :** ඔබ වහන්සේගෙ ශූන්‍යතා දේශනා ටික ඇහුව. අභිඥා දේශනා ටික ඇහුවා

**ආර්යයන් වහන්සේ :** මේ ළඟදි එකක් ගියෙ. ධම්ම චක්ඛුසය කියල. රතුපාට ඇහැක් යනවා.

**උපාසක මහතා :** ඒක මම ඇහුවද කොහෙද?

**ආර්යයන් වහන්සේ :** ඒක දැන් පොඩ්ඩකට කලින් එන්ටර් උනෙ. ඒකෙ තියනව ඔය කතාව හොඳට පැහැදිලි කරනව. දැන් ඔයිට පස්සෙ යන එකෙත් හොඳට පැහැදිලි වෙනව. පැයකට වැඩියි ඒ ඔක්කොම. පැය දෙක පැය 3යි. මේව කඩ කඩ තමයි දාන්න වෙන්නෙ. ගොඩක් අයට ඔය ප්‍රශ්නෙ තියෙනව. ඔබතුමාට ඔය තියන ප්‍රශ්නෙ. ඔය ප්‍රශ්නෙම තමයි අහන්නෙ. ඒකම තමයි පැහැදිලි කරගෙන යන්නෙ. පැය කීපයක් මුල ඉදන් ඔය ඉපදෙන තැන ඉදන් අවසානෙ දැන් මේ වෙන කොට හිත හැදිල තියෙන හැටි, හිත කියල දෙයක් නැති බව හිත හැදෙන ආකාරය. ඕක බොරුවක් බව වැටහෙනව ඒ ගොල්ලන්ට. එයාලම කියනව ඒක බොරුවක් කියල. හිත කියල දෙයක් නැති බව.

**උපාසක මහතා :** ඒක පැහැදිලියි ඒක ජේනකොට ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඒක කියන කොට නෙවෙයි. ඒක තමන් අභ්‍යන්තරයෙන් මෙනෙහි කරල අවබෝධ කරගන්න ඕන. තමන්ට අහුවෙන්න ඕන කියන්නෙ ඒකයි. තව කෙනෙක් නිවන් දක්වන්න බෑනේ. බුදුන් වහන්සේටවත්.

**උපාසක මහතා :** ඔබ වහන්සෙ කියන කොට හිත ඒ ඒ තැන්වලට පත් වෙනව මගේ. ඒ දේශනයක් ඇහුවම එතන තියෙන සියුම් තැනට මගෙ

හිත යනව ස්රෑස් ගාල. ඒ කියන්නෙ සමාධිය වගේ මනස එතෙන්ටම පත්වෙනව. ඒ පත්වෙන කොට තියෙන දේ තමයි මට ඒ තැන්වලට පත්වෙන කොට ඇඟ නිකන් සියුම්ව පැද්දිල පැද්දිල පැද්දිල ආපසු එක දිගටම වේගයෙන් පැද්දිල පැද්දිල...

**ආර්යයන් වහන්සේ :** දැන් ඔය වෙන දේ ඔබතුමා කලිනුත් කීවනෙ. ඔබතුමා දන්නවද? මොකක්ද වෙන්නෙ කියල.

**උපාසක මහතා :** දන්නෑ. ඒකනෙ ඔබ වහන්සේගෙන් දැනගන්න.

**ආර්යයන් වහන්සේ :** ඔය තමයි ඔබතුමා සෝතාපන්න මාර්ගයට එනව. ඒ කියන්නේ අනුසෝතය කියන්නෙ ආත්මීයව දැන් ඔය හිතන ඒව නෙවෙයි. හිතල කවුරුවත් නිවන් දකින්නෙ නෑ. හිතන එක වෙනම Path එකක්. ජානතො පස්සතෝ කියනවනෙ. හිතන එක වෙනයි. දැනෙන එක වෙනයි. දැන් මෙතන මේ සිතුවිලි කියන්නෙ විඤ්ඤාන මායාවනෙ. විඤ්ඤාන මායාව කියන්නෙ හීන දකිනව වගේනේ. විඤ්ඤාන මායාව කවදාවත් ඇත්තක් නෙවෙයිනෙ. නමුත් මෙතන තියනව අභ්‍යන්තරයේ අපට නොපෙනෙන ඒක සිතුවිලි නෙවෙයි. විඤ්ඤාන මායාව නෙවෙයි. දැනෙන ස්වභාවයත් එක්කල ඒ කියන්නෙ මෙතන තියනව වෙනමම පාත් එකක්. ඒක අඳුනගන්න ඕන. ඒක තමයි පරම සත්‍යයත් එක්ක එන්නෙ ටැලිවෙලා. ඒක තමයි ඥානයට දැනෙන්නෙ. ඥානය කියන්නෙ සිහිය වගේ එකක්. ඒකෙ නාම රූප නෑ. සිතුවිලි නෑ. ඒක තමයි අපි ඉපදෙන්න හේතුව. ඒක තමයි සාසවීය ස්වභාවය ඒක තමයි ආශ්‍රව කෙලෙස් හටගන්නෙ. ඒක ගම් එකක් වගේ. ඒක ඒ විදියට උපමා කලොත් ගම් එකක් වගේ. ගම් එකට ඇලෙනව වගේ අර ද්වාරවලට වර්ණ ගන්ධ රස පහස ඕබ්සෝව් කරනව, උරා ගන්නව. ඒවට මේව කම්පනය වෙනව. කම්පනය විම තුළ තමයි නැවතත් මේ කලලෙක සකස් වෙලා නැවතත් කම්පනවලට භාජනය වෙලා නැවතත් කෙලෙස් කියන ඒවත් එකක් අර ආත්මීය ස්වභාවයක, වින්දනීය ස්වභාවයක මෙතන එනව රාග, ද්වේෂ, මෝහ නැත්නම් තන්හාව නමැති අර බල ගැන්වීමක නැත්නම් ඒ තීව්‍රතාව. ඒ විවිධාකාර වචනවලට පැහැදිලි කරන්න පුළුවන්. ඒක තුළ තමයි අපි ගිනිගන්නෙ. ඒක තමයි ගින්න. ඒ ගින්න තමයි ඇලෙන ගැටෙන ගින්න තන්හාව ආශාව, ඒ ගින්න තමයි නිවිල ගිහිල්ල නැවත උපදින්න තියන ස්වභාවය ඇලෙන ගැටෙන ස්වභාවය ගින්න නිවිල

ගිහිල්ල. සාසවීය ගම්චික අපිට පේන එකක් නෙවෙයි. ඒක අභ්‍යන්තරේ තියනව මණ්ඩි වගේ. ආශ්‍රව කෙලෙස් සාසවීය ස්වාභාවය. ඒ සාසවීය ස්වභාවයම දියවෙලා ගිහිල්ල නැවත උප්පත්තියක් නැතිවෙනව. හැබැයි ඒක එන්නෙ මෙන්න මේ ආත්මීය ස්වභාවය බිඳ වැටෙනව.

මේක අනාත්ම ධර්මයක්. ආත්ම කතාවක්. කොහොමත් මේ ලෝකෙ කෙහෙවත් නෑ. ඒක බොරුවක්. ඒ බොරුව තමයි අපි මේ ජීවත් වෙන්න හේතුව. මේ ඉපදෙන්න හේතුව, ඒක තමයි. සතා සීපාව බොරුව තුළ උපදින ශක්තිය. ඒ තුළ උපදින ශක්තිය මේ චුම්භක ශක්තිය වගේ. විද්‍යුත් ශක්තිය වගේ තවත් ශක්ති ප්‍රභේදයක්. ඒක චිත්ත ශක්තිය කියලයි අපි කියන්නෙ. විඥ්ඥාන ශක්තිය කියල ඒ ස්වභාවය සකස් වෙන්න හේතු වෙන්නෙ ඔය බොරුව. ඒක බොරුවක් තමයි. ඒ බොරුව තමයි අර දේදුන්නක් වගේ. ඒක සකස් වෙන එකක්. ඒ සකස් වෙන එකේ ශක්ති ස්වභාවයක් තියෙනව. ඒත තරංග ස්වභාවයක සකස් වෙන්නෙ. ඒ ස්වභාවය තමයි මේ ආත්මීය මැරි මැරී ඉපදෙන ආත්මය ඒ සංඥා ස්වභාවය සකස් වෙනඑක. සකස් වෙන ස්වභාවය ආත්මීය ස්වභාවය තියනව කියන දැනීම තියනව කියල ගන්න එක. ඒ ස්වභාවය තියනකං හුස්ම ගියත් හුස්මට තමයි මේ මැෂින් එක ක්‍රියාත්මක වෙන්නෙ ස්වභාවය සකස් වෙන්නෙ. **හුස්මට තමයි සෙන්සස් ඔක්කොම උද්දීපනය වෙන්නෙ. මේ ආශ්වාස ප්‍රශ්වාස වාතයත් එක්ක. ඒක නවතින වත් එක්කම ඒ සම්පූර්ණ සෙන්සස් නවතිනව. එතකොට නැවතත් ඒක සකස් වෙනව කොතනකට හෝ අර අර තරංග වගේ. සර්කිට් එක තිබ්බොත් ඒක ඇලෙනව කොහෙ හරි. ඒක නැවතත් තිරිසන් සතෙක්ගෙ කලලයේ. එතන සකස් වෙනව.**

**ඊට පස්සේ එහෙමම නැවතත් ආයිමත් එනව ආයතන ටික හැදීගෙන අර විදියට ඇවිල්ල පිනවීම - ඇවිල්ල එතනත් ද්වේෂය, රාග ද්වේෂ මෝහ කන්සෙප්ට් එක ඇවිල්ල එතනත් තන්හාව තියෙනව කියල විඳ විඳ ඇවිල්ල, අර වගේ ඉන්නව. එතනත් ඒ ශරීර ධාතුව දිරා වැටෙන කොට ඒකත් අත් අරිනව. ඒකත් ඉවර වෙන කොට නැවතත් සකස් වෙනව.** ඔය වගේ යනව ලොකු කතාවක්. මෙතන මේ සාසවීය ස්වභාවය තමයි ඒකට හේතු වෙන්නෙ. ඒ සාසවීය ස්වභාවය කියන්නේ ආශ්‍රව නෙවෙයි. ඒ සාසවීය ස්වභාවය තමයි මේක මනෝ ස්වභාවයේදී සිද්ධවෙන්නේ

සසර උපදින්න තියෙන තන්හාව නමැති තන්හක්ඛයෝ නිබ්බානෝ කියන එක. 'වඩුව තා මා දුටිමි' කියල බුදුන් වහන්සේ කියන්නෙ ඒකයි. 'තට නැවත මේ ගේ සාදාගන්න මා ඉඩ නොදෙමි' කියල බුදුන් වහන්සේ දේශනා කරන්නෙත් ඒකයි. **මෙන්න මේ සාසවීය ස්වභාවය සත්‍ය දැකීම තුළම ඒ බොරුව එතනින්ම කුඩුවෙලා යනව. අවිද්‍යාව බිඳ වැටෙනව. මෙච්චර කාලයක් දීර්ඝ සසරක, ඒ කියන්නේ මේක ඇවිල්ල දිය සුළියක් වගේ. සසර ඕගයක් තමයි.** බුදුන් වහන්සේ පෙන්නන්නේ දිය සුළියක් වගේ ඒක. ඒ කියන්නෙ ඒක කැරකෙනව. කොතනද කැරකෙන්නේ ඒකට ගහගෙන යනව තියන ඔක්කොම අහුවෙනව. ඔක්කෝම ඕකෙ මේව වෙනව. ඊට පස්සෙ ඕක **සම්පූර්ණයෙන්ම සත්‍ය දැක්ක ගමන්ම බිඳ වැටෙනව. ඔය ශක්තිය බිඳ වැටෙනව. ඊට පස්සේ බැටිරි බැස්ස වගේ වෙන එක තමයි ඔබ තුමාගෙ ඔය කම්පනය වෙන්නෙදැන්.** ඒ කියන්නෙ මෙච්චර කාලයක් සසර ඉපදුනෙ මේ ආත්මීය ස්වභාවයක් දැනි දැනි ගිය එකක් උනේ. ඔබතුමා දන්නේ නැති උනාට එහෙම ගමනක් තමයි ගිහින් තියෙන්නෙ.

ඕක දැන් මේ මොහොතෙම ඔබතුමාට දැනෙන ස්වභාවය තමයි ඔබ තුමාට නැවත දුගතියකට නොවැටෙන, අර ඇත්ත දැනෙන ස්වභාවය. **ඇත්ත දැනෙන ස්වභාවය තුළ තමයි අර පටිසෝතයට එන්නෙ. අනුසෝතය බිඳ වැටෙනව. අර දිය සුළිය කැරකෙන ඒ රවුමට තමයි කැරකෙන්නෙ. අනිත් පැත්තට කැරකෙන්න ගන්නව. එතකොට දියසුළිය බිඳ වැටෙනව.** ඒක තමයි ඔතන ඉදන් ඔය ඔබතුමාගෙ අභ්‍යන්තරයෙන් එනව කුතුහලයක්. එකත් එක්කම ඔබතුමාට සත්‍ය දැනගන්න තියන ඕනකම තවත් වැඩිවෙනව. ඒකත් එක්කම ඔබතුමා මේ පටිසෝතය තුළ මේ ආත්ම භාවය වොස්සග්ග පරිනාමය නිවනට නැමුනක් කොට පවතිනව. ඒ කියන්නෙ ගඟට ඇලවෙලා තියන ගස ගඟටම වැටෙනව කියනව වගේ ඔබතුමාගේ ලෝකයක් ඇත්ත කරගත්ත මානසිකත්වය බිඳ වැටෙනව. ඒ බිඳ වැටෙන එක දරාගන්න බැහැ. සිතුවිලි නෙවෙයි අභ්‍යන්තරයට අභ්‍යන්තර ඒ සාසවීය ස්වභාවයට දරාගන්න බැහැ. ඒකත් එක්ක කම්පනයකට ලක්වෙනව. ඒ කම්පනය ගොඩක් අයට තියනව. මේ දේශන අහන විශාල පිරිසක් අපට ඒව කෝඩිනේට් කරල තියනව. විශාල පිරිසක් ඉන්නව මේ මොහොත වන විට ඒ කම්පනවලට ලක්වෙලා. මේ නැවත උප්පත්තියකට දුගතියට කොහොමටත් වැටෙන්නෙ නැහැ. සසර

ඕසයෙ නිමාව දකින විශාල පිරිසක් සකස්වෙලා තියනව. දැන් මේ වෙනකොට.

**උපාසක මහතා -** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඒක අපි හිතනවට වැඩිය විශාලයි. අපි හිතන්නෙ ටිකයි කතා කරන්නේ. බොහොම ටිකයි. නමුත් ඒක අපිට සැලකිය යුතු ප්‍රමාණයක් වගේ දැනෙනව. මොකද මේ Call ඇවිල්ල තියන විදියට. ඒ Call ඔක්කොම අපි කෝඩිනේට් කරල තියෙනව ඒ No ඔක්කොම අපි ලියාගන්නව. ඒකට හේතු තියනව.පොඩි සමීක්ෂණයකට වගේ දේකට. කාට හරි යම්කිසි දේකට ඒක වැදගත් වෙනව. ඒක නිසා ඒ අයට නැවත කතා කරල ඒ අය දියුණු වෙනවද, ඔටෝමැටිකලි, සිස්ටර්මැටිකලි යනව කියල අපි කියන්නෙ. ඒ සිස්ටර්මැටිකලි යනවද කියල බලන්න කාට හරි පුළුවනි. ඒක නිසා අපි සමීක්ෂණාත්මකව ඒක ලෝක ප්‍රජාවටම වැදගත් වෙනව. ඒක නිසා අපි හැම No එකක්ම අපි සඳහන් කරනව වෙනම පොතක. ඒ නිසා ඒ අයට ඒ අවශ්‍ය මේ සත්‍ය ඇසීම තුළ ඒ අය සුගතිපරායන වෙන ආකාරය පැහැදිලි කරන්න අපිටත් හැකියාව තියනව. කෙනාගෙ කෙනාගෙ ස්වභාවවලට ඒ ගොල්ලොම ඒ ගොල්ලන්ට සිද්ධවෙන දේවල්, ඒ ගොල්ලො සුගතියට හැරෙන හැටි ඒ ගොල්ලෝ පෙන්නුම් කරයි. මොකද මේක ප්‍රත්‍යක්ෂ ධර්මයක්. සන්දිට්ඨික ධර්මයක්. කවුරුත් එහෙම කරන දෙයක් නෙවෙයි. අපි උනත් එහෙම කරන දෙයක් නෙවෙයි. අපි කරන්නෙ ධර්මය සත්‍ය හෙළිකරනව පමණයි. ඉතිං ඒක, කෙනාට කෙනාගෙම මිදීමක් සසර ගමන සිද්ධ වෙනව. ඒක ලොකු භාග්‍යයක් ඒ අයට.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමින් වහන්ස. ඔබ වහන්සේගෙ දේශනාවල අර සියුම් සියුම් තැනටම කියන කොට සංඥාවේ සුකුමත්වර කියනකොට ඔබ වහන්සේ කියන හුඟක් දේශනා මම ඒ ගැඹුරු ඒව ගොඩක් ඇහුව. ඒ අහන කොට මට වැටහෙන්නෙ මට තේරෙන්නෙ මම එතනට ඒ ඒ තැන්වල ඒ ඒ වෙලාවට එතනටම යනව. ඒ යනකොට මේ නිකං හරියට මේ ලොකු බැලුම් බෝලෙකට වතුර පුරවල බිම කෙලින් තියන්න සෑජුව තියන්න බැරුව එහාට මෙහාට එහාට මෙහාට නොයා එය පෘෂ්ඨයමත පිහිටන්නැතිව හෙලවෙන්නෙ අන්න ඒවගෙ තමයි මේ ශරීරෙ. ඒ ඒ අවස්ථාවේදී මම බලනව මේ මොන මානසික තත්ත්වයක්ද,

මොකක්ද මේ සාධකය මොකක්ද මෙතන වෙන්නෙ කියල. එහෙම වෙලා ආපසු සිත බලනව පරණ තිබ්බ තැනට හිටගන්නේ කියල ඒ කියන්නෙ භවය කියන එක අල්ලගෙන උපාදනය වගේ වෙලා ඉවර වෙලා මෙතනට හිත ගන්න උත්සාහ කරනව වගේ මට තේරෙනව. අර ඒ තැන්වලදි ඒ මොහොතට බලනව කය ඍජු කරගන්න. අන්න එහෙම තේරුමක් තියනව.

**ආර්යයන් වහන්සේ :** ඒ කියපු ටික හරි. ඔබතුමා ඒ පැහැදිලි කරපු දේ ඇත්තම ඒක තමයි. ඒක දැනෙන විදියටනෙ ඔබතුමා පැහැදිලි කළේ අපි කියල නෙවෙයිනෙ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි ඔබතුමා උපමාව ගත්තු විදිය හරි. කෙලින් කරගන්න බලනව. නැවත ආත්මය හදාගන්න දඟලන උත්සාහය තමයි ඔය කම්පන වෙන්න හේතුව.

**උපාසක මහතා :** හරියට හරි ස්වාමීන් වහන්ස එහෙමම තමයි.

**ආර්යයන් වහන්සේ :** කවුරුත් කරනව නෙවෙයි. ඒක ස්වභාවිකවම එහෙමම ඔටෝමැටිකලි හැදෙන්න ගන්න උත්සාහය. මේක බිල්ඩ් වෙන්න උත්සාහ දරනව. මේක බිඳ වැටෙනව දේශනය තුළම බිඳ වැටිල නැවත රීබිල්ඩ් වෙලා තමයි ඔබතුමා ඊට පස්සෙ නැවත බිලන්ස් වෙන්නෙ.

**උපාසක මහතා :** එහෙමයි. හරියට ම හරි ස්වාමීන් වහන්ස. ඔබ වහන්සෙ කිව්වොත් හරියටම හරි මේක මට දැන් ඔබ වහන්සේගේ No එක දැනගත්තට පස්සෙ මේක දැන් මට නිර්වචනයක් ගන්න බැහැනෙ. මම හරිද මම වැරදි ද කියල.

**ආර්යයන් වහන්සේ :** ඔතන කිසිම ප්‍රශ්නයක් නැහැ. **ආත්මීය ලෝකයක් කියල අල්ලගත්ත එක බොරුවක්නෙ. ඒ බොරුව කවදාවත් ඇත්ත වෙන්නෙ නැහැ.** ඒක නිසා ඕක ගැනීමත් පුදුමාකාර භාග්‍යයක්. ඕක ලේසියෙන් දැන ගන්න බැහැ. මේ ධර්මය නම් ලේසි නෑ කාටවත් ඒක අවබෝධ කරගන්න. ඇත්තට ම ලේසි නෑ. අවබෝධයට පත්වෙන්නම ඕන මිනිස්සුන්ට මොකක්ද මේ තියෙන්නෙ කියල.

**උපාසක මහතා :** එතන තියෙන්නේ අර අර වටින්නෙම මොකක්ද දේශනවලට ගිය තැනටම යනවනෙ ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඔටෝමැටිකලි ෆ්‍රීක්වනස් වෙනව. මේ පැත්තෙන් ශූන්‍යතාවය එනවනෙ විකාශණය කරනව වගේ නාලිකාව එනව. ඔය පැත්තෙන් ඒක ෆ්‍රීක්වන්ස් වෙනව ටියුන් කරනව හරියටම ශූංයතාවය ඒ ටියුන් කරනකොටම ඔතන ආත්මීය ස්වභාවය බිඳ වැටෙනව. මේ පැත්ත තනිකර ශූන්‍යතාවයට තනිකර ටියුන් කරන්නෙ. ඒ ශූංයතාවය ඔය පැත්තෙන් ටියුන් කරනව. ටියුන් කරන කොට ඒ විඤ්ඤාන ධාතුව ටියුන් වෙනව. ටියුන් වෙලා ආත්මීය ස්වභාවය කුඩුවෙලා යනව. කුඩුවෙලා දේශනාව තුළම අහන් ඉන්න වෙලාවෙම ඇත්තටම පටිසෝතෙට ඇවිල්ල සෝතාපන්න මාර්ගයට එනව ඒ මොහොතෙම. ඕක තමයි අපි දැම්මේ සත්‍ය ධර්මය අසන මොහොතෙම සෝතාපන්න වෙනව කියල. දේශනා ප්‍රාතිහාර්ය ගැන දේශනා තුළ බුදුන් වහන්සෙ ගොඩක් පෙන්නලා තියනව. බුදුන් වහන්සේ පැහැදිලි කරනකොටම මට වැටහුනා ස්වාමීනි මට වැටහුණා ස්වාමීනි. යටිකුරු කරපු දෙයක් උඩුකුරු කලාවගේ ස්වාමීනි කියල. ඒ සංඝයා වහන්සේලාටත් ඒ දේම සිද්ධ වෙනව. ඒ කම්පනය කම්පනයවීම තුළම ඒ කතා කරන වචන ටිකෙන් තේරෙනව. මට වැටහුනා ස්වාමීනී. මට වැටහුනා යටිකුරු කළ දෙයක් උඩුකුරු කලා වගේ. මේක නේද ස්වාමීනි කියල මේ ඒක තමයි ඒක තමයි. හිත මෙච්චර කල් ආත්මීය දෙයක් කියලනෙ හිතාගෙන හිටියෙ. ධර්මය ඇසෙන මොහොතෙම යමෙකුට ඒක ඇහෙන්න ගත්තට පස්සෙ මේක මේකනේ. මේක ඇත්තනේ කියල ඊට පස්සේ ඇතුලෙන් ඔක්කොම කුඩුවෙලා යනව.

**උපාසක මහතා :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි ඔය බුදුසමය තුළ දේශනා ගොඩක් තියනව. එකක් දෙකක් නෙවෙයි. දැන් පස්වග තවුසො කියන්නෙ පස්දෙනෙක්නෙ. ඔක්කොම තවුස්වරුනෙ. ඒ ගොල්ලො අනිත් එක ගුරුවරුනෙ. බුදුන් වහන්සේ ගෝලයෙක් විදියට හිටපු කෙනෙක්නෙ. පස්වග තවුසන්ටම නැවත ඇවිල්ල ධර්මය දේශනා කරන්න යනවනෙ. එතකොට පෙර නොඇසූ විරූ දහමක් කියල මේ තියන එකක් නොවේනෙ කියන්නෙ. මේක වෙනස්ම, වෙනස් ම ලෝක සම්මුතියට පටහැනියි ඇත්තටම. ලෝක සම්මුතිය තියෙන්නේ ආත්මීය ස්වභාවයක් ඇතුළෙ දෙයක් තියනව කියල ගන්න තැන. නමුත් එහෙම දෙයක් නෙවෙයි බුදුන්

වහන්සේ දේශනා කරන්නෙ. සම්පූර්ණයෙන් ම ඊට විරුද්ධව, ඒ දේශනය අහනකොටම කොන්ඩඤ්ඤ තාපසතුමාට වැටහෙනවනෙ. වැටහෙන කොටම බුදුන් වහන්සේ කියනව අන්න කොන්ඩඤ්ඤ තාපසතුමාට වැටහුනා කියනවනෙ. අඤ්ඤා කොන්ඩඤ්ඤ කියන වචනෙ කියන්නෙ ඒ මොහොතෙනෙ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමින් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඒකයි බුදුන්වහන්සෙ බුද්ධත්වයට පත්වෙලා මේ ධර්මය දේශනා කරනවද, නැද්ද කරන්නබෑ වගේනෙ. අපිටත් ඒකනෙ දැනෙන්නෙ. මේක මේ ආත්ම කතාවකුත් නෑ. මේක සොබාදහමක් මේකෙ තියෙන්නෙ අනාත්ම ධර්මයක්. මේකෙ ස්වභාව ධර්මයේ කතාවක්. දැන් අපි කියන්නෙ ශබ්ද වර්ණ, භෞතික පැත්තෙන් සවිඤ්ඤානකත් නෑ - අවිඤ්ඤානකයි. මේ මොකුත්ම නෑ. මේක කවුද පිළිගන්නෙ. කවුරුත් පිළිගන්නෙ නෑ. දැන් බුදුන් වහන්සේ බුදු සමයට ගියාම පළවෙනි කෙනාගෙ මේක කියන එතකොට බුදුන් වහන්සේට ලොකු ගැටළුවක් වෙනවනෙ. මේක කවුරුත් පිළිගන්නෙ නැත්තන් මොකද වෙන්නෙ. බුදුන් වහන්සෙ අධෛර්ය වෙනවනෙ. ඒකනෙ බුදුන් වහන්සේ හොය හොයා යනවනෙ. පස්වග තවුසෝ හොයන්නේ ඇයි? උපක හම්බවෙනව. උපකට කියන්නෙත් නැහැනෙ. කාටවත් කියන්න බැහැනෙ මේක. කිව්වොත් එහෙම එලෝගෙන එනව අනිවාර්යයෙන්ම ඊට කලින් මේක එළිකරන්න එපැයි හරි කෙනෙකුට තේරෙන කෙනෙකුට. ඊට පස්සෙ බලනව ආලාරකාලාමත්නෑ. පස්වග තවුසො හොයාගෙන ගිහිල්ල බලනව මේ ගොල්ලන්ටවත් මේක තේරෙයිද කියල. ඒ කියන කොට එක්කෙනෙකුට තේරුණානෙ. කොන්ඩඤ්ඤට තේරුණානෙ. ඒකයි බුදුන් වහන්සේ අන්න කොන්ඩඤ්ඤට තේරුනා කියල චිත්ත ප්‍රීතියක් ඇති වුනේ. ඒකෙන් ධෛර්යයක් ඇතිවෙනව. ඒක තව කෙනෙකුට තේරුණොත් බුදුන් වහන්සෙ දන්නව අනිත් අයටත් මේක තේරුම් කරන්න පුළුවන් කියල.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** අන්න ඊට පස්සේ තමයි බුදුන් වහන්සේ ඇත්තටම හතර දෙනෙකුටම තේරෙන්නැනෙ, 'ධම්මචක්කපවත්තන

සූත්‍රය' එක්කෙනාටනෙ තේරෙන්නෙ. එතකොට තේරෙනව බුදුන් වහන්සේ කොයිතරං වීරියක් අරගෙනද මේක දේශනා කරන්නෙ කියල. එතකොට තමයි 'අනන්තලක්ඛණ සූත්‍රය' ඒක බලනකොට මේ එකකවත් මේ මොකක්වත්ම නෑ වෙන කතාවක්. දිව්‍යලෝක කතා අරවමේව සේරම. අපේ මේ තව දේශනා තියනව ඉස්සරහට දාන්න. ඒව දැම්ම ම තේරෙයි මොකක්ද මේ ඇත්තම කතාව කියල. මේ වෙනකොට දාල තියන දේශනා ඔක්කොම බැලුවම අවංකවම නිර්මලව ඒ සත්‍ය ධර්මය හෙළි කරගෙන යන්නෙ. ඇයි කිසිම දෙයක් අපි හදලවත් කියන්නෙ නෑ ගොතලවත් කියන්නෑ අපි ඇත්තමයි කියන්නෙ. කෑලි කෑලි කපල දැම්මත්, මෙච්චරයි කියලමයි කියන්නෙ. ඒ කියන්නෙ අපිට ඒ තරමට ම ප්‍රත්‍යක්ෂයි. නැත්නම් අපි කියන්නෙ නෑ. මේ අපි කියන හැම දෙයක් ම ඉස්සරහට තවත් ගොඩක් ආන්දෝලනාත්මක ඒව එයි. ඒව සේරම ඇත්තම අපි දන්නව ඒක තව කෙනෙකුට ප්‍රතක්‍ෂ වෙන බව අපි මේ නාලිකාව තුළ බලා ඉන්නෙ තව කෙනෙකුට ප්‍රත්‍යක්ෂ වෙන එක දිහා ඒ අයට ප්‍රත්‍යක්ෂ වෙනකොට ඒ අයටත් ඒක ඊට පස්සෙ ගැටළුවක් නෑ. කෙනෙකුට ප්‍රත්‍යක්ෂ නම් එච්චරයි. ඒකයි වැදගත් වෙන්නෙ.

**උපාසක මහතා :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම මේක දේශනා ප්‍රාතිහාර්ය කියල කියන්න පුළුවන්. මේක ඇවිල්ල කෙනෙක් පුද්ගලයෙක්නෑ. මේ පැත්තෙ හොයන්න යන්න එපා. එහෙම සත්ව පුද්ගල කතාවක් නෑ. මෙතනත් ෆ්‍රීක්වන්ස් වෙනව ශූන්‍යතාවයට. මේ ශරීර කූඩුවක් ෆ්‍රීක්වන්සි වෙන්නෙ සොබාදහම වෙන එකක් නෙවේ. ඒ සොබාදහමම තමයි එතකොට මේ භාෂාව විදියට පෙරලලා අනිත් පැත්තට ඉදිරිපත් කරන්නෙ. එතකොට ඒක සත්ව පුද්ගල කතාවක් නෑ. මෙතන ඒක තමයි 'බුද්ධ ස්වභාවය' කියල කියන්නෙ. ඒක ඔය පැත්තත් ෆ්‍රීක්වන්ස් කරන ගමන් සොබාදහම දකිනව කියන එක වෙන මුකුත්නෑ. ඒකයි මෙතන කෙනෙක් පුද්ගලයෙක් හොයන්න එපා කියන්නෙ. මේ සොබාදහමම පමණයි. සොබාදහම කියල දේකුත්නෑ. ඒක දකින්න මහා නුවනක් ඕන. ඒක ඇතිවෙන්නෑ එක පාරම. සමහර අය ටික ටික ටික ටික තමයි නුවන වැඩීගෙන ඇවිල්ල ඒ අවබෝධය කරා එන්නෙ. ඒක සොබාදහමෙ න්‍යායට අනුවයී ක්‍රියාත්මක වෙන්නෙ. ඒක ඉතිං ඒ දීර්ඝව පැහැදිලි කරනව. වයස කීයක් විතරද? මොනවගේ වෘත්තියක් ද කරන්නෙ.

**උපාසක මහතා :** මම හෙද සේවය කරල දැන් පෙන්ෂන් ගිහිල්ල ඉන්නේ ස්වාමීන් වහන්ස. මට දැන් හැටයි ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** මේක මේ මොහොතෙදි හරි මේ වයසෙදි හරි මේක අවබෝධ කරගන්න ලැබිල නැත්නම් ඔය සතෙකුට මේක තේරෙන්නෙ නැහැ. දැන් ඉස්සරහට පැහැදිලි කරන ඒව ඔබතුමාටත් ඇහෙනව ඇති මොකද මේ ස්වභාවය සකස්වෙනව. මේක මේ බොරුවක් නොවේ. මේක සත්‍යයක් මේක සකස්වෙනව. මේක සකස් උනාට පස්සෙ සතෙක්ගෙ ස්වභාවය තමයි ඉතින් කියන්න තියෙන්නෙ. සතාට දැනෙන දේ තමයි ඊට පස්සෙ දැනෙන්නෙ. ඊට පස්සෙ ඕක යනව චක්කරේ වගේ. ඒක යනව රොටේට් වෙවී. දියසුළිය වගේ. ඒක සසර ඕඝය තමයි. ඒක සකස් වෙනව. මේ මනුස්සභාවය දිගටම තියනව නොවේ. මේක කලලවල සකස්වෙනවා සකස්වෙන තැන්වල ඒ විඥ්ඥාණ ධාතු සකස් වෙනව. අපි කියන්නෙ ඒක තමයි සකස්වෙන තැන්වල විඥ්ඥාන ධාතුවල, විඥ්ඥාණ ධාතු කියන්නෙ කොහෙවත් තියන එකක් නෙවි. ඒව දැනීම් පද්ධතිවල සෙන්සස්වලින් ස්පාක් වෙන ස්වභාවය තුළයි ශක්ති ස්වභාවය සකස් වෙන්නෙ. නැතුව මේ මෙහෙන් මොකවත් යනවා නෙවෙයි. එතන එතන සකස් වෙනව. **දැන් මෙතන තියන සිරස නෙවෙයි යාපනේ අහුවෙන්නෙ. හැබැයි ඒක සිරස නෙමෙයි කියන්නත් බැහැ.**

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීනි

**ආර්යයන් වහන්සේ :** හැබැයි ඒක මෙතන තියන එකක් නෙවෙයි. **ඔන්න ඔය වගේ එතන තියන අංශූ එතන සකස් වෙනව කියන එකයි සම්භූත වෙනව කියන්නෙ. සම්භූත වෙනව කියන එක එහෙම කෙහෙවත් යන එකක් නෙවෙයි. එතන සකස් වෙනව. සකස් වෙවී නැතිවෙන ප්‍රවාහයක් තමයි.** එහෙම දෙයක් කියල කොහෙවත් නෑ. සකස් වෙන සකස්වෙන නැතිවෙන සකස්වන ප්‍රවාහයක්. ගඟ කියන්නෙත් එහෙමනෙ. එහෙම දෙයක් නෑනෙ කොහෙවත්. ඒක වේගෙටයි කියන්නෙ. ඒකයි ප්‍රවාහයක් කියන්නෙ. වැස්ස කියන්නෙ ප්‍රවාහයක්. සුළඟ කියන්නෙ ප්‍රවාහයක්. ඒක ඇතිවෙන නැතිවෙන ප්‍රවාහයක්. ඇතිවෙන නැතිවෙන ප්‍රවාහයකට තමයි චිත්තය කියන්නෙ. මේ ශක්තිය කියන එක කොහෙවත් තියන එකක් නෙවේ. ඒක ඇති වෙන නැතිවෙන ප්‍රවාහයක්. දැන් විද්‍යුතය ගත්තත් එහෙමයි. ඇතිවෙන නැතිවෙන ප්‍රවාහයක් කරන්ට් එක.

**උපාසක මහතා :** ස්වාමීන් වහන්ස එතකොට මේ චිත්තය කියන එක සොබාදහමේ සතරමහා ධාතුවේම හටගන්න තවත් එක් ශක්තියක් ද?

**ආර්යයන් වහන්සේ :** ඔය වචන ඔක්කොම වැරදියි. ඒ කියන්නෙ සතර මහා භූත කියල දේකුත් නෑ. ඒකත් අපි දාගත්ත වචන ටිකක් තියෙන්නෙ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියල එහෙම කොහෙවත් එහෙම තියෙන දෙයක් නෑ. එතන එතන සකස්වන ස්වභාව ටිකක්. ඒ ස්වභාවවලට දාගත්ත නම් ටිකක්. එතන අපිට ඕන ශක්තිය කියල කියන්න පුළුවන්. ශක්තිය කියල දේකුත් නෑ. ඇත්තම කිව්වොත් එහෙම ඒව ඔක්කොම අපි දාගත්ත නම්නෙ. එතන එහෙම මොකක්වත්ම කතාවක් නෑ. ඇත්තටම අර හේතු තියෙන කොට සකස් වෙනව. හේතු නැතිවෙන කොට නැති වෙනව. ඒක තමයි ස්වභාවය. **දැන් මෙතන තියන අංශු ටික ඝනවෙලා පඨවි වෙනව ආයි ඒක ඒ අංශු ටික ලිහිල් උනොත් ද්‍රව වෙනව. තව ටිකක් ලිහිල් උනොත් වායු වෙනව. තව ටිකක් ලිහිල් උනොත් ඒක හොයන්න බැහැ. ඒක ඝන වෙන්නෙ ඉතින් තව ධාතු සීතල, උණුසුම වගේ තව සාධක ඒකට එකතු වෙනව.** ඒ සාධකත් එක්ක මේකත් වෙනව. **එතන එතන සකස් වෙනව. තියන එකක් කොහෙවත් නැහැ. පඨවි කියල දේකුත් නෑ. වායෝ කියල දේකුත් නෑ, ද්‍රව කියල දේකුත් නෑ, තාපය කියල දේකුත් නෑ. ඔක්කොම එකම ඒ කියන්නෙ ඒකම සම්භූත වන ස්වභාවයක් තියෙන්නෙ.**

**උපාසක මහතා :** ඒකෙම ප්‍රතිඵලයක් ද මේ වගේ දැනීම කියන එක එන්නේ?

**ආර්යයන් වහන්සේ :** මේ Spark එකක් තියෙන්නෙ. ඒක තමයි ඒක පෙන්නන්න තමයි ඊගාව සිත කියන්නෙ. ඒ කියන්නෙ රූපන්තිකෝ අවුසෝ රූපං කියන්නෙ ඉද්දෙනව කියන්නෙ, උෟයි කියල කියන්නෙ මොකක් හරි කට්ටක් ඇනුනම අන්න ඒ වගේ මේ සෙන්සර්වලට Spark වෙනව. ශබ්දෙට Spark වෙනව, දැන් මේ Spark වෙන කොට වෙනකොට ෂොක් එකක් වගේ වෙනවනෙ. අන්න ඒ ෂොක් එක නිසා තමයි මේ කරන්ට් එක වගේ මේ තියනව වගේ දැනෙන්නෙ. Spark වෙන වේගය වැඩි නිසයි. ඒ Spark එක නවතින්න කලින් තව Spark එකක් වේගය තුළ එකට එකතු වෙලා දෙයක් වගේ දැනෙනව.

**උපාසක මහතා :** ගලායන එකක් වගේ තේරෙනව. මම කියන හැඟීමක් වගේ එකක්.

**ආර්යයන් වහන්සේ :** ඉවරවෙනව. ඉවර වෙන එකක් අපිට අහුවෙන්නෑ. මොකද වේගෙ වැඩියි. දැන් ටයර් එක එක වටයක් කැරකිලා නතර උනොත් ඉවරයිනෙ. යන්නෑනෙ කොහෙවත්. දිගටම කැරකෙනව කියන්නෙ ඒක නවතින්නෙ නෑනෙ.

**උපාසක මහතා :** දැන් ස්වාමීන් වහන්ස High way එකක එකම වේගෙකින් එකම දිසාවට වාහන 2ක් යනව නම් එකම විදියට අල්ලපු එකේ ඉන්න කෙනත් එකක් සම්බන්දෙ තියාගන්න පුළුවන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඔව් ඒක තමයි එකම වේගෙන් වාහන 2ක් යනව නම් අපිට වාහන දෙකේම ඉන්න ඒ දෙන්නට, යන්නෑ වගෙත් පේන්න පුළුවන්නෙ. දෙපැත්ත බැලුවොත්.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** අන්න ඒ දෙන්න ඉන්නව වගේ දැනෙන එක, අන්න ඒ වගේ දෙයක් තමයි මේ තියනව කියල ගන්න එක.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස අර වේගය නිසා තමයි අපිට ඉන්නව වගෙ තේරෙන්නෙ. ඔබ වහන්සේ පෙන්නන අර බිදි බිදී යාම නිසා තමයි අපිට ඒක අර තියාගන්න උත්සාහ කරන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඒක ඇත්ත. මේ වේගයේ තියන Spark එක ෂොට් එහෙක තියෙන්නෙ. ඒකයි මෙතන මේ Spark වෙනව කියන්නෙ පින්තූර අර කැමරාවෙ වේගයෙන් ෆොටෝ ගන්නෙ. අර වේගයෙන් ෆොටෝ ටික වැටෙන එකනෙ Film එක පේන්නෙ. අන්න ඒ වගේ තමයි අපිට මෙතන Film එකක් වගේ පේනව.

**උපාසක මහතා :** එතකොට ස්වාමීන් වහන්ස මේ නිරෝධය කියන තැන Spark වෙන්නෙ නැද්ද මොකවත්

**ආර්යයන් වහන්සේ :** ඇයි ඉතින් නිරෝධය කියන තැන කරන්ට් එක මෙතන ඇවිල්ල Spark එක තුළ ආරෝපනයක්නෙ ඇවිල්ල තියෙන්නෙ. Spark එකක්නෙ. දැන් චුම්භකය කැරකෙනව. චුම්භකය කැරකෙන

කොට බයිසිකල් ඩයිනමෝ උපමාව කැරකෙනවනෙ. කැරකෙන කොට දැන් නැති දෙයක් තියනව වගේනෙ දැනෙන්නෙ. ඒකනෙ නොගැලපෙන අන්ත දෙකක්නෙ. නැති දෙයක් තියනව කියන්නේ නැති දෙයක් තියෙනව වගේ නොගැලපෙන අන්ත 2ක් කැරකෙන කොට වේගයෙන් මොකද වෙන්නෙ වේගය තුළ අර නෙගටිව් පොසිටිව් වයර් 2 ගිහිල්ල ලයිට් එක පත්තු උනා වගේ, දැන් තණ්හාවක් උපදිනව. තණ්හාව ඉපදිලා තියෙන්නෙ, හැබැයි තියෙනවා වගේ දැනෙනව. හැබැයි නැති දෙයක් මේ කොහෙවෙත් එහෙම එකක් නෑ. නමුත් දැන් මේ වේගය තුළ මේක අර පින්තූර ගොඩක් වැටෙන එක එක පින්තූරයක් වැටිල නැවතුනෝතින් නිරෝධය ඒ පින්තූරේ තුළම තියෙනව. එතන ආත්ම කතාවක් නැහැනෙ. අපි කිව්වොතින් මෙතන පින්තූරයක් තියනව කියල. අපි කියන්නෑනේ එතන ආත්මයක් තියෙනව කියල. එක පින්තූරයක් අන්න ඒ වගේ පින්තූරයක් නෙවේ දැන් තියෙන්නෙ, පින්තූර වේගෙන් එවපු ෆිල්ම් එකක්. Film එකේ කතාවක් තියනව. Film එකේ අරව තියනව. මේව තියනව. මේව වෙනව අර වේගය තුළ ඒවා ඇත්ත කරගෙන දැන් ඉන්නෙ.

ඒක දෙයක් වෙලා. මේ දැනෙන දැනීම තමයි අපි කියන්නෙ අර මි.වෝ. 5ක කරන්ට් එක උපදිනව වගේ ආරෝපනයක් එනව. ආරෝපනය කියල කියන එක අර බල්බ් එක Spark වෙවී තියෙන්නේ ආලෝකයක් පේන්නෙ. දැන් ආලෝකයනෙ අපිට පේන්නෙ බල්බ් එක කියල. ඒ උනාට මෙතන වෙන්නෙ Spark එකක්. Spark වීම තුළ ආරෝපනය ආලෝකය වගේ එන එක. ඒ වගේ අපිට මේ තියනව වගේ, ලෝකයක්. ලෝකයක් නෑ කොහෙවත්. ලෝකයක් තියනව වගේ එනඑක තමයි ඇත්තටම. ඒ වගේ මෙතන ආත්මයක් නැහැනේ. දෘෂ්ඨියක්නෙ. මායාවක් නෙ. ඒ මායාව තමයි මොකක්ද මේ ආත්මෙ කියන්නෙ. රූපෙද? "රූපං අත්ථංවා අත්ථතෝ සමනුප්පස්සති, රූපං අත්ථංවා අත්ථතීවා සමනුප්පස්සති, රූපං අත්ථංවා අත්ථතෝවා සමනුප්පස්සති" කීවෙ. මේ කණ්ණාඩියෙන් දැක්ක අපේ ඡායාව අපි හිතං ඉන්නව ආත්මයක් කියල. දැන් ඇත්තටම කිව්වොත් හෙම මේ මැෂින් එක ඇව්ල්ල මෘත කලාබරය, ශරීර කූඩුව ඇව්ල්ල කර්මාන්ත ශාලාවක් වගේනෙ. මේකේ ආශ්වාස ප්‍රශ්වාස වෙන එක අපි හිතල හුස්ම ගන්නෙත් නෑනෙ. සිස්ටමැටිකලිනෙ ඒක වෙන්නෙ. ඒකේ පොම්පේ හැටියට එකේ හැටියට මේකෙ ආශ්වාස ප්‍රශ්වාස සිද්ධ වෙන්නෙ මේක නවතින්නෑනෙ.

අපි හිතල හුස්ම ගන්නෙත් නෑනෙ. එතකොට ඒකත් එක්ක පෙනහැල්ල ස්පන්ධනය වෙනවනෙ. ඒකත් එක්ක හාට් එක වැඩ කරන්න ගන්නවනෙ. ඒකත් එක්ක රුධිර සංසරන වේගය වැඩි වෙනවනෙ. ඒකත් එක්ක මේක ලොකු බලාගාරයක් වගෙ. එක පැත්තකින් අක්ෂි කාචයට එන්න ඕන. වරණ ඔපය එනව. කේෂනාලිකා ඔස්සේ වායු දහරා ඔස්සේ ඇවිල්ල එතන අර ප්‍රසාද රූපයට හැදෙන්න ඕන ඒ රසදිය වැටෙන්නා වගේ ඒක ශුද්ධ වෙනව. තව පැත්තකින් අර කර්ණසංඛ පටලය හෙල්ලෙන ඒ ටික සිද්ධ වෙනව. ඊට අමතරව මුළු ශරීරෙම සෙන්සර් එකක් විදියට වැඩ කරනව. මුළු ශරීරෙම රෝම කූපවලම තියෙනව. මුළු ශරීරෙම හැම සෛලයක්ම සෙන්සර් එකක්. ඒක උණුසුම, සීතල, තද ගතිය මුළු ශරීරෙම සෙන්සස් බලනකොට සෙන්සස් පද්ධතියම බලාගාරකින් නිර්මාණය වෙනව වගේ. ඒකෙ රස දැනෙන එක, ඒකෙ ගන්ධය දැනෙන එක දැන් මේ තනිකරම සෙන්සස් පද්ධතියක් තියෙන්නෙ. ඒරියල් පද්ධතියක් තියෙන්නෙ. වටේම ගහල වගේ. එක පැත්තකින් ආලෝකය, එක පැත්තකින් ශබ්දය තව පැත්තකින් මේකෙ දැන් කොහෙට ආවත් රශ්මිය දැනෙවනෙ. එතකොට මුළු ශරීරයම සෙන්සස්නෙ. සෙන්සස් එකක් විදියට ක්‍රියාත්මක වෙනව. මුළු ශරීරයම ඒ විතරක් නෙවේ මේක සම්පූර්ණම බලාගාරයක්. මේක මෘත කලාබරය කියන්නේ මේක ඇත්තටම මේක කර්මාන්ත ශාලාවක්. මේ කර්මාන්ත ශාලාවට Out Put එක තමයි. කර්මාන්ත ශාලාවක නිපදවීමක් තියනවනෙ. Out Put එක තමයි ආත්මය කියන්නෙ. ආත්මය කියන එක ශරීරය නෙවෙයි. දැන් හිතනෙ නැතිවෙන්නෙ. හිත මැරුණ නිසානෙ, කය වලලන්නෙ ආශ්වාස ප්‍රශ්වාසය නැති වෙච්ච ගමන් සෙන්සස් ටික ඉවරයි. ඊට පස්සෙ කියනව මැරිලයි කියල. දැන් මේක හැම මොහොතෙම සිද්ධ වෙනවනෙ. හැම මොහොතෙම මේ සෙන්සර් එක Spark වෙලා නැති වෙනව.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීනි

**ආර්යයන් වහන්සේ :** හැම ක්ෂණයේම මේ සෙන්සර් එක Spark වෙනව. වේගෙ වැඩි නිසා අපිට මේක පේන් නෑ.

**උපාසක මහතා :** දැන් එතකොට සෙන්සර් එක නැත්නම් මේ විශ්වය පවතින්න ක්‍රමයක් නැහැ. සෙන්සර් තමයි මේ.

**ආර්යයන් වහන්සේ :** ඔව් අපිට ඔක්කොම එකතු වෙච්ච එකක්නෙ පේන්නෙ. දැන් නැතුව එළියෙ තියෙන ප්‍රශ්නයක් නෙවෙයිනෙ මේ තියෙන්නෙ. මේ තියෙන්නෙ දැන් එනකොටම මේසයක්නෙ එන්නෙ. ඇල්ලුවොත් තද ගතියක්, ඉඹල බැලුවොත් ගඳක්, ඇහැට පෙන්නෙ වර්ණයක්, කණට ඇහෙන්නෙ සද්දයක්. කොහොමද මේසයක් ආවේ. මේසෙ කියන්නෙ එක අර මුලින් ම ස්පාර්ක් වුන අර ප්‍රේම් එක අපි ගත්තු ෆොටෝ එකේ තියනව මේ එන හැඩතලය මේ ශබ්දේ මේසෙ ඒකට තියන රූපෙ අර මේ සේරම තියනව පළමුවෙන් ගත්ත ෂොට් එකේ. කැමරාවෙන් ගත්ත ෆොටෝ එකේ ඒ පොටෝ එක ඇවිල්ල ප්‍රේම් එක. අපි කිව්වෙ පොතක හතරැස් කොටුවක් ගහල ඒකෙ ලියනව මුලින්ම එන සෙන්සස් ටික. අම්මගෙ හැඩතලය අම්මා කියල එන සද්දෙ. ඊට පස්සෙ අම්මගෙ රූපෙ. ඊට පස්සෙ අම්මගෙ සුවඳ, ඊට පස්සේ උණුසුම සේරම අර පුංචි දරුව ඉපදිච්ච ගමන් ලේකැටි දරුව ඔක්කොම සෙන්සර්වලට ඔබ්සර් කරනව.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීනි

**ආර්යයන් වහන්සේ :** සතියක් විතර යනකොට මේ සේරම වෙවී ස්පාක් වෙවී. ඊට පස්සෙ අර හැඩතලේ අම්මා කියන ශබ්දෙත් එක්කම එකට මිශ්‍රවෙලා තියෙන්නෙ. දැන් මේක මේ දරුව අපි හිතමු ඉපදිච්ච ගමන් ටාසන් වගේ කැලේ ගිහින් තිබ්බ කියල. එතන තියන සෙන්සස් ඒත් වැඩකරනව. හූ කියන සද්දෙ. අර නරින්ගෙ සද්දෙ, අර කැලේ තියන ගස්වල අතු හෙල්ලෙන සද්දෙ. ඒ සද්ද ටික අර රූප හැඩතලත් එක්ක එකතු වෙනව. එතකොට ගෝත්‍රික මොකක් හරි භාෂාවක් කථාකරනව. දරුවෙක් ඉපදිල ඇමෙරිකාවට ගෙනිච්චත් ඒ ඉංග්‍රිසි භාෂාව ඒ ශබ්ද - වර්ණ ඔක්කොම එකතු වෙනව.

**උපාසක මහතා :** එතකොට ස්වාමීන් වහන්ස මේ සෙන්සස් ටිකක් විශ්වයේ නිර්මාණය වෙනව. ඒකෙ ඔය තියන ස්පාක් එකේම පරිනාමයක් විදියට ඒ සෙන්සස් ටික ඇඩ්වාන්ස් වේවී යනව. එහෙම එකක්ද වෙන්නෙ ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ නෑ මේක ඇවිල්ල මෙතනම ස්පාක් වෙන එකක්. මෙතනනෙ කර්මාන්ත ශාලාව මේ ශරීර කූඩුවනේ. මේ මේ ශරීර කූඩුවෙන් මේකෙ නිරෝධයක් පෙන්නන්නේ ඒකයි. මෙතන ස්පාක්

වෙන එකක්. මේක කොහෙවත් එහෙම තියල යන එන ඒව යන එන ඒව එහෙම කතාවක් නෑ. ඒක එතන එතන ස්පාක් වෙන එකක් තියෙන්නෙ.

**උපාසක මහතා :** ඒ Spark වෙච් එතනම Spark එකේ මොනව හරි වැඩි දියුණු වෙච් එතනම.

**ආර්යයන් වහන්සේ :** ඔව් දැන් මේක මෙතනම ගත්තොත් තරංග යක් කියල කියන්නේ එතන එතන සකස් වෙන එකක්නෙ. කොහෙවත් එක දිගට යන තරංගයක් නැනේ. දැන් වතුරට ගලක් දැම්මහම මැද්දේ තියෙන ජල අංශු යනව නෙවෙයිනෙ එතන වලලු හැදිල හැදිල කෙලවරේ තියන ජලඅංශුනෙ කොහෙ හරි ගිහිල්ල එතන තියෙන අංශුනෙ වදින්නෙ. මැද්දෙ තියන ජල අංශු කොහෙවත් යන්නැනෙ. එතකොට ඒක ඇවිල්ල ජල අංශු සමානයිනෙ මුළු මුහුදෙම. ඒ වගේ තමයි වතුර කඩිත්තෙ ජල අංශු සමානයි. ඒ වගෙම මැද්දෙ තියන මුකුත් යනව නෙවෙයි කෙලවරේ තියන ජල අංශුනෙ වදින්නෙ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඒවගෙ තමයි දැන් සිරස මෙතන ඇල්ලුවාට මේ සිරස කියන එක මේ කොහෙවත් ඉදං ආපු එකක් එහෙම එනව කිව්වට එහෙම කතාවක් නෙවෙයි තියෙන්නෙ. එතන එතන එතන අංශු සකස් වෙන එකක්නෙ තියෙන්නෙ. තරංගයක් කියල කියන්නෙ එහෙම කොහෙවත් තියන එකක් නැහැනෙ තරංගෙ. ඒ තියෙන්නෙ එතන එතන අංශු තියෙන්නෙ. එතන අංශු කොහෙවත් එහෙම යන්නෑ.

**උපාසක මහතා :** එතකොට ඒ තියන තැනදි පැමිණි තැනදි අහුවෙන එලයට එතන දැනීමක් විතරයි ඒ ස්ක්‍රීන් එකට ඇන්ටනාවට අහුවෙන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඔව් දැන් මෙතන තියන අවකාශයෙ මෙතන තියන අංශුත්, අවකාශයෙ යාපනේ තියෙන අංශුත් සමානයි. එතන එතන එතන එතන සකස්වෙන එකක් මිසක් කොහෙවත් මුකුත් යනව නෙවෙයි. ඒ සිස්ටම් එක තමයි මෙතන ක්‍රියාත්මක වෙන්නෙ.

**උපාසක මහතා :** එතකොට අපි මිය ගියා කියල ඉවර වෙලා එතන මුකුත් අපෙන් ගිය ශක්තියක් නෙවෙයි එතන මිය යන මොහොතේදී

ස්පාක් වෙච්ච කම්පනයක් විදියට, ඊළඟ නිමේෂයේ දි ඒක කම්පනය වෙන තැනක හට ගැනීම තමයි සිදුවෙන්නෙ.

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ මේක කන්වර්ට් වෙනවනෙ. මෙතන දැන් ඡන්ද රාගෙනෙ දුරුවෙන්නෙ. ඒ කියන්නෙ මෙතන ආරෝපනයක් වෙනවනෙ. දැන් වර්ණයක් ශබ්දයක් කියල කිව්වට, වර්ණ ශබ්ද නොවෙයිනෙ සිතුවිල්ල කියන්නේ. දැන් හීනයක් පෙනුනට හීනෙ තියෙන්නෙ සිතුවිලිනෙ. එතකොට මේ සිතුවිල්ල කරන්ට් එක බවට කන්වර්ට් වෙනව වගේ වැඩක්. දැන් මේක මනෝ විඤ්ඤානය නෙ. මනෝ විඤ්ඤානෙට බාහිරට එන්න බෑනෙ. දැන් තිබහා එන්නේ හිතට උනාට, හිතට වතුර බොන්න බෑ කිව්වෙ ඒකයි. බඩගිනි වෙන්නෙ හිතට උනාට, හිතට බත් කන්න බෑ කිව්වෙ ඒකයි. ඇවිදිනව කිව්වෙ හිත උනාට, හිත ඇවිදල නෑ කියන්නෙ මේ එකක්වත් වර්ණ ශබ්ද කථානෑ හිතේ. හිතේ තියෙන්නෙ සංඥාවක් විතරයි. සංඥාවක් කියන්නෙ එකම ස්වභාවයකින් ගන්නව. ශබ්ද සංඥා ශබ්ද සංඥාවේ ශබ්ද නෑ. අර කීවෙ පොතක් කියවන කොට ශබ්දයක් පිටවෙන්නෙ නෑ කියල. නමුත් ඒ ශබ්ද සංඥාවක් කියන්නෙ සිතුවිල්ලෙ සංඥාවක් ශබ්ද ශංඥාවක්, සංඥාවක ශබ්ද නෑ. දැන් ඔබතුමා පොතක් කියවනව. පොතක් කියවනකොට තේරෙනවද ඒක.

**උපාසක මහතා :** පැහැදිලියි පැහැදිලියි හොඳටම පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ :** කමල් අඹ ගසට නගී කියනකොට ඒ පොත කියවන කොට ශබ්දයක් තියෙන්නෙ. කමල් කියන්නෙ ශබ්දයක්. අඹ ගහ කියන්නෙ ශබ්දයක්. නගී කියන්නෙ ශබ්දයක්. හැබැයි කමල් අඹගසට නගී කියන එක පොත බලාගෙන කියවනවා. හැබැයි දැන් අපි කියවනව පොත බලාගෙන. එක ශබ්දයක්වත් පිටවෙන්නෑ. ඒ කියන්නෙ ශබ්ද සංඥාවෙ ශබ්ද නෑ. එතකොට වර්ණ සංඥාවෙ වර්ණ නෑ. සංඥාවක් කියන්නෙ අර කම්පනවන ස්වභාවයක්. ඒක දැන් විදුලිය වගේ තමයි කන්වර්ට් වෙන්නෙ. දැන් විදුලිය එනවනෙ නිවසට. දැන් විදුලියනෙ AC දානව. ලයිට් දානව. එතකොට මේ ඔක්කොම විදුලියෙන්නෙ ක්‍රියාත්මක වෙන්නෙ. ඊට පස්සෙ AC දානව, ෆ්‍රිජ් දානව, ලයිට් දානව, ස්ත්‍රික්කෙ ඕන දෙයක් කරන්ට් එකෙන් කරනවනෙ. ටී.වී. දානව, Fan දානව, හුළංද

ඕනෙ. හුළං ගන්නව. සීතලද ඕනෙ. සීතල ගන්නව. රස්නයද ඕනෙ ඒවත් ගන්නවනෙ. දැන් විදුලිය ශේද කරන්නෙ ඔක්කොම.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීනි

**ආර්යයන් වහන්සේ :** ඒ විදියට තමයි, විදුලිය වගේ තමයි දැන් මේක කන්වර්ට් වෙනව තණ්හාව බවට. තව විදියකින් කිව්වොත් රාග ද්වේෂ මෝහ, තව විදියකින් කීවොත් කම්පන චංචල, තව විදියකින් කීවොත් සංඥා ඝන වෙනව.

**උපාසක මහතා :** පැහැදිලියි

**ආර්යයන් වහන්සේ :** ඔක්කොම වචන ගොඩක් විතරයි. එකම දෙයයි මේකෙ පෙන්නන්න ඕනකම තියෙන්නෙ අවබෝධ කරගන්න. මෙතන සිස්ටම් එක. අන්න ඊට පස්සෙ මෙතන ගුලියක් තියනව. තන්හා ගුලියක්. හැබැයි එහෙම තණ්හා කියල දෙයක් කොහෙවත් නෑ. හැබැයි මෙතන බලයක් තියනව චුම්භක බලය වගේ. ශක්තියක් කියන්නෙ ඒකයි.

**උපාසක මහතා :** පැහැදිලියි පැහැදිලියි ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** හැබැයි **මෙතන හුස්ම ගියාම වෙන්නෙ ඒක ඉවරයි. තව කොහෙ හරි ඒක සකස් වෙනව කියනඑක. හැබැයි ඒ සකස් වෙන්නෙ මෙතන තිබුන එක නෙවෙයි. එතන තියනව අර ද්වේශ. අර දැන් ආපු අර ඉරිසියාව, ක්‍රෝධය, වෛරය ඒකත් එක්ක ආපු එනජි එක. එනජි එක සර්පයෙක් වාගෙ. සර්පයෙක්ගෙ කලලෙ සකස් වෙනව.** මානීය මක්කටෝ අති මානීය කුක්කුරෝ. ඔය බුදුන් වහන්සෙ කියන්නෙ. මානය තියනව නම් වඳුරෙක් වෙනව. තව ටිකක් මානය වැඩි උනාම බල්ලෙක් වෙනව. භව පෙන්වන්න තමයි කියන්නෙ. ගති නිමිත්ත කම්ම නිමිත්ත කියලත් කියනවනෙ. **ඒ කියන්නෙ මේ හුස්ම යන කොට එන නිමිත්ත. සංඥාව මොනව හරි එක්කො රස්නයක්, ගින්නක් මොනව හරි ඉරිසියාවක් වෛරයක් එහෙම නැත්නම් ඒ ඇවිල්ල කම්ම නිමිති, ගති නිමිති ගත්තොත් දැන් අර සිවුරක් මතක් වෙලා හාමුදුරුවෝ කාවෙක් වෙලා උපදිනව.** අර හාමුදුරු නමක් සිවුරක් මතක් වෙලා සිවුර කොට්ටෙ යටින් දාල තියාගෙන නිදා ගන්නවනෙ. හාමුදුරුවො ඊට පස්සෙ අපවත් වෙනවනෙ. ඊට පස්සේ හාමුදුරුවෝ එතනම සිවුරෙ උපදිනවනෙ කාවෙක් වෙලා. ඇයි ඒ ඇතිවන අන්තිම සිතේ සිවුර සංඥාව තියෙන්නේ.

සංඥාවක් තියනව අර හැඩතලය අනුව. ඒ හැඩතලයෙ සකස් වෙනව. ඒක තමයි ගති නිමිත්ත. අර කම්ම නිමිත්ත කියන්නෙ කරපු ඉරිසියාව, වෛරය වගේ එකක්. මතක් වෙනව. එතකොට සර්පයෙක්ගෙ වගේ. ඔය වගේ ගොඩක් පැහැදිලි කරන්න ඕන.

**උපාසක මහතා :** ස්වාමීන් වහන්ස එතකොට ගති තමයි මේකෙ තියන රහස

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ හැමපැත්තෙන්ම තියනව. ඇයි කර්ම නිමිති, ගති නිමිති, නිමිති නම් නිමිති. නිමිත්තක නෑ අරකද මේකද කියල. මෙතන නිමිත්තක් තියනවනේ. පොත දකින හිත. දන් ඉරිසියාවක් එනව. එතකොට නිමිත්ත ඉරිසියාව. දැන් **අපි හිතමු මොකෙක් හරි සතෙක් දැක්ක. පූසෙක්. නිමිත්ත පූසා.** කොහොම උනත් මේ මොහොතෙ ඔබතුමාට දැන් තියනවනෙ මේ පූසෝ බල්ලො තිරිසන් ලෝක, දේව ලෝක ඔය දාගත්ත Deta ගොඩක් තියෙනවනෙ. ඒකත් එක්ක මේ ක්ෂණයේම ආරෝපනයක තමයි ඉන්නේ. මේ මොහොතේ අතීතයක් එහෙම කොහෙවත් රෙකෝඩ් වෙලා තියන එකක් නොවේ. මේ මොහොතෙ එන සංඥාවෙ ඔය සේරම තියනව. ට්‍රිලියන ගානක බේස්එක ඒක තමයි Spark වෙන්නෙ. ඒ කියන්නෙ 33000ක Spark වෙනව කියල අපි කියන්නෙ. 33000 Spark වෙනව. දැන් දරුව 5000 Spark වෙනව. හැබැයි එහෙම කියන්නත් බැහැ. දරුවගෙ රාග ද්වේෂ මෝහ ගොඩක් වැඩිනම් තාත්ත සමහර විට භාවනා කරල ඒවා නැති කරල නම්, තාත්ත ගාව 33000 නෙවෙයි අඩුවෙන්න පුළුවන්. දරුවට තියෙන්න පුළුවන් ඊට වැඩිය රාග - ද්වේෂ මෝහ එතකොට ඒක වෙනස් වෙනව. සංඥාවෙ ඝනත්වය තමයි මේ සුකුම වෙන්නෙ. ගොරෝසු වෙන්නෙ. ඒක ඇවිල්ල ඉරියාව, ක්‍රෝධය, වෛරය වගේ මේක කන්වර්ට් වෙනව. රාග ද්වේෂ මෝහ.

**උපාසක මහතා :** එතකොට මේකෙ රහස ඇවිල්ල තියෙන්නෙ නොදන්න එකම රහස තමයි මේ කන්වර්ට් වෙනව කියල.

**ආර්යයන් වහන්සේ :** නෑ **මේකෙ රහස තියෙන්නෙ, තියනවා කියල හිතන එක. දෙයක් කියල ගන්න එක.** ඒකයි 'රූපං නිච්චතෝ අනිච්චතෝ' කියල අහන්නෙ. රූපය කියන්නෙ වර්ණ රූප, ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප සේරම රූප රූප රූපනෙ. ඒ

රූපාරම්මණානෙ මේ ඔක්කොම රූප තියෙන්නෙ රූපාරම්මන ඇත්ත කර ගත්තොත් ලෝකයක් තියනව. තියනව කියන්නෙ දැන් මම ඉන්නවා කියන එකනෙ. දැන් තියනවා කියන එකට කණ්ණාඩියට ප්‍රතිබිම්භයක්නෙ වැටෙන්නෙ බාහිර, මේක බිම්බයක්නෙ. නහිදං අත්ථ කථං බිම්බං නහිදං පර කථං අගං හේතුං පටිච්ච සම්භූතා, හේතු භංගා නිරුජ්ජතී කියල තියෙන්නෙ. එතකොට මේක ප්‍රතිබිම්බයක්. **අපි මේ තියනව කියල ගන්නෙ ප්‍රතිබිම්බයක්. එතකොට මේ බිම්බෙ සිස්ටර්මැටිකලි හැදෙන එකක්නෙ. කවුරුත් හදන එකක් නෙවෙයිනෙ. එතකොට බාහිර දෙයක් තියෙන්න එපෑ කණ්ණාඩියට දෙයක් වැටෙන්න. බාහිර දෙයක් නෑ කියල අපි හිතන එක තමයි ධර්මය සිහිකරනවා කියල කියන්නෙ. යථාභූත ඥානය කියන්නෙ. නිවන් දකිනව කියන්නෙ. බාහිර දෙයක් නැත්නම් මොකද වෙන්නෙ. මෙතන මමත් නෑ.** මම කියල හිතල නැති කරන්න බෑ. විනෙය්‍යය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං, කායේ කායානුපස්සි විහරති කියන්නේ ලෝකයක් නැති බවයි. ලෝකෙ කියන්නෙ ඔක්කොම පොත , මේසෙ, ඉර, හඳ, ගහකොල ඔක්කොම මොකක්ද දාගෙන ඉන්න සංඥා ඔක්කොම ලෝකෙම තමයි. ඒකම තමයි භවය කියන්නෙ. පොත, මේසෙ, දුව, පුතා, ඉර, හඳ සේරම තියෙන්නෙ භවයෙ, "භව නිරෝධෝ නිබ්බානෝ" කියන්න බාහිර දෙයක් නෑ කියන එකයි. අජ්ජක්ධ බහිද්ධා කියල අන්ත 2ක් පෙන්නුවෙ ඕක කියන්න තමයි.

**උපාසක මහතා :** එතකොට අරම දෙයක් තියනව කියන කොට ක්‍රියාත්මක වීමට අවකාශයක් තියනව.

**ආර්යයන් වහන්සේ :** දෙයක් තියනවා කියන තැනමයි ශක්තිය තියෙන්නෙ. දෙයක් තියනව කියන එක තමයි Spark එක තුළ තියන ආරෝපනය. දෙයක්නෑ කියල හිතනකොටම ආරෝපනය දිය වෙනව. ඡන්දරාගය දුරුවෙනව කියන්නෙ ඒකයි. රහ නැති වෙනව. ඒකයි මෙතන අරහත්වය කියන්නෙ. රහ නැතිවෙනව. චූන් එක නැතිවෙනව. අර උද්ධීපනය නැති වෙනව. **කම්පන චංචල නැතිවෙනව අබොප්පා චේතෝ විමුක්තියට එනව. කම්පනය වෙන්නෑ බාහිරට ඊට පස්සෙ. එන අරමුණුවලට කම්පනය වෙන් නෑ. සද්දයක් ආවොත් දඟලන්නෑ. වර්ණයක් දැක්ක කියල දඟලන්නෑ. කම්පනය වෙන්නෑ. අකම්පිතයි. ඒක තමා අටලෝදහමින් කම්පා නොවන ගුණය.** ලාභ - අලාභ, නින්දා-

ප්‍රශංසා, කීර්ති - අපකීර්ති, සැප - දුක ඒවාට කම්පනයනෑ. අබොප්පා අබුප්පා කියන්නෙ කම්පනය වෙන්නෑ. අබොප්පා චේතෝ විමුක්තිය කියන්නෙ ඒකයි. චිත්ත විමුක්තියක් තියනව කම්පනය නොවෙන. ඒකයි මොහොත කියන්නෙ. ඒක තුළ සිතුවිලි නෑ. සිතුවිලිවලට හරයක් නෑ. සිතුවිලි කිසිම වෙලාවක නැතිවෙන් නෑ. සිතුවිලි හැම මොහොතෙම ඇතිවෙනව. නැති වෙනව. Spark එක වෙනකම්ම සිතුවිල්ලක් ඉපිද නිරුද්ධ වෙනව. හැබැයි ඒකෙ වටිනාකමයි නැති වෙන්නෙ. දැන් මේසේ කිව්වොත් වටිනාකමක් තියනව. රත්තරං කීවොත් වටිනාකමක් තියනව. 5000 කොළයක් කීවොත් වටිනාකමක් තියනව. හැබැයි දැන් ඔක්කෝගෙම තියන වටිනාකම නැතිවෙනව. සද්දයක් විතරයි. එතකොට මොකක්වත් තේරුමක් නෑ සද්දවල. ශබ්දෙක කොහොමද දෙයක් තියෙන්නෙ. ශබ්දවල දෙයක් නෑ. අපිට ආපු ආරෝපනය බිඳ වැටෙනව.

දෙයක් කියල ගත්ත වටිනාකම නැතිවෙන කොටම අර ආත්මීය ස්වභාවය දිය වීගෙන යනව. ඒකයි 'නිබ්බිදාව' දියවෙනව එක ඒකයි විරාගය - ඒ කියන්නෙ රාගය නැතිවෙනව. විරාගයට එනව - ඒකයි නිබ්බිදන්තී - විරාගන්තී විරාගන්තී - නිරෝධන්තී - නිරෝධන්තී පටිනිස්සග්ගානුපස්සී කියන්නෙ. හැබැයි මේ **ඔක්කොම නාමරූප 2 ගැට ගැහෙනකං විඥ්ඥානය ගැට ගැහෙනව. විඥ්ඥානය තියනව - විඥ්ඥානය කියන්නෙ සිත. සිතුවිලි. දෙයක් කියල ගන්න එක වෙන්කර ගත්තොත් දෙයක් තියනව. වෙන් කරන් නැත්නම් දෙයක්නෑ.** මේක රතුපාට, කහපාට කියලා වෙන් කරපුගමන් දෙයක් තියනව. මේක බාහිර මෙහෙම දෙයක් තියනව කියල ගත්තොත් දෙයක් තියනව. අජ්ජඣ බහිද්ධා කියල අන්ත දෙකක් හම්බවෙන්නේ නෑ. අපි මොනව හරි හිතන එකක් මෙතන ඉදන්ම හිතනව මිසක් ආයි අතන එකක් තියනව මෙතන මම ඉන්නව කියල කතාවක්නෑ. මේ සිතුවිල්ල කොහෙවත් නෑ. බාහිර එතකොට සිතිවිල්ල මෙතනම නම් සකස් වෙන්නෙ අන්ත දෙකක්නෑ. අන්න අන්ත 2ක් නැති දහමක් දේශනා කරනව 'යෝභන්තෙ දිත්වාන යෝ' අන්ත 2න් මිදුනු ධර්මයක්. උයෝ භන්තේ විදිත්තාන මජ්ජේ මන්තා නලිබ්බති, මැදක්නෑ ඇලෙන්න 'තංභූහි මහා පුරිසෝ' - ඒක දකී නම් ඔහු මහා පුරුෂයෙක්, සේද සිබ්බනි මජ්ඣගා කොහෙවත් ගැටගැහෙන්නෙ නෑ කියනව. ඒ අරමුණ දැක්ක තැනම බාහිර එහෙම එකක් නැති බව

දකින එක. හැබැයි හිතන තැනත් එහෙම දෙයක්නෑ. දැන් ඔබ තුමාට මේ කියන්නෙ වටිනම ටික.

**උපාසක මහතා :** ඔබ වහන්සෙ දේශනාවක කියනව මේ ළඟදි ටෝච් එකක් ගහපුවහම අහසට ටෝච් එකේ එළිය ගිහිල්ල පිහිටන්න පෘෂ්ඨයක් නැහැ කියල. එතකොට එතන නාම රූපයකට හටගැනීමට තැනක් නෑ. මට වැටහුණු හැටියට එතකොට ටෝච් එක හරියට හේතු ටික වගේ වර්ණවල එන වෝටිස් ගාන හරි ශබ්දවල එන වෝටිස් ගාන හරි ඒවාගේ එතකොට ඒක ක්‍රියාත්මක වීමේ ක්‍රියාවලිය සිද්ධ උනාට විඤ්ඤානය පිහිටගන්න මේ ධර්මයට අනුව

**ආර්යයන් වහන්සේ :** තැනක් නෑ. ඒකයි අවිද්‍යා භූමියනෑ. අවිද්‍යා **භූමියනෑ කියන්නෙ විද්‍යාව කියන්නේ සත්‍ය දැක්කොත් ටෝච් එක වුනත් වදින්නෑ. අවිද්‍යාව තිබ්බොත් එයා හිතා ගන්නව මේ පුටුව කියල.** මේ මේසෙ. වදිනව කොහෙ හරි ගිහිල්ල රූපයක් තියනව කියල හිතාගෙන. **දෙයක් තියනව කියල ගත්තොත් වදිනව ගිහිල්ල ටෝච් එක. අවිද්‍යා බූමිය හම්බ වෙනව. ඒකනෙ අර කියන්නෙ අවිද්‍යාව නැමති බිමේ තණ්හාව නැමති දියසීරාව තියනකං විඤ්ඤානය පැලවෙනව කියල. විඤ්ඤානය නමැති බීජය පැලවෙනව කියල කියන්නෙ.**

**උපාසක මහතා :** පැහැදිලියි, පැහැදිලියි. හොඳටම පැහැදිලියි. එතකොට විඥ්ඥානය අනිදස්සනයි, සංඥාව සුකුමයි උනාම ඒකට කවුරුවත් කොහේවත් නිවනට පත් උනාට පස්සෙ මේ සිත කොහෙද යන්නෙ කියන ඒව ගැන කතා කරන්න තැනක් නෑ.

**ආර්යයන් වහන්සේ :** දැන් ලෝකයක් නැතිවෙනවනෙ. ශබ්දය ශබ්දයක් විතරයි. 'දිට්ටේ දිට්ඨ මත්තං' දුටු දෙයක් නෑ දුටු කෙනෙක් නෑ. දෙයක් තිබ්බොත් තමයි කෙනෙක් ඉන්නෙ. දිට්ටේ දිට්ඨ මත්තං. ආලෝක හැඩතල සොබාදහම කියන එක. විශ්වයෙ ඕන තරම් ආලෝක තියෙන්නෙ. ඒකෙ ගැටළුවක් නෑනෙ. ඔන්න ඔය වගෙ. ශබ්ද ශබ්ද විතරයි. ඔය ශබ්ද ඕන තරම් තියෙන්නෙ. ශබ්ද විතරයි. ඒවට රූප නෑ.

**උපාසක මහතා :** සෙන්සරුත් නැතිවෙනව අන්තිමට

**ආර්යයන් වහන්සේ :** ඔව්. ඒ කියන්නෙ ඒවාගෙ හරයක් නැති වෙනව. ඡන්දරාගෙ දුරු වෙනව කියන්නෙ රස පටිසංවේදි, රසරාග න පටිසංවේදි වර්ණ පටිසංවේදී, වර්ණ රාග න පටිසංවේදී, ශබ්ද පටිසංවේදී ශබ්ද රාග න පටිසංවේදී ගන්ධ පටිසංවේදී ගන්ධ රාග න පටිසංවේදී ඒ කියන්නෙ මේක ඇල්මක්නෑ. ඒ කියන්නෙ මේක නිකං සිතක් හටගෙන නිරුද්ධ උනාට ඒකෙ වටිනාකමක් නෑ.

**උපාසක මහතා :** එතකොට ඔබ වහන්සෙ කියන දේ අර කණ්ණාඩිය ළඟට ගිහිල්ල කණ්ණාඩිය ඇතුලෙ තියන දේ අතපය දික් කරල ගන්න හදනව වගෙ, ගන්න බෑනෙ. අර දර්පන ශක්තිය තියන වීදුරුවෙනෙ අත වදින්නෙ. පොඩි ළමයෙක් ගිහිල්ල ඒක ඇතුලෙන් ඇපල් ගෙඩික් හරි පෙන්නුවොත් එහෙම ඒක ඇතුලෙන් ගන්න ගියොත් එයාට ගන්න බැහැනෙ. අන්න ඒවගෙ මානසික මට්ටමක්.

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම දැන් සතා දන්නෙ නෑනේ කණ්ණාඩියෙ මොකුත් නෑ කියල. කණ්ණාඩියට කොටන්න පුළුවන්. දැන් සතෙක් උනත් කුරුල්ලෙක් උනත් කොටන්න පුළුවන් වඳුරෙක් උනත් දඟලන්න පුළුවන් කණ්ණාඩිය ළඟට ගිහිල්ල. නමුත් දැන් මනුස්සය දඟලන්නැත්තෙ මනුස්සයා දන්නව කණ්ණාඩියෙ මොකුත් නෑ කියල. ඒ වගේ අර අවබෝධයට පත් උනාට පස්සෙ කණ්ණාඩියෙ මොකුත් නෑ වගේ එක ලෝකෙ මුකුත් නෑ.

**උපාසක මහතා :** එයාට අහුවෙන් නෑ.

**ආර්යයන් වහන්සේ :** අහුවෙන් නෑ. එයාට හරයක් එන්නෑ. වටිනාකමක් එන්නෑ.

**උපාසක මහතා :** හරිම ශ්‍රේෂ්ඨයි.

**ආර්යයන් වහන්සේ :** ශ්‍රේෂ්ඨයි කියන්නෙ මේක නොදැන මනුස්සයෙක් ඉපදිලා මැරෙනව කියන්නෙ අපරාධයක්. දැන් මෙතනට සුද්දෙක් එනව. එක ශබ්දයක් දානව. චීනෙක් එනව. තව ශබ්දයක් දානව. ඉන්දියාවෙන් එනව එක් කෙනෙක් තව ශබ්දයක් දානව. මේක වෙන්න බැහැනෙ කොහොමවත්.

**උපාසක මහතා :** එතකොට අවිද්‍යාවෙ තරම තේරෙනව, ගැඹුර ස්වාමීන් වහන්ස එක තැනක තථාගතයන් වහන්සෙ කියනවනෙ මේ මොන

කළුවරක්ද? අවිද්‍යාව ඊට වඩා කළුවරයි කියල ස්වාමීන් වහන්සේලා එක්ක වඩින කොට. එතකොට මේ අවිද්‍යාව කියන එක ඔබවහන්සෙ කියන විදියට කොයිතරම් ගැඹුරුද කියල.

**ආර්යයන් වහන්සේ :** එතකොට අපි වෙලාගෙන ඉන්නෙ අවිද්‍යාව. ඇත්තටම අපි හැදිලම තියෙන්නෙ අවිද්‍යාවෙන්. මේ හිත හැදිලම තියෙන්නෙ අවිද්‍යාව පදනම්ව.

**උපාසක මහතා :** ඒක ඉක්මවා හිතන්නෙ කියන එක ඒ කවුළුවලින් හිතන්නෙ කොහොමද කියන එක පුදුමයක්.

**ආර්යයන් වහන්සේ :** හිතාගන්නබෑ. ඇත්තටම ඒක තමයි පුදුම ආශ්චර්යයක්. ඒකයි අපි කිව්වෙ විඤ්ඤානයට, විඤ්ඤානයෙ මායාව අවබෝධ කරන්න බෑ කියල. හැබැයි මේක ඇතුලට දැනෙන්න ගන්නව. ඔය කතාකරන හැම එකක්ම ඇත්තටම දැනුමක් විතරයි වෙන්නෙ. ඒක සුතමය ඥානය. නමුත් මේක එනව අනිත් පැත්තට. ඒකනෙ බුදුන් වහන්සේ ප්‍රතිපදාව දෙන්නෙ. සත්‍ය ඥානය කියන කෙනාටයි කෘත්‍ය ඥානය තියෙන්නේ කියල. **ඒ කෘත්‍ය ඥානය කියන්නෙ ඊට පස්සෙ එවෙලෙ එවෙලෙ එන අරමුණුවල ඇතුලට දැනෙන්න ගන්නව වටිනාකම නැතිවීගෙන යනව. ඇතුලෙන් සිහියට දැනෙන්න ගන්නව.** අර සිහිය තමයි සිතක් ඇති වෙලා නැතිවෙන බව සිහියට අහුවෙනව. සිහිය තමයි මෙතන එන්නෙ බලගැන්විලා. යෝනිසෝ මනසිකාරය. දැන් සිහිය ඊට පස්සෙ දියුණු වෙනව. දැන් සිතක් හටගත්තට පස්සෙ සිහිය එලඹෙනව. ඊට පස්සෙ සිත නිරුද්ධ වෙනව. ඊට පස්සෙ සිත මෙනෙහි කරනව, එහෙම දෙයක් නැතිබව බාහිර. ඊට පස්සෙ ඒකත් දැන් සිහියට අසුවෙනව. එහෙම දෙයක් පොතක් කියල දෙයක් නැති බවට පොතක් කියල හිතපු බවට සිහිය තියනව. පොත කියන අරමුණ ආපු බවට සිහිය තියනව. හැබැයි ඊට පස්සෙ ඒ පොතේ වටිනාකම දිය වීගෙන යන ස්වභාවය දැනෙන සිහියක් අවදි වෙනව. ටිකෙන් ටික ටිකෙන් ටික ඒක දැන් ඉස්සර වගේ නෙවෙයි, දැන් එච්චර ගානක්නෑ. සමහර අරමුණු තියනව ටිකක් එහෙම යනකොට ගානක්ම නෑ. ඒ අරමුණ ආවත් එකයි. නැතත් එකයි. ඊට පස්සෙ කම්පනය වෙන්නෙ නෑ. සමහර ඔය ගෑනු ළමයි පිරිමි ළමයි එහෙම ගෑනු රූපෙට ඇලෙන, එක ඒකත් දියවෙලා

යනව. ඊට පස්සෙ මොන ගෑනු රූපයක් තිබ්බත් මේලෝකෙ පලක් නෑ. මොකද අරය කම්පනය වෙන්නෑ.

**උපාසක මහතා :** පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ :** ඊට පස්සෙ ඉතින් ඒ රූප කතන්දර වැඩකුත් නෑ. අර කලින් වගෙ බලන්නෙත් නෑ. ඕනකමකුත්නෑ. හිටියත් එකයි නැතත් එකයි ඔන්න ඔය වගේ පුදුමාකාර දියුණුවක් එනව.

**උපාසක මහතා :** ස්වාමීන් වහන්ස දැන් ඕක හිතාගෙන හිතාගෙන යන කොට සම්පූර්ණ, දැන් ගලක් වගේ ඒක ඇවිල්ල.

**ආර්යයන් වහන්සේ :** එහෙම තමයි දියුණු වේගෙන යන කොට, ඒ ස්වභාවය එනව. අජීව් ස්වභාවයක් එනව. එතනදි අර සිතුවිලිවලට ගිනිගත්ත ගින්න නිවෙනව. ඒ ගින්න නිවෙන එක තමයි ශාන්තයි ප්‍රනීතයි කියන්නෙ. ශාන්ත සුවය. ලොව්තුරු සුවය. සිතුවිලිවල ගින්නක් තියනව. ඒ ගින්න නිවෙනව කියන්නෙ ඒ ගින්නට පත්තුවෙන්නෑ කියන්නෙ, පුදුමාකාර ශාන්ත සුවයක් දැනෙන්න ගන්නව.

**උපාසක මහතා :** එතකොට හිතෙනව ඒව දැන්, ඕනකමින් හිතක් හදාගන්න ඕන කියන මට්ටමට.

**ආර්යයන් වහන්සේ :** නෑ එහෙම අවශ්‍යතාවයක් එන්නෑ. එහෙම හිතෙන්නවත් එන්නෑ. මොකද එතකොට එයා අවබෝධයෙන් මිදිල ඉන්නෙ. 'සංඛිතේ නිබ්බිදාය.' එතකොට සාමාන්‍ය විදියට ආ එහෙමද? දැන් අනිත් අය අඬනකොට ආ එහෙමද? එහෙනම් මං අඬන්න ඕන කියල ඒ කියන්නේ මෙයා High Light වෙන්න දඟලන්නෑ. මෙයා දන්නව කෙනෙක් නෑ කියල. එතකොට තමයි මේ ප්‍රතිපදාව ටික වැදගත් වෙන්නෙ. එතකොට තමන්ව ලොකු කරල කතා කරන එක මාන්නෙන් තමන් ඉස්මතු කරල බොරු කියන්නෙ අර එයා මොනව හරි කියල නෑ නෑ ඒ කාලෙ මම මෙහෙමයි. මම මෙහෙම මෙහෙමයි. කියන්නෙ, අර ඒවනෑ ඊට පස්සෙ. ඊට පස්සෙ අර ඔක්කොම කුඩුවෙලා හිටියත් එකයි, නැතත් එකයි ඕන්න ඔය වගේ අමුතු ස්වභාවයක් එනව.

**උපාසක මහතා :** ඔව් ස්වාමීන් වහන්ස ඊට පස්සෙ අර කවුරු හරි කෙනෙක් ඉන්න කොට ඊට පස්සෙ කවුරු හරි කෙනෙක් ආවහම ටිකක්

වෙලා ගිහිල්ල අවධි වෙලා ආ... මොකද කියල අහන්නෙ... ඒ වගෙ තමයි ආපසු සිතිවිල්ලකට යනව කියන්නෙ අර බාහිරින් කෙනෙක් ආවහම නැගිටල එතන ඒ සිදුවීම කරන්න වෙනව වගේ තමයි අර වගේ තමයි අර වගේ තත්පර ගානක් ගිහින් ඉවර වෙලා ඒවගේ අර ලොග් වෙන්නෙ භවයට.

**ආර්යයන් වහන්සේ :** එහෙම තමයි ඒ දියුණු නැති හින්ද. දියුණු වෙනකොට මුලින් මුලින් එහෙම ස්වභාව ටිකක් තියනව. දියුණුවට ගියාට පස්සෙ එන එකකටවත් කම්පනයක් දැනේන නෑ. ඒව නිකං සාමාන්‍යයෙන් ආවද නෑද වගේ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස ඒක දැන් එක තැනක පුටුවක ඉදගෙන වගේ පර්යංකෙක ඉන්නෑ පුටුවක වාඩිවෙලා ඔය කියන තැනට මනස ඇහෙන දේකින් ගන්නව මේක රූපයක්ද මේ ඇහුන කියල ඉවර වෙලා ටක් ගාල හිත යනව තත්පරගානෙන්. තත්පර ගානක් ගියාට පස්සෙ එක පාරටම ඔක්කොම තියන Spark වෙන ඒවයි ඔක්කොම තියන මිථ්‍යාව මේව ඇත්තටම මෙහෙම නෑ නේද?

**ආර්යයන් වහන්සේ :** ඕව් ඒකයි කියන්නෙ අර මුලින් ටිකක් පරක්කු වෙලා එන්න ගන්නෙ. පස්සෙ ඒක ටික ටික කාලය අඩුවෙලා එවෙලෙම දැනෙන්න ගන්න ස්වභාවයටම එනව.

**උපාසක මහතා :** විනාඩි 2ක් යනකොට ඔක්කොම එනව.

**ආර්යයන් වහන්සේ :** ඔබතුමාට දැනෙන විදිය තමයි ඔබතුමා ඔය කියන්නෙ. ඒක තමයි දියුණුව. ඔය යනපාර හරි. යන ගමන හරි.

**උපාසක මහතා :** සාදු සාදු සාදු

**ආර්යයන් වහන්සේ :** අර අවබෝධය ගොඩක් වැදගත්. බාහිර ඇත්ත වෙලා තියෙනව නම් ආයි අර සිතුවිලිවලට වටිනාකම ඇතිවෙනව. බාහිර හැම තිස්සෙම සිහියෙන් ඉන්න ඕනේ. හැම තිස්සෙම කීවට ඒක ඕනකමින් කරන එහෙම දේකුත් නෙවෙයි. තමන්ට වැඩිය උපාදාන නොවෙන්න. බොහොම ඒ කියන්නෙ තමන්ගෙ තියෙන්න ඕන කුසලතාවය. දක්ෂතාවය. එතන එතන දක්ෂ වෙන්න ඕන කම්පන ස්වභාවය දැකල මිදි මිදි යන ගමන යන්න.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස. ඒක තමයි අර සත්‍ය ඥානය තමයි ගුරු වෙන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි සත්‍ය ඥානය තමයි බුද්ධ දර්ශනය තමයි සමාජයෙන් ගිලිහිලා තියෙන්නෙ.

**උපාසක මහතා :** මම කොයි වෙලෙත් දේශනවලින් පස්සෙ, සත්‍ය ඥානය ගුරුතුමා කරගන්නව.

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම ධර්මය කියන්නෙ ධර්මතාවය. දෙයක් නැතිබව. ඒක තමයි ගුරුන් වෙන්නෙ. ඒ කියන්නෙ අපි හැම මොහොතකම දෙයක් නැතිබවයි දකින්නෙ. එතකොට අපි අර බුදුන් වහන්සෙ වගේම ගුරුන් කොට සලකන්නෙ. **ධර්මය කියන්නෙ දෙයක් නැති බව. එතන තමයි කොහොමත් අපේ මගපෙන්වීම තියෙන්නේ. දෙයක් නැති බව කියන එකේ. එතන තමයි මේකෙ Key එක තියෙන්නෙ යතුර. දෙයක් තියනව කියල ගත්තොත් අවිද්‍යාභූමිය. දෙයක් නෑ කියල ගත්තගමන් එන්නේ සම්මා දිට්ඨිය.** ඒක තමයි බුදුන් වහන්සෙ චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ කියන්නෙ. චක්ඛු කියන්නෙ ඇසනෙ. ඇස කියන්නෙ මස් ඇහැ නොවෙයිනෙ. ඇහැ කියන්නෙ ජේන බව. ජේන බව කියන්නෙ පොත. පොත කියන එක 'චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ' කියන්නෙ පොත තියනවද නැද්ද කියන එකම තමයි.

**උපාසක මහතා :** දෙපැත්තෙන් කෝක ගැලපුවත් හරි නේද ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඔව් 'රූපං නිච්චතෝ අනිච්චතෝ කියන්නෙත් ඒකමයි. 'රූපං' කියන්නෙත් පොත තියනවද නැද්ද කියන එකම තමයි. පොත තියනව කීවොත් ලෝකෙට බහිනව. රූපය ඇත්ත කීවොත් ලෝකෙට බහිනව. 'චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ.' 'අනිච්චං භන්තෙ. 'රූපං නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භන්තේ.' මේක පැහැදිලි කරන පහසුවට තමයි මේ පොත කියල ගන්නෙ. ආරම්මනය කියන එක. රූපය ඇත්ත කරගත්තොත් ඒක සංඝයා වහන්සෙලා **අනිච්චං භන්තෙ කියන්නෙ ඒක බෞද්ධයි කියන එක. භව නිරොධෙ දකිනව. එතන දෙයක් නැති බව දකිනව. දෙයක් නැති බව දැක්කොත් ඒක තමයි ගමන් මග. නැත්තං අර සංඝ කියන ගොඩෙත් නෑ. භික්ෂු කියන ගොඩෙත් නෑ. සංඝ**

**කියන්නෙ මේ සිතට එන අරමුණ සත්‍ය දකිනව කියන එකනෙ.** ඒකයි අර සංඝයා වහන්සේලාගෙන් බුදුන් වහන්සෙ අහන්නෙ. රූපං නිච්චතෝ අනිච්චතෝ කියල, අනිච්චං භන්තේ කියනව නම් එයා සංඝ චක්ඛුං නිච්ඡතෝ අනිච්චතෝ කියන කොට 'අනිච්චං භන්තේ' කියනව නම් එයා සංඝ ඒක නැත්තං චීවරය එයාට සුදුසු නෑ.

'රූපං නිච්චතෝ අනිච්චතෝ.' 'චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ' ඔතනින් තමයි ධර්මය පටන් ගන්නෙ. මොන සූත්‍රය ගත්තත් බුදුන් වහන්සෙ ධර්මය පැහැදිලි කරනකොට මුලින්ම ගන්නේ ඇත්තටම 'රූපය.' නැත්තං ඇස. ඔය දෙකින් එකක් ගන්නෙ. ඔය දෙකම එකයි. චක්ඛු කියන්නෙත් ඒකම තමයි. එතනින් මුළු ධර්මයම. ඇසේ උපතයි මහණෙනි උපත. ඔය කෝක කීවත් ඔය විදියටයි ගන්නෙ. ඇස පර්ජානාතී, රූපය පර්ජානාතී ඒකමයි ගන්නෙ. ඒ කියන්නෙ ඒකම තමයි සම්මා දිට්ඨිය. පජානාති පජානාති කියන්නෙ එහෙම දෙයක් නැතිබව දැකීම. සත්‍ය දකිනව. **සත්‍ය දකිනව කියන්නෙ පර්ජානාති. විජානාති කියන්නෙ රැවටෙනව කියන එක. පජානාති කියන්නෙ ඒකෙ සත්‍ය දකිනව. දෙයක් නැති බව දැකීමයි සත්‍ය දකිනව කියන්නෙ.**

**උපාසක මහතා :** එතකොට ඒ පජානාති කියන්නෙ සත්‍ය අවබෝධය එතන තියනව. ඒ ස්වරූපය ඒ විදියටම තේරුම් ගන්න කියන එක.

**ආර්යයන් වහන්සේ :** මේ එක වචනෙ මුළු සත්‍ය ඥාණයටම තියනව. යථාභූත ඥානයම තියනව පජානාති කියන එකේ.

**උපාසක මහතා :** පැහැදිලියි පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ :** බුද්ධ දර්ශනය අවබෝධය නැතුව පජානාති කියන්න බෑ කාටවත්. ඒ වචනෙම තියෙන්නෙ දර්ශනය. පජානාති කියන තැන. නිර්මල ධර්මය අහනකොට ආය පොඩ්ඩක්වත් ආයෙ හිස් තැනක් එන්නෙනෑ. කොතනින් ඇහුවත් ඒක කියන්න පුළුවන්. ඒක ප්‍රත්‍යක්ෂතාවයෙන් එන්න ඕන. පොත් බලල නම් ගන්න බෑ.

**උපාසක මහතා :** ඔය ඔක්කොම ටික එකම තැන කතා කරන්නෙ.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි කියන්නෙ. ඔබතුමාට ඇහෙන්න ඇති පටිච්චසමුප්පාද දේශනාවන්. කොහෙවත්නෑ. තේරුනානේ. අවිද්‍යාව

කියන්නෙ මේකමයි. අවිද්‍යාවමයි සංඛාර කියන්නෙ මේ දෙක ඇතුලෙ තමයි කතාව තියෙන්නෙ. ඒකමයි නාම රූප එකතු වෙනව කියන්නෙ. ඒකමයි විඤ්ඤාණය කියන්නෙ. ඒකමයි සලායතනය කියන්නෙ. ඒකමයි ඵස්ස වේදනා සංඥා සංඛාර කියන්නෙ පොතමයි. බාහිර ඇත්ත කර ගත්තොත් තණ්හා උපදාන ජාති ජරා මරණ පුදුම කතාවක්.

**උපාසක මහතා :** ඒ කතාව එතනම තියනව.

**ආර්යයන් වහන්සේ :** ඔව් මේ ක්ෂණ සම්පත්තිය කියන්නෙ ඒකයි. මේ මොහොතෙ එක සිතේ තියෙන්නෙ ක්ෂණය. ඒකම තමයි ක්ෂණ සම්පත්තිය කියන්නෙ. ඒකමයි දකින්න තියෙන්නෙ. ඒකයි බුද්ධක්ෂණය කියන්නෙ. බුද්ධ කියන්නෙ දෙයක් නැති බව. ඇයි මේකේ සිලබස් එකක්නෑ මේකේ. ඒකයි ගැටළුව. සිලබස් එකක් එපැයි උගන්වන්න මාස දහයක් විතර උගන්නන් එපෑ සිලබස් එක.

**උපාසක මහතා :** ඒ විදියට ගියොත් එහෙම කොතනින් කොතිනින් කොතනින් සිලබස් එක හදාගෙන කොතනින් නිවන් දකිනවද කියන එක පැහැදිලි නැහැ.

**ආර්යයන් වහන්සේ :** ඒකනෙ දැන් මේ දහම්පාසලට කරල තියෙන්නෙ. සිත් 89යි චෛතසික 52යි. මේ ළමයි එපා වෙලා පොත් ටිකත් අන්තිමට විසික්කරල දාල නිවන් දකින එකත් අත් ඇරල දාලනෙ ඉන්නෙ. මේක හරිම සරලයි. පොඩි දරුවකුට උනත් කියන්න පුළුවන් අවු. 7ක ළමයකුට උනත් මේක තේරුම් කරන්න පුළුවන් හරි පුදුමයි. මේක සියවස් ගණනාවක්ම වැලලිල තිබ්ල තියෙන්නෙ. ඒකයි මේ ගැටළුව. අපි දන්නව අශෝක අධිරාජයා වෙහෙර විහාර 84000ක් හදන්නෙ ලෝකය ඇත්ත කරගෙනනේ. තියන හින්දනේ හදන්නෙ. ඉතිං එතකොට දුගතියම තමයි. ඒක තමයි **බුදුන් වහන්සෙ කියන්නෙ ශාසනය වෙනුවෙන් යමක් කරනව නම් මගඵල ලාභීන් ඇතිතාක් පමණි ආනන්දය මේ ශාසනය පවතින්නෙ කියනවනෙ. එතකොට ශාසනය පවතින්නෙ මගඵලලාභීන් ඇති තාක් පමණ නම් අපි හිතන්න ඕන මොකක්ද? මේ ධර්මය අවබෝධ කරගන්න. අවබෝධ කර ගත්තොත් තව කෙනෙකුට දෙන්න පුළුවන්. එහෙම උනොත් මේ ධර්මය රැකෙනව. එහෙම නැතිවුනොත් වෙන්නෙ මොකක්ද බාහිර ඇත්ත කර ගත්තොත් කෙලින්ම ධර්මය නැති වෙනව.**

**උපාසක මහතා :** අනිවාර්යයෙන්ම

**ආර්යයන් වහන්සේ :** එතකොට මොකද වෙන්නෙ ගඩොල් බැඳ බැඳ යනව. ඊට පස්සෙ මොකද වෙන්නෙ මුළු ඉන්දියාවෙම අද තියනවද? කෝ ඉන්දියාවෙ බැඳපුව. 84000ක් වෙහෙර විහාර කෝ ඉන්දියාවෙ.

**උපාසක මහතා :** එහෙම තිබුනනම් ඒව නැතිවෙන්න විදියක් නෑනේ.

**ආර්යයන් වහන්සේ :** අශෝක අධිරාජය ධර්මය අවබෝධ කරගත්ත නම් සුගතියට යනව. දුගතියට වැටෙන්නෙත් නෑ. එහෙනම් මේ ධර්මය මේ වෙනකම් රැකෙනව. ඒකනෙ දැන් මල්ලිකා දේවිය අසිදිසි මහා දානය දෙන්නෙ දෙයක් තියන හින්දනෙ. ඒක නිසානෙ දුගතියට වැටෙන්නෙ. දැන් විශාකාව ධර්මය අවබෝධ කරගෙන සෝවාන් වෙනවනෙ. ඊට පස්සෙ ඕන දෙයක් කරන්න පුළුවන්. ඊට පස්සෙ එයා බාහිර ඇත්ත කරගෙන නෙවෙයිනෙ. ඊට පස්සෙ එයාගෙම **හිතේ තියන රාග ද්වේෂ මෝහ ගින්න නිවෙනව. ඒක තමයි පින කියන්නෙ. රාග ද්වේෂ මෝහ ගින්න නිවෙනව කියන්නෙ සිත පිරිසිදු වෙන එකයි.** සිත පිරිසිදු වෙනව කියන්නෙ පින තමයි. බුදුන් වහන්සේ මේව හොඳට පැහැදිලි කරල තියනව. ඒක නිසයි අපි මේව දේශනා කරන්නෙ. ඉධ භික්ඛවේ භික්ඛු මේ සාසනේ පින්දහම් කරන්නෙ, බාහිර ඇත්ත කරගෙන නෙවේ මහණෙනි, කියල. ඒකනේ වක්කලීට මේ කුණු ශරීරයක් දිහා බලාගෙන මොකද කරන්නෙ වක්කලී කියල අහනවනෙ.

**උපාසක මහතා :** එහෙමයි ස්වාමීන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** අපි වදින්නෙ මේ මැටි පිළිමෙට නෙවෙයිනෙ. **සත්‍ය ධර්මය 'බුද්ධ' කියන්නෙ දෙයක් නැති බව. තමන්ගෙම හිතේ සිතුවිලිවලින් මිදෙන ස්වභාවය, උත්තරීතර කරල, තමන්ගෙම හිතේ ඒ** ස්වභාවය දැකල මිදෙන එක දැකල වන්දනා කරන්නෙ. දෙයක් තියනව කියන එක වෙනම දෙයක්. අවබෝධයෙන් වදින්න ඕන. ඒකයි අපි කියන්නෙ. බුදුන් වදිනව කියල කියනවනෙ අපි. වදින්නෙ මැටි පිළිමෙට නෙවෙයි කියලත් කියනව අපි. ධර්මය අවබෝධය තුළින් බුදුන් වදිනව කියලයි කියන්නෙ. ඒක තමයි ඇත්ත.

**උපාසක මහතා :** ඇත්තටම වදින්නෙ ඔබ වහන්සෙ ප්‍රකාශ කරපු ධර්මය කියන්නෙ දෙයක් නැති බවයි.

**ආර්යයන් වහන්සේ :** දෙයක් නැති බවයි. ඒක දකිමින්. අපේ රාග ද්වේෂ මෝහ තුනීවෙන ආකාරයට වන්දනා කරනව.

**උපාසක මහතා :** වන්දනා කරනව. හරියට හරි.

**ආර්යයන් වහන්සේ :** ඒකයි පින කියන්නෙ සිත පිරිසිදු වෙන ආකාරය දැකල වන්දනා කරන්නෙ. දනිමින් දකිමින් වන්දනා කරනව කියලයි අපි කියන්නෙ. 'ජානතෝ පස්සතෝ' කියන්නෙ.

**උපාසක මහතා :** එහෙමයි එහෙමයි

**ආර්යයන් වහන්සේ :** කිසිම නාලිකාවලින් අහන්න ලැබෙන්නෑ. ඔක්කොමල කොහෙ හරි පැටලිලා ඉන්නෙ මකුළුදැලේ වගෙ. අපි බැලුව. බලල අපි දැන් මෙහෙම දාන්නෙ ඔක්කොම හොඳට අධ්‍යනය කළා. ඉතින් සෑහෙන කාලයක් දීර්ඝ අධ්‍යනයක ඒ කියන්නෙ අපිට මේක හොඳටම ප්‍රත්‍යක්ෂයි. ඔකේ පළවෙනි  එක තියෙන්නෙ පටිච්ච සමුප්පාදෙ. බුදුන් වහන්සෙ පටිච්ච සමුප්පාදය මෙනෙහි කරලනෙ බුද්ධත්වය ලබන්නෙ. දැනට සමාජෙට ගිලිහිල තියෙන්නෙත් ඒකනෙ. පටිච්චසමුප්පාදය ලිහුව කියන්නෙ ආයෙ ලිහන්න දෙයක් නෑ. එකෙන් ලිහෙනව ඔක්කොම.

**උපාසක මහතා :** ඔක්කොම ලිහෙනව. එහෙමයි ස්වාමීන් වහන්ස මේ පටිච්ච සමුප්පාදය මොහොතට විවර කර ගන්නෙ නැතිව.

**ආර්යයන් වහන්සේ :** මොනවත් කරල වැඩක්නෑ. ඒතාත් කාටවත් නිවන් මගක් නෑ. බෞද්ධයෙක් වෙන්නෙත් නෑ. එතකන් නිගණ්ඨ ධර්මය තියෙයි. මේ දැන් තමයි මේ අවධියට ඇවිල්ල තියෙන්නෙ. ඇත්තටම අපි මේ දේ නොකල නම් පුදුමාකාර අන්ධකාරයකනේ කට්ටිය හැමෝම අන්ධකාරෙට යනව. තව අවුරුදු 5කින් හුස්ම ගියත් එකයි. දැන් හුස්ම ගියත් එකයි. ඒ ක්‍ෂණය විතරයිනෙ. ඉතින් ඒක වෙන්නෑ. එතකොට ඒ මොහොතෙන් එහා දෙයක් නෑනෙ. ක්‍ෂණය විතරයි ක්‍ෂණයක්වත් නෑනෙ. ඔතන දැන් කමටහනක් විදියට සේරම ටික එළියට දාන්න. දැන් කොහොමත් යන්න බලාගෙනනෙ දාන්නෙ. ඊට පස්සෙ දවස් කීපයකට පස්සෙ තමයි පැය 14 දේශනය කළේ.

**උපාසක මහතා :** ඔව් ඒක ඇහුව මම ස්වාමින් වහන්ස ස්වාමීන් වහන්සේගෙ දේශනා අපිට අහුවුනේ මේ මෑතකදි. ඒ දාපු හින්ද තමයි අහුවුනෙ.

**ආර්යයන් වහන්සේ :** ඔය ඔක්කොම දේශනා දැන් 1000කට කිට්ටුයි. ඒ ඔක්කොම දැන් අවු. 2ක් ඇතුළත තියෙන්නෙ.

**උපාසක මහතා :** මට නම් මාස 2යි ඔබ වහන්සේගෙ දේශනා අහුවෙලා. එතකොට තමයි මට තේරුනේ එතන මේ නිවැරදි නිවන්මඟ.

**ආර්යයන් වහන්සේ :** මෙතන මේ එකක්වත් ඇත්තටම අපි මේ භාවනා කර කර ආරාමවල ඕව කර කර ගිහිල්ල අන්තිමට ම මේක හරියන්නෑ. ඔය දේශනාවල ගොඩක් ඒව කියවෙනව. ඊට පස්සෙ බැලුව මොනවද බුදුන්වහන්සෙ දේශනා කරල තියනඒව. ඊට පස්සෙ බැලුව හැමතැනම සංස්කෘතික මධ්‍යස්ථානයට ගිහිල්ල බුදුන් වහන්සේ දේශනා කරල තියෙන්නෙ මොනවද කියල. ඕක දැන් අවු. 15ක් 20ක් ඇතුලෙ කතාව.

ඊට පස්සෙ ඒක ප්‍රායෝගිකව බලනව. ඊට පස්සෙ ඒක වෙන්නෑ. ඊට පස්සෙ මේක විශාල පර්යේෂනයක් ආර්‍ය්‍ය පර්යේෂනයක් වගේ එකක්. ඊට පස්සෙ ඒව ඔක්කොම ලියනව. අපිම ඊට පස්සෙ හරිනම් මේකයි. මේක මෙහෙම තිබ්බට එහෙම වෙන්නෑ. මෙහෙමයි වෙන්නෙ. කියල ලියනව. ලියල ලියල ලියල අන්තිමටම බලනකොට මේක අපිට තේරෙනව අර අපි කියන්නෙ කිරිගොට්ටෙ පෙරල, ආයි පෙරල ශුද්ධ කරල ශුද්ධ කරල තමයි දේශනා කරන්නෙ. ඊට පස්සෙ පොතුත් පැත්තකට කරල ඊට පස්සෙ දැන් මේක තනියම අධ්‍යනය කරනව. ධර්මය තුළ තියන ඒ දේවල් තනියම අධ්‍යනය කරල හොඳට ඊට පස්සෙ අර අභ්‍යන්තරයෙන් රාග ද්වේෂ මෝහ ප්‍රහීන වෙනව අපිට අහුවුනා ඉතින්. යටිනුල අහුවෙනව වගේ දෙයක් නැතිබව, ඊට පස්සෙ මේව හැදෙන්නෙ කොහොමද ඔක්කොම ලියල ලියල ලියල බලනකොට වැඩි කාලයක්නෑ. කොහොම හරි මීට අවුරුදු 5ක් ඇතුළත දැන් මෙතන ඉදල බැලුවොත් අවුරුදු 5ක් වගේ ඇතුලේ සම්පූර්ණයෙන්ම කතාව එනව. කතාව එනව කියන්නෙ සම්පූර්ණ අවබෝධෙට පත් වී ගෙන ආව ඒක පටන්ගන්නෙ නම් ඇත්තටම ඒ මෙනෙහි කිරීම. මුලින් ඒ සමාධි ඒවා මේව හොඳට භාවනාවල යෙදිල තිබුණු සමථ සමාධිමත් හිතේ ස්වභාවය හේතු උනා. ඒක හේතු උනා විදසුන් නුවනට. අභ්‍යන්තරයෙන් ආව අර අපි කියන්නෙ ඥායස්ස අධිගමාය කියල අභ්‍යන්තරෙන්ම ආව අපි ගන්න හැම ධර්ම කාරණාවක්ම ගැඹුරින්ම විමසන්න පුළුවන් ඥානයක් අවධි වීගෙන ආව.

ඊට පස්සෙ අභිඤ්ඤාවෙන් ස්වභාවයක් නැගීගෙන ආව. ඇත්තටම ධර්මය සම්බන්ධ අභිඤ්ඤාවක්. ඒ අභිඤ්ඤාවෙන් තමයි ඇත්තටම ධර්මය සම්බන්ධ අභිඤ්ඤාවක් සකස් වුනේ. ඒකෙන් තමයි ෆ්‍රීක්වන්ස් එක ටියුන් උනේ.

**උපාසක මහතා :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** එකෙන් තමයි සම්පූර්ණයෙන්ම අනිමිත්ත, අප්‍රනීත, ශූන්‍යත කියන අනාත්ම ධර්මය තුළ පුදුමාකාර විදියට මේ කිසිම පොතක කාගෙවත් ඇහිලි මොකුත් නෑ අභ්‍යන්තරයෙන්ම ගලවගෙන ගිහිල්ල මේ උපමා ඔක්කොම මේ අපේ රතුපාට ලයිට් වලින් ඇහෙනව නේද සසර යන හැටි කතාව ඔක්කොම පැහැදිලි කරනව. ආයි හිතාග න්න බැහැ. එතකොට මේ දැන් යන දේශනා හැම එකකම ගොඩක් ඒව අපිමයි අපේ අභ්‍යන්තරයට දැන් මේ 33000 ෂෝට් වෙනව කියනව වගේ. හෙට වෙනකොට තව එකක් කියන්න පුළුවන්. මොකද මේ දේශනා ප්‍රාතිහාර්ය වගෙ එකක් සිද්ධ වෙනව. ඒ කියන්නෙ මේ අභ්‍යන්තරයෙන් එනව.

**උපාසක මහතා :** ගලාගෙන එනව.

**ආර්යයන් වහන්සේ :** ගඟ ගලාගෙන එනව වගේ එනව. මොකක් කොහෙන් එනවද දන්නෑ. මේ අද කියන එක නෙවෙයි හෙට කියන්නෙ බලනකොට. ඒ කියන්නෙ මේ ධර්මය වෙනස්වෙලා නැහැ. සාරාංශය එකමයි. නමුත් ඒ උපමා වෙනස් වෙනව. ඊට වඩා හොඳ උපමාවක් ආවොත් පෙන්නනව ඒක. ඔබතුමාට තේරෙනව නම් එච්චරයි. අර උපමාව තේරුනේ නැතුවම බලනව මේ උපමාව කොහොමද කියන්නෙ කියල. ඊට පස්සෙ ආ මේක කියල තියනව. **හැබැයි මේක විශේෂයක් තියනව. ඒක තමයි මේ දර්ශනයට පත්වීම. දර්ශනය දකිනව. බුද්ධ දර්ශනය දකින හින්ද හැම මොහොතෙම අපිට කී එක වගෙ තියනව ජේන දර්ශනය. අපි ටී.වී. එක දකිනව වගෙ ඒක දකිනව.** ඒ දකින දේ කියන්න උත්සාහ කරනව අනිත් අයට. පෙන්නන්න උත්සාහ කරනව. ඔයගොල්ලොත් දකින්න ඒක කියල. එහෙම දෙයක් තමයි අපි මේ

කරන්නෙ. අපි සමහර වෙලාවට හැම තිස්සෙම කියනව මේ සිතුවිලි වෙනයි. මේ අවධිය වෙනයි. මේ අවිධිමත් ස්වභාවයක් ඇතිවෙනව. සිහියත් එක්ක ඒක එනව. ඒක මොහොතට අවදිය. ඒක භවාංගය. ඔහොම කියනවනෙ. ඒක සිතුවිලි අතර හිඩැස එන්නෙ. ඒක තමයි මේ ධර්මෙ පැහැදිලි කරන්නෙ. නමුත් මේක වෙන්නෙ ප්‍රායෝගිකව මෙහෙමයි. දැන් ඕක කියනවනෙ එක එක විදියට. ඒක වෙන ආකාරය. ඒක වෙන්නෙ මේ විදියට හිතල නෙවෙයි.හිතල කවුරුත් නිවන් දකිනනෙනෑ. මෙන්න මේ විදියටයි වෙන්නෙ කිය කිය පැහැදිලි කරනවනෙ. ප්‍රතිපදා දේශනා. ඒ ප්‍රායෝගික අත්දැකීම් දේශනා. එතෙන්ට සකස් වෙන ආකාරය තමයි ටික ටික මේ හැම කෙනෙක්ම පිරිස අරගෙන එනව එතෙන්ට දේශනය තුළින්. එතනට තමයි ගේන්නේ. අර දර්ශනය පෙන්නන්න හදන්නෙ. මට ප්‍රත්‍යක්‍ෂ වුනු ඒ ධර්මය අනිත් අයටත් ප්‍රත්‍යක්ෂ වෙන විදිය කියනව.

**උපාසක මහතා :** ඔබ වහන්සෙ අර ලුනු රස කියන එක පැහැදිලි කරනවනෙ. අපිට වචනෙකින් ඒක ඇතුලේ ෆ්‍රීල් වෙන එක කියන්න බෑ. වචනයක් කියන්න බෑ. වචනයක් නෑ. නමුත් අපිට ඒක උපමාවක්, හැටියට ඔබ වහන්සෙ ලුණු රස කියන එක ලුණු කැටේ කියන එක සුදුපාටයි. ඒකෙ රස ඇවිල්ල දිවේ තැවරුනාට පස්සෙ තියන ෆ්‍රීල් එක ගන්න පුළුවන්. ඒ සංඥා දහමෙම ඉන්න කෙනෙකුට කියන්න පුළුවන්.

**ආර්යයන් වහන්සේ :** ඔතන මෙහෙම දෙයක් තියනව. ඒ කියන්නෙ නාම රූපවලට ගන්න බෑ. ඒක තමන්ගෙ සිහියටම දැනෙන එකක්. ඇත්තටම මේක දිවට දැනෙන එක නෙවෙයි මෙතන තියෙන්නෙ. එතන තියෙන්නෙ ඒක සිහියට ඇසුවෙනව. සිහියට අසුවෙනව. ඒක කාටවත් කියාගන්න බැහැ. දැන් අපි ගත්තොත් මිරිස්, මිරිස් කනකොට ඒකෙ එන දැවිල්ල ගම්මිරිස් කොච්චි මේක කාටවත් කියාගන්න බෑ. අපි බලල තියනව. මේක නාම රූප නෑ. ඒක කියන්න බෑ. නමුත් දැනෙන් නෑ නෙවෙයිනෙ. ඒ දැනෙන දේ කියන්න බෑ. මේ වගෙම තමයි දැන් මේ සිතක් ඇතිවෙලා නැති වෙද්දි, සිතක් ඇතිවුන බව දැනෙනව. ඒ වගෙම සිත ඇතිවෙලා නැතිවුන බවත් දැනෙනව. නමුත් සිත නැතිවුන බවට මෙනෙහි කරපු බවටත් දැනෙනව. එහෙම දෙයක් නැති බව හැබැයි, ඒකෙ වටිනාකමක දිය වෙනවද නැද්ද කියලත් දැනෙනවා. ආසවඛ්‍යා ඥානය, චුතූපපාත ඥානය ඒ වගේම ත්‍රිවිද්‍යා සේරම තියනව මේ කතාවෙ. දැන් ඒ විතරක්

නෙවෙයි. මෙතන ඒ කියන්නෙ දැන් ද්වේෂයක් ඇතිවුනා කියමු. දැන් ද්වේෂයක් ඇතිවුන බව දැනෙනවනෙ. දැන් එක දැනෙන එක ද්වේශය ඇතුලෙනෙ ඉන්නෙ. සිත ඇතුලෙනෙ ඉන්නෙ. දැන් එතකොට දැනෙන්නෙ කොහොමද? ආන් එක තමයි කේන්ති ගිය වෙලාවෙ කේන්තියෙ ඉන්නෙ. නමුත් ඒක වුන බවට අර අවධියෙ ඉන්න කෙනාට දැනෙනව. දැන් ඉන්නෙ ඒකෙයි කියල දැනෙනව.

**උපාසක මහතා :** ඒකෙ ගිය වොලියුම් එක තේරෙනව.

**ආර්යයන් වහන්සේ :** ඔව් දැනෙනව. අතන වෙනම පාත් එකක් හම්බවෙනව. ඊට පස්සෙ ටිකක් දියුණු වෙනකොට මොකද වෙන්නෙ. තමන්ගෙ සිතුවිලි එනව සිතුවිලි යනව. සිතුවිලිවල තමන් නෑ. පුදුම අවධියක් වෙනව ඕකෙන්. ඔව් අර යෝනිසෝ මනසිකාරය තුළ ඒ අවධිය පේන්න ගන්නව. ඊට පස්සේ ඒ එක සිතකවත් එයා නෑ. හැබැයි ඒක සිද්ධ වෙන්නෙ එයා දකින දර්ශනය තුළයි වෙන්නෙ. ඒ කිව්වෙ බාහිරත් නෑ. සිතෙත් නෑ කියල මිදි මිදී යන ගමන තුළයි ඔය ඔක්කොගෙන්ම මිදිල අවධිය එන්නෙ. එතනින් තමයි ප්‍රකටවෙන්නෙ. මේක අර වේදය තුළ වගේ එකක් වෙන්නෑ. වේදයෙ කෙනා ඉන්නව. කෙනා නැති වෙන් නෑ වේදයෙ. මේක තනිකර සම්පූර්ණයෙන්ම කෙනාත් එක්කම ඔක්කොම නැතිවෙනව. බාහිරත් එක්කම.

**උපාසක මහතා :** ඔබ වහන්සෙ එහෙම කියන කොටම මම එතෙන්ට ගේන කොටම අර ගතිය ඇඟට එනව.

**ආර්යයන් වහන්සේ :** අර දැනෙන ගතිය එනව. ඒක සිතුවිල්ලක් නෙවේ. දැන් ඔබතුමා ඕක කිව්වට පිළිගන්නෙ නැත්නම් මොකද වෙන්නෙ කියන එක. දැන් කිව්වොත් එහෙම බොරු කියන්න එපා. ඒක වෙන්නෑ එහෙම කිව්වොත්. ඒක ඔබතුමාට කියා ගන්න බෑනෙ දැනෙනඑක තව කෙනෙකුට. ඔබතුමාට කීවට ඔබතුමාට ඒක දැනෙන්නෙ නෑනේ. මටනේ ඒක වෙන්නෙ කියල කියන්න වෙනව ඔබතුමාට. ඒක තමයි ප්‍රත්‍යක්ෂ ධර්මය. ඒක තමයි සාන්දිට්ඨික ධර්මය.

**උපාසක මහතා :** ඒක ඒවගේ තේරුම්ගත්ත උත්තමයෙකුට කියනව ඇරෙන්න වෙන කෙනෙකුට කීවට වැඩක් නෑ.

**ආර්යයන් වහන්සේ :** වෙන කෙනෙකුට කීවට වැඩක් නෑ. ඒක තමයි ඇත්ත කතාව. ඒ කියන්නෙ ඒක තේරෙන කෙනෙකුට තේරෙනව ඇර වෙන කෙනෙකුට තේරෙන්නෑ.

**උපාසක මහතා :** මෙයාට මේ වෙන රෝගයක් හැදිල තියෙන්නෙ. මනසින් හදාගත්ත ලෝකෙක කියල හිතනවනෙ. නමුත් එතෙන්ට ඩීප්ලී අර කියන කියන වචනයත් එක්ක එතෙන්ටම හිත පත්වෙන කොට සියුම්ව සියුම්ව සියුම්ව ගියාම ඊට පස්සෙ අර ඩිස්කනෙක් වෙනව. ඩිස්කනෙක් උනාම ඩිස්කනෙක් උනා කියල දන්නෙ ඊට පස්සෙ. එහෙම වෙලයි කියල. එතන අර කියන ස්වරූපය පොඩි තත්ත්පර ගාණක් තිබිල එතෙන්ට එයා උත්සහ කරනව නියම තැනට එන්න.

**ආර්යයන් වහන්සේ :** ඒක අර මුලින් එහෙම උනාට පස්සෙ ඒක දියුණු වෙනව. ඒ ස්වභාවයම ප්‍රකට වෙන්න ගන්නව.

**උපාසක මහතා :** නිතරම ඉන්න ඕනෙ ඒ ස්වභාවයෙ

**ආර්යයන් වහන්සේ :** ඒ ස්වභාවයම ප්‍රකට වෙන්න ගන්නව. ඊට පස්සෙ ස්වභාවය තමයි සාමාන්‍ය විදියට වෙනදා විදියටම වැඩ කටයුතු කෙරෙනව. ඉන්නව ඔක්කොම තියනව. ඒ හිටියට ඒ වයෙ කිසිම අගයක් නෑ. වටිනාකමක් නෑ. ඒ ස්වභාවය අවධිවෙන්න ගන්නව. ඒ ස්වභාවය තුළ ඒ සිතුවිලිවලට කරන්න පුළුවන් දෙයක්නෑ. **එයා සම්මා දිට්ඨිය ආවට පස්සෙ එයාගෙ හැම එකක්ම සම්මා ස්වභාවයෙන් එන්න ගන්නෙ. සිතුවිලිවලින් පලක් නෑ ඊට පස්සෙ. ඊට පස්සෙ ආජීවයෙන් සම්මා ආජීවය. ඊට පස්සෙ අර ඉන්නෙ සිහියම අවධිවෙලා. ඊට පස්සෙ සම්මා සංකප්ප, සම්මා කම්මන්ත, සම්මා වාචා ඔක්කොම එයා යන්නෙ අර අවධියත් එක්ක. එතන තමයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය.** එතන තමයි කෙලෙස් ක්‍ෂය වී ගෙන යන ගමන. ඒක තමයි 'නිබ්බිදන්ති විරාගන්ති, විරාගන්ති නිරෝධන්ති', 'නිරෝධන්ති පටිනිස්සග්ගානුපස්සි' කියන්නෙ. ඒක අවධියේ ස්වභාවයත් එක්ක තමයි මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය තියෙන්නෙ. නාම රූප තමයි බාහිර අභ්‍යන්තර කියන අන්තවලින් මිදිල නාම රූපවලින් මිදිල ඒ ස්වභාවය ටිකින් ටික තවත් ප්‍රකට වෙන්නෙ. එක පාරට එන්නෙ නැහැ. ටිකින් ටික එන ගමනක් ඒකෙ තියෙන්නෙ. පාත් එකක්. ඒ මග එහෙම කියන්න දේකුත් නැහැ. එතනින් එහාට එයට ප්‍රත්‍යක්‍ෂයි. එයාට කවුරුන් ඒක පිළිගත්තත් නැතත් වැඩකුත්නෑ. එයාට

ගින්නකුත්නෑ. එයාගෙ සැහැල්ලුව එයාටමනෙ දැනෙන්නෙ. කාටවත් තේරෙන්නෑනෙ.

**උපාසක මහතා :** පැහැදිලියි. හරියට ම පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ : එයාට හැම මොහොතම ප්‍රභාෂ්වර ගතියක් දැනෙනව. ගින්නක් නෑ. පත්තු වෙන්නෑ. අනිත් අයත් එක්ක ගිනි තියා ගන්න යන්නෑ. සමහර වෙලාවට ගිනි ගොඩක වගේ ඉන්නෙ. වටේ ඉන්න ඔක්කොම සමහර විට බැනගන්නව රංඩු කරනව. එයා ඒවත් ගාණක් නෑ. එයා නිකං අයිස් කැටයක් වාගෙ.** එයා ඒ සිතුවිලිවලට පණ දෙන්න යන්නෑ.

**උපාසක මහතා :** ඔව්. ඒක හරි පැහැදිලියි. හිත යන්නෙත් නෑ.

**ආර්යයන් වහන්සේ :** ඔව් නිකං අර ළමයි රංඩු කරන කොට තාත්ත නිහඬව ඉන්නව වගේ. එහෙම ස්වභාවයක් තමයි අන්තිමට ම පුදුමාකාර දියුණුවක් ඒ තුළ තියනව. අන්තිමට ඒ එක සිතකවත් එයානෑ. හුස්ම ටික ගියත් එයාට ගාණක්වත් නෑ. එයා දන්නව. හැම මොහොතෙම ඇතිවන නැතිවන හැම සිතමයි. ඒ සිත විතරයි.

**උපාසක මහතා :** පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ :** සිතක් කියල දේකුත්නෑ. ඒක අවබෝධයෙන් මිදෙන්නෙ, 'සංඛිතේ නිබ්බිදාය' අර කණ්ණාඩියෙ කෙනෙක්නෑ වගේ අවබෝධයට පත්වෙලයි ඉන්නෙ. ඒකෙ කෙනෙක් ඇත්තමට ඒක කටින් කීවට වැඩක් නෑ. ඒක සාන්දිට්ඨික ඒක ප්‍රත්‍යක්ෂතාවයට එන්නම ඕන. ඒකට හේතුව තමයි දැන් මේ කෙනෙක්ගෙ කතාවක් නෑ මේකෙ. ස්වභාවය මෙතන කෙනෙක් නෑ.

**උපාසක මහතා :** මේක අවබෝධ වෙන්න අවබෝධ වෙන්න ස්වාමීන් වහන්ස මේකේ Science එකක් මිසක් මේකෙ ආත්ම ස්වරූපයක් තියෙන්න බෑ. Science එකක් විතරයි තියෙන්නෙ. පුද්ගලයෙක් වෙන්න බෑනෙ. පුද්ගලයකුට ආත්මයක් තියෙන්න එපෑ. Science එකක් කොහේ හරි ක්‍රියාත්මක වෙන්නෙ. මට එතන ආත්ම කියන තැනම තියෙන්නෙ ඔය Science.

**ආර්යයන් වහන්සේ :** ඔව්. මෙතන ආත්ම කතාවක් නෑ. මේකෙ ඉතින් ඔය ඇත්තටම ඔය චාරිත්‍රයක් විදියට පන්සල්වල ඔය හදාගෙන තියන ඒව සමහර ඒව නම් කිසිම තේරුමක් නෑ. දැන් ඉතින් ඒක අපිට අදාලත්

නෑ. ගැටළුවකුත් නෑ. ඇලීමකුත් නෑ. ධර්මය ඇත්තටම මනුස්සයකුට වැටහුනොත් ඇත්තටම ඒ මනුස්සයා ලොකු මිදීමකට පත්වෙනව. ඊට පස්සෙ එයාව ගිනි තියලගන්න බෑ. එයාට මොකක් හරි කියල උත්තේජනයක් දීල එයාව නම්ම ගන්න බෑ. එක එක දේවල්වලට ගන්න එහෙම බෑ. එයාගෙම අභ්‍යන්තරයෙන් එන්න ඕන එයා හරිම වෙනස් පුද්ගල ස්වභාවයනෑ. එතකොට එයාට එහෙම මේව කරන්න බෑ. ඒ ස්වභාවය හුඟක් වෙනස් එතකොට. සාමාන්‍යයෙන් අර යුතුකමක් විදියට නැත්නම් අතිත් අයගෙ ස්වභාවයට පවතින්න ඒ කටයුතු කරයි. ඉන් එහා අභ්‍යන්තරයෙන් නම් ගිනි අරන් නෑ. ඒකනම් කියන්න පුළුවන්.

**උපාසක මහතා :** එහෙම යන්නෙම නෑ. එයා බලන්නෙ ඒ තැන්වලින් අවශ්‍ය තැන්වල ජීවත්වීමට උත්සාහ කරන්නෙම නෑ. වෙන්නෙම නෑ.

**ආර්යයන් වහන්සේ :** ඒක හරි. එයා ගොඩක් වෙලාවට අභ්‍යන්තර නිහඬතාවයක් ඇති වෙනව. ඒ තුළ කියාගන්න බෑ. පුදුමාකාර ශාන්ත ස්වරූපයක් දැනෙන්න ගන්නව. ඒක ගින්න නැතිවෙන සුවය පුදුමාකාර ශාන්ත සුවයක් අභ්‍යන්තරයට දැනෙන්න ගන්නව. ඒක දැනෙන්නම ඕන. ඒක දැනෙනකොටම එයාටම තේරෙනව එයා ඒ ස්වාභාවයට පත්වෙන බව. ඒ ස්වභාවයට පත් වෙනකොට කෙනෙක් ඉන්නව නෙවෙයි. මේ භාෂාව කතා කරන කොට සම්පූර්ණයෙන්ම කෙනෙක් හැම තිස්සෙම භාෂාවෙ පෙන්නනව. නමුත් මේ කියන තැන හරි පරිස්සමින් අහන්න ඕන. එතන එහෙම දෙයක්නෑ. ඇත්තටම එහෙම කරන්න ඕන කියල එයාට ලොකු බිස්නස් එකක්වත් මොකක්වත් එහෙම රූපයක් වත් එයාගෙ රූපෙවත් එහෙම මොකක්වත් එයාට හරයක් ඇතිවෙන්නෑ.

**උපාසක මහතා :** ඒක අවබෝධය

**ආර්යයන් වහන්සේ :** ඔව්. අවබෝධයෙන් මිදිල ආත්මීය ස්වභාවය ඉස්මතු කරන්න දඟලන්නෑ.

**උපාසක මහතා :** එයාට තැනක් නෑ. ඇති කරගන්න. ඒකයි ඒ.

**ආර්යයන් වහන්සේ :** ඔව් ඇත්තටම පුදුමාකර නිවීමක් ඒක.

**උපාසක මහතා :** ඇත්තටම ඔබ වහන්සේ කිව්ව වගේ මේ මොහොතෙ මැරුනත් එකයි. අවු. 5කින් මැරුනත් එකයි. මුකුත් කරන්න දෙයක් නෑ. තියෙන්නෙ ඒ මොහොත විතරනෙ. මේ මොහොතෙ විතරක් ඉදල ගියත් තියෙන්නෙ රූපයෙම විදීමක් විතරනෙ.

**ආර්යයන් වහන්සේ :** එකෙ තේරුමක්නෑ. මේ මොහොතෙ හුස්ම ගියත් එකයි. අවු. 5කින් හුස්ම ගියත් එකයි. හෙට හුස්ම ගියත් එකයි. මේ පෘතග ්ජන මනුස්සයකුට ඔහොම කීවම නිකං භානේ ඒක අපරාධයක්නෙ. තව අවුරුද්දක් දෙකක් ඉන්න පුළුවන්නෙ. එහෙම ඕව ඉතින් කියල දෙන්නත් බෑ. ඕව ඉතින් පෘතග්ජන මනුස්සයකුට හිතෙන්නෙ වෙනින් කතාවක්. එයාට කෙනෙක් ඉන්නවනෙ. දැන් අපිට, අපි කිව්වහම නෑ ඒක එච්චර ගාණක්නෑ. ඒක කොහොමත් එකයි. මේ මොහොත විතරනෙ තියෙන්නෙ.

**උපාසක මහතා :** ගලන විදියට යන්න අරිනව මිසක

**ආර්යයන් වහන්සේ :** ඔව් ඒක කටින් කීවට වැඩක් නෑ. මේ මොහොත විතරයි කියලා. තව කෙනෙකුට ඒක තේරෙන්නෑ. ඒක ලොකු ගැඹුරු තේරුමක් තියනව. එතෙන්ට එක පාරට එන්නබෑ කෙනෙකුට.

**උපාසක මහතා :** එන්නත් බෑ මේකට උවමනාව ඇත්තටම තමන්ට තියෙන්න ඕන. අවංකවම මිදීම කියන එක සත්‍ය ඥානය.

**ආර්යයන් වහන්සේ :** ඒ කියන්නේ මෙතන අවිද්‍යාව. ඒ කියන්නෙ මෙතන සත්‍ය දැනගන්න තියන ඕනකම තමයි ගොඩක් අයට අපට තේරිල තියනව කතා කරන කොට ගොඩක් අයට තියනව සත්‍ය දැනගන්න ඕනකමක්. සත්‍ය හොයා ගෙන යන කෙනාට හම්බවෙනව.

**උපාසක මහතා :** ඔව්. අර ගැට ලිහාගෙන මොකක්ද මේ ගැන කියන එක.

**ආර්යයන් වහන්සේ :** එයාගෙ රැවටීම විදවීම එයාට දැනෙන්න ගත්තහම ඒක ධර්මය පොඩ්ඩක් එයාට ඇහෙනකොට තේරෙනව මේ බොරුවක් තුළ ඉන්නෙ කියල තේරෙන්න ගන්නව. ඇත්තටම මේක අර සාමාන්‍ය පෘතග්ජන භූමියෙ තියනව වගේ, එහෙම විඳීමක්නෑ. ඒක සතුටක් කියල විඳින එහෙම දෙයක් නෙවෙයි මේකෙ තියෙන්නෙ. මේක වෙනස් කතාවක්. මේකෙ ශාන්ත ගතියක් දැනෙනව. ඒකෙ වෙන කියන්න දෙයක් නෑ. ගින්නක් නැතිකම තමයි ඒකට හේතුව, සතුට කියන එක වෙනම කතාවක්. එහෙම දෙයක් මෙතන නැහැ. ඒ කියන්නෙ සාමාන්‍යයෙන් ඔය පෘතග්ජන භූමියෙ මොනව හරි ඔය හැමතිස්සෙම සතුටුවෙන්නෙ දේකින්නෙ හිතින් හරි දෙයක් හදාගෙන. එහෙම දෙයක් නෙවෙයි. ඒක වචනෙකට ගන්නබෑ ඒ කියන්නෙ **ඒක දැනෙන්නම ඕන ඒක. මේකට එහෙම වචනයක් නෑ. ඒකට උත්තරීතර හුදකලාව කියල**

**තමයි බුදු දහමේ පෙන්නන්නෙ.** ඒක තමයි අපටත් දැනෙන්නෙ. ඒ කියන්නෙ **අභ්‍යන්තර හුදකලාවක්. අභ්‍යන්තර ශාන්ත ස්වභාවයකට පත්වෙන එකක්. මේ ඔක්කොම මනුස්ස වර්ගයාම ඉන්නෙ ගිනිගොඩක කියල ජේන එක.** ඒ ගින්නට වැටෙන්න කැමැත්තක් එන්නෙත්නෑ. ඒ කියන්නෙ ඕනකමක් ඇතිවෙන්නෑ. ඒ කියන්නෙ ඒක දකිනව. ගින්න කියල. **ඒ ගින්න කියල දකිනකොට ඒකෙන් පලක් නෑ. මේ සේරම එකක්වත් ලොකුවෙන්නෑ එයාට. මේ මිනිස්සුවත් ඔය දිව්‍යලෝක අරව මේව කතන්දර මුකුත් නැතිවෙනව ඇත්තම කීවොත්. මේ කතන්දර ඔක්කොම නැතිවෙනව.** දැන් ඔක්කොම දෙයක් කරගෙනයි ඉන්නෙ. ලෝකෙ ඒව ඔක්කොම සංඛාර වෙනව. සිතුවිල්ලක් වෙනව.

මේව සිතුවිලි නේද කියල හිතෙන්න ගන්නව. දැනෙන්න ගන්නව. එතකොට එතන මුකුත් නැති වෙනව - ඒකයි අර න පඨවි, න ආපෝ, න තේජෝ, න වායෝ, න ආකාශසංඥායතන, න ආකිඤ්ඤායතන, න විඤ්ඤායතන, න නේවසඤ්ඤා, නා සඤ්ඤායතන නායං ලෝකෝ මෙලොවක් නෑ, න පරලෝකෝ, පරලොවක් නෑ, න උභෝ චන්දිම සුරියෝ, සඳහිරු කියල දෙයක් නෑ, න ආගතිං වදාමි. න ගතිං, න චුතිං, න උප්පත්තිං, න අපටිත්තං, න අපවත්තං, න ආරම්මනං, ආරම්මනයක් නෑ, මෙලොවක් නෑ, පරලොවක් නෑ, ඒමක් නෑ, යෑමක් නෑ. ජීවත්වෙනව කියල දෙයක්නෑ. ඉන්නව කියල දෙයක්නෑ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියල දෙයක් නෑ. ඔය ධ්‍යාන අරව මේව ඒව කතන්දරත් නෑ. මෙතන මුකුත් නෑ. මුකුත්නෑ කියන්නෙ පුදුම නිවීමක් ඒක. කියන්නෙ හොඳ කියලත්, පත්තුවෙන්නෙ නෑ. නරකයි කියල පත්තුවෙන්නෙත් නෑ. හොඳ නරක කියල දේකුත් නෑ. අන්තිමට ම මේ ආර්‍ය්‍ය භූමියේ වචන නෑ කියන්න, කියන්න වචනයක් තියනවද කියල කියන්න අපි දන්නෙ නෑ. ශාන්ත ප්‍රනීත, පෘතග්ජන භූමියෙ ගන්නේ ඒකත් දෙයක් කරගෙන.

**උපාසක මහතා :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** මෙතන එහෙම කතාවක් නෑ.

**උපාසක මහතා :** බොහෝම පිං ආර්යයන් වහන්ස භාග්‍යයක් කතා කරන්න ලැබීම.

**ආර්යයන් වහන්සේ :** තෙරුවන් සරණයි!

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
12. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
13. ආර්යය කමටහන්